HARTI



වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை

ANNUAL REPORT

2020

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

ஹெக்டர் கொப்பேகடுவ கமநல ஆராய்ச்சி, பயிற்சி நிறுவகம்

Hector Kobbekaduwa Agrarian Research and Training Institute

වාර්ෂික වාර්තාව

2020

පටුන

	පිටු අංකය
සංස්ථාපනය	2
පාලක මණ්ඩලය	4
පාලක මණ්ඩල රැස්වීම්	6
විගණන සහ කළමනාකරණ කමිටුව	6
විධායක සාරාංශය	7
කෘෂිකාර්මික ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයීම් අංශය	10
කෘෂිසම්පත් කළමනාකරණ අංශය	18
පාරිසරික හා ජල සම්පත් කළමනාකරණ අංශය	23
අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය	37
මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශය	51
භූගෝල විද්‍යා තොරතුරු තාක්ෂණික ඒකකය	56
සංඛ්‍යාන හා දත්ත සැකසුම් අංශය	57
පුස්තකාලය	55
ප්‍රකාශන ඒකකය	59
වෙනත් ක්‍රියාකාරකම්	63
2019 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල තත්ත්වය	71
කාර්ය මණ්ඩල සංවර්ධනය	72
මූල්‍ය වාර්තා	74
ජාතික විගණ පනෙත් 12 වගන්ති ප්‍රකාර විගණකාධිපතිගේ වාර්තාව	88
ජාතික විගණ පනෙත් 12 වගන්ති ප්‍රකාර විගණකාධිපතිගේ වාර්තාව	96

සංස්ථාපනය

හෙක්ටර් කොඩ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය 1972 අංක 05 දරන ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතන පනත යටතේ 1972 වසරේ දී ස්ථාපිත කර ඇත. කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යාවස්ථාපිත ආයතනයක් ලෙස එය ක්‍රියාත්මක වේ.

ප්‍රතිපත්ති කේන්ද්‍රීමය පර්යේෂණ දිරි ගැන්වීම, කෘෂිකාර්මික හා ග්‍රාමීය ක්ෂේත්‍රයන්හි පුහුණු අවශ්‍යතා සැපිරීම මෙම ආයතනය පිහිටුවීමේ මූලික අරමුණු වේ.

මෙරට කෘෂිකාර්මික පර්යේෂණ ක්ෂේත්‍රයේ පුරෝගාමියෙකු ලෙස ආරම්භයේ සිට මේ දක්වා වසර 48ක් තිස්සේ සමාජ, ආර්ථික පර්යේෂණ හා පුහුණු කිරීම් සිදු කරමින් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සංවර්ධන ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා අත්‍යවශ්‍ය තොරතුරු සැපයීමෙන් ලද අත්දැකීම්වලින් හෙක්ටර් කොඩ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය පොහොසත් ය.

අපගේ ආයතනයේ දැක්ම සහ මෙහෙවර වන්නේ,

දැක්ම

ගොවිජන හා ග්‍රාමීය අංශයේ තිරසාර සංවර්ධනය සඳහා නව දැනුම ජනනය කර බෙදා හැරීමේ ප්‍රමුඛයා වීම

මෙහෙවර

පර්යේෂණ හා පුහුණු කිරීම් තුළින් ගොවිජන හා ග්‍රාමීය අංශය ශක්තිමත් කිරීම

ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතන පනත යටතේ දක්වා ඇති කාර්යභාරය පහත පරිදි වේ.

1. ගොවිකටයුතු පර්යේෂණ පෝෂණය කිරීම හා උනන්දු කරවීම, ඒවාට සහායවීම සහ සහයෝගය දීම.
2. රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් පාලන ආයතන, මහජන සංස්ථා සහ සෙසු ආයතන මඟින් කෙරෙන ගොවිකටයුතු පර්යේෂණ සම්බන්ධීකරණය කිරීම.
3. කෘෂිකර්මය සංවර්ධනයට බලපාන ආයතනික සාධක හා සම්බන්ධ කරුණු සමීක්ෂණය කිරීම හා ඒවා ගැන පර්යේෂණ පැවැත්වීම.
4. කෘෂිකර්මය සඳහා අවශ්‍ය ඉඩම් ආර්ථිකශීලීව පරිහරණය කිරීම සම්බන්ධයෙන් සමීක්ෂණ පැවැත්වීම සහ පර්යේෂණයෙහි යෙදීම.
5. කෘෂිකාර්මික සහ ග්‍රාමීය සංවර්ධනයට අදාළ සමාජ-ආර්ථික පර්යේෂණ පැවැත්වීම.
6. ශ්‍රී ලාංකික හෝ විදේශීය ආයතන සම්බන්ධ කර ගෙන හෝ තනිවම හෝ ගොවිකටයුතු පර්යේෂණවලට අදාළ පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කිරීම හෝ ඒවාට පහසුකම් සකසා දීම. ඊට අදාළ සහතික, ඩිප්ලෝමා, උපාධි, ත්‍යාග සහ සම්මාන සහතික පිරිනැමීම.

7. ගොවිකටයුතු පර්යේෂණ සහ පුහුණු කිරීමට අදාළ සාකච්ඡා සහ සම්මන්ත්‍රණ පැවැත්වීම, ඊට අදාළ වාර ප්‍රකාශන සහ සහරා ප්‍රකාශයට පත් කිරීම.
8. කෘෂිකර්මාන්තයට අදාළ කලාපීය ගැටලුවලට විසඳුම් සෙවීම සඳහා ආසියානු කලාපයේ රටවල් සමඟ සහයෝගයෙන් ගොවිජන ව්‍යූහයට සම්බන්ධ ගැටලුවලට අදාළ පර්යේෂණ සිදු කිරීම සහ කෘෂිකාර්මික ගැටලුවලට අදාළ තොරතුරු රැස් කිරීම සහ බෙදා හැරීමේ මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීම.

ඉලක්ක

1. සමාජ, ආර්ථික පර්යේෂණ හා කෘෂිකාර්මික ගැටලු පිළිබඳ විශිෂ්ට කේන්ද්‍රස්ථානයක් බවට පත්වීම.
2. රජයේ සැලසුම් සහ ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් ව්‍යාපාරික සහ පර්යේෂණ ප්‍රජාව අතර සමීප සම්බන්ධීකරණය සිදු කිරීම.
3. දැනුම ජනනය හා කාලීනව බෙදාහැරීම තුළින් ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂම කිරීම.
4. ජාතික ප්‍රතිපත්ති, ගැටලු සම්බන්ධයෙන් ස්වාධීනව තක්සේරු ඇගයීම් වාර්තා සම්පාදනය කරමින් ජනතාව දැනුවත් කිරීම.
5. කාර්ය මණ්ඩලයේ හැකියාවන් සහ ආයතනයේ දැනුම පදනම පුළුල් කිරීම සඳහා ආයෝජන කිරීම තුළින් සමාජ - ආර්ථික ප්‍රතිපත්ති විශ්ලේෂණය කිරීමේ හැකියාවන් පුළුල් කිරීම.
6. පුහුණු කිරීම් තුළින් ග්‍රාමීය සංවර්ධනයට සම්බන්ධ පාර්ශ්වකරුවන්ගේ හැකියාවන් වැඩි දියුණු කිරීම.

පාලක මණ්ඩලය – 2020

නීල් බණ්ඩාර හපුහින්න මහතා		ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය, පාලක මණ්ඩලයේ ලේකම්
සුමේධ පෙරේරා මහතා WWV RWP RSP USP NDU - මේජර් ජෙනරාල් (විශ්‍රාමික)		ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය, පාලක මණ්ඩල සභාපති (2020 ජුනි 26 සිට)
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රංජිත් ප්‍රේමලාල් ද සිල්වා මහතා		අධ්‍යක්ෂ/ ප්‍ර.වි.නි (2020 ජනවාරි සිට)
ආචාර්ය පී.ඩබ් අලහකෝන් මිය	කමිටු සාමාජික	අතිරේක ලේකම් (කෘෂි සංවර්ධන) කෘෂිකර්ම අමාත්‍යාංශය (විශ්‍රාමික - 2020 ජුනි)
ආර්.ඒ.ඩී.ආර් රණසිංහ මිය	එම	නියෝජ්‍ය අධ්‍යක්ෂ මුදල් අමාත්‍යාංශය, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන (පෙබරවාරි සිට)
අරුණි ආර්.රණසිංහ මිය	එම	අතිරේක ලේකම් (පාලන) වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
බී.එල්.ඩී බාලසූරිය මිය	එම	අධ්‍යාපන අධ්‍යක්ෂ (කෘෂිකර්ම හා පරිසර අධ්‍යයන ශාඛාව) අධ්‍යාපන අමාත්‍යාංශය (2020 අප්‍රේල් සිට)
ආචාර්ය චන්ද්‍රනාත් අමරසේකර මහතා	එම	අතිරේක ලේකම් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා මහ බැංකුව (2020 පෙබරවාරි සිට)
ආචාර්ය ඩබ්.එම්.ඩබ්.වීරකෝන් මහතා	එම	අධ්‍යක්ෂ ජෙනරාල් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
ආර්.එම්.සී.එම් හේරත් මහතා	එම	ඉඩම් කොමසාරිස් ජෙනරාල් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව (2020 ජනවාරි සිට ඔක්තොම්බර්)
ජී.ඩී කීර්ති ගමගේ මහතා		ඉඩම් කොමසාරිස් ජෙනරාල්

	ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව (2020 දෙසැම්බර් සිට)
ඩබ්.එම්.එම්.බී වීරසේකර මහතා	කොමසාරිස් ජෙනරාල් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
එස්.මොහාන්රාජා මහතා (ඉංජිනේරු)	වාරිමාර්ග අධ්‍යක්ෂ ජෙනරාල් වාරිමාර්ග දෙපාර්තමේන්තුව (2020 ජනවාරි සිට මැයි දක්වා)
නිහාල් සිරිවර්ධන මහතා (ඉංජිනේරු)	වාරිමාර්ග අධ්‍යක්ෂ ජෙනරාල් වාරිමාර්ග දෙපාර්තමේන්තුව (2020 දෙසැම්බර් සිට)
සුවින්ද එස්. සිංගප්පුලි මහතා	සමූපකාර සංවර්ධන කොමසාරිස් සමුපකාර සංවර්ධන සහ සමූපකාර සමිති රෙජිස්ට්‍රාර් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
ක්ෂුබින්ග් සන් මහතා	ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ නියෝජිත එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය (2020 දෙසැම්බර් සිට)
මහාචාර්ය ඩී.කේ.එන්.ජී පුෂ්පකුමාර මහතා	පීඨාධිපති/ කෘෂිකර්ම පීඨය පේරාදෙණිය විශ්වවිද්‍යාලය (2020 දෙසැම්බර් සිට)
ගිල්මා දහනායක මිය	අතිරේක ලේකම් අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශය
බී.ආර්.සී බණ්ඩාර මහතා	ලේකම්, පාලක මණ්ඩලය

පාලක මණ්ඩල රැස්වීම් - 2020

දිනය		සහභාගී වූ සාමාජිකයින් ගණන
1.	2020 මාර්තු 12	10
2.	2020 දෙසම්බර් 15 (සූම් තාක්ෂණය ඔස්සේ පැවති)	08

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්

ආර්.ඒ.ඩී.ආර් රණසිංහ මිය	(සභාපති)	නියෝජ්‍ය අධ්‍යක්ෂ මුදල් අමාත්‍යාංශය, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන (පෙබරවාරි සිට)
ගිල්මා දහනායක මිය	(සාමාජික)	අතිරේක ලේකම් අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශය
අරුණි එස්.රණසිංහ මිය	(සාමාජික)	අතිරේක ලේකම් (පාලන) වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
එස්.ඒ.ඩී.එන් පෙරේරා මිය	(නිරීක්ෂක)	විගණන අධිකාරී විගණකාධිපති දෙපාර්තමේන්තුව
යූ.එස්.එල් කුමාර	(නිරීක්ෂක)	ප්‍රධාන අභ්‍යන්තර විගණක කෘෂිකර්ම අමාත්‍යාංශය

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්

රැස් වූ වාර ගණන **02**

රැස්වීම් පැවැත් වූ දින

2020	ජූනි	**18**
2020	සැප්තැම්බර්	**03**

සාරාංශය

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය පර්යේෂණ හා පුහුණු කටයුතු සඳහා වගකීම පැවරුණු අංශ පහකින් සමන්විත වේ.

කෘෂිකාර්මික ප්‍රතිපත්ති සහ ව්‍යාපෘති ඇගයීම් අංශය, පසුගිය දශක දෙක තුළ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කරන ලද රාජ්‍ය ප්‍රතිපත්ති ඇගයීම සඳහා පර්යේෂණ සිදු කර තිබේ. එහිදී තිරසාර ඵලදායිතා වර්ධනයක් ළඟා කර ගැනීම සඳහා උපායමාර්ගික ආයෝජන කෙරෙහි අවධානය යොමු කරමින් වෙළෙඳපොළ විකෘති කිරීමේ පියවරයන්ගෙන් සහ ආදායම් ලබා දීමේ ක්‍රමවලින් ඉවත් විය යුතු කෘෂිකාර්මික ප්‍රතිපත්ති නිර්දේශ කර තිබේ. එමෙන්ම, දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දීමේ හැකියාව වැඩි කිරීම, එමඟින් ගොවි පවුල් සඳහා ආදායම් අවස්ථා වැඩි කිරීම සහ ගොවි සංක්‍රමණය අඩු කිරීමටත් නිර්දේශ කර තිබේ.

පලතුරු සහ එළවළු පරිභෝජන රටාවන් හඳුනා ගැනීම සහ ඒවායෙහි පරිභෝජනය ඉහළ නැංවීමට උපකාරී වන සාධක, සීමාවන් සහ විභවයන් හඳුනා ගැනීම සිදු කරන ලද තවත් පර්යේෂණයකින් නිර්දේශ කර ඇත්තේ සමස්ත ජනතාවගේ පලතුරු සහ එළවළු පරිභෝජනය වැඩි දියුණු කිරීම සඳහා මහජන සෞඛ්‍ය සහ පෝෂණය පිළිබඳ වැඩසටහන් සහ ප්‍රතිපත්ති අඛණ්ඩව කිරීමේ වැදගත්කමයි.

කෘෂිකාර්මික ප්‍රතිපත්ති සහ ව්‍යාපෘති ඇගයීම් අංශය විසින් දැනට සිදු කරමින් පවතින අධ්‍යයන අතරට ශ්‍රී ලංකාවේ බීජ අංශ සංවර්ධනය සඳහා උපාය මාර්ග සහ ප්‍රතිපත්ති සැලසුම් කිරීම සහ එහි විභවයන් තක්සේරු කිරීම පිළිබඳ අධ්‍යයනයක්, වර්තමාන අපනයන කාර්යසාධනය විශ්ලේෂණය කිරීම පිළිබඳ අධ්‍යයනයක්, අපනයන හැකියාවන් සහ ශ්‍රී ලංකාවේ පලතුරු අපනයන කර්මාන්තය ඉහළ නැංවීම සඳහා අපනයනයට බාධා කරන සාධක හඳුනා ගැනීම පිළිබඳ අධ්‍යනයක් සහ ශ්‍රී ලංකාවේ අර්තාපල් අංශයේ පවතින සංවර්ධන හිඩැස් හඳුනා ගැනීම සහ විශ්ලේෂණය කිරීම පිළිබඳ අධ්‍යයනයක් ද ඇතුළත් වේ.

කෘෂිකාර්මික සම්පත් කළමනාකරණ අංශය විසින් ස්මාර්ට් පරිගණකය, සහභාගීත්ව සංවේදනය සහ පළිබෝධ සහ රෝග සිදුවීම් කල්තියා හඳුනා ගැනීම තුළින් බෝග හානි අවම කිරීම සඳහා ප්‍රජා පාදක ප්‍රවේශයන් සංවර්ධනය කිරීම හා ඒවායේ වලංගුභාවය පරීක්ෂා කිරීම කෙරෙහි අවධානය යොමු කර තිබේ. ඒ මඟින් ගොවිබිම් ආවරණය කරමින් ගොවීන් වෙත සමීපවීම සඳහා ඒකාබද්ධව හෝ සාමූහිකව සියලු ආකාරයේ සන්නිවේදන යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට රජය රාජ්‍ය හා පෞද්ගලික ව්‍යවසායන් දිරිමත් කළ යුතුයැයි රජයට නිර්දේශ කර ඇත.

දැනට සිදු කරමින් පවතින පර්යේෂණ ක්‍රියාකාරකම් අතුරින් පහත රට තෙත් කලාපයේ කුඹුරු ඉඩම් තීව්‍ර කිරීම සඳහා විකල්ප උපාය මාර්ග හඳුනා ගැනීම සහ දිවයින පුරා බෝග වගාවන්ට වනසතුන්ගෙන් සිදුවන හානි තක්සේරු කිරීම ප්‍රධාන වේ.

පාරිසරික හා ජල සම්පත් කළමනාකරණ අංශය විසින් මධ්‍යම කඳුකර ප්‍රදේශයේ දේශගුණික අවදානමට ලක්විය හැකි නැගෙනහිර බෑවුම් ප්‍රදේශවල ජල කළමනාකරණ ගැටලු හඳුනා ගනිමින් විවිධ ජල භාවිතා කරන්නන් අතර සාධාරණ ලෙස ජලය බෙදා හැරීම සහතික කිරීම සඳහා ආයතනික මැදිහත් වීමක් නිර්දේශ කර ඇත.

එම අංශය විසින් ම සිදු කරන ලද තවත් පර්යේෂණයකින් තට්ටුමාරු සහ කට්ටිමාරු ඉඩම් බුක්ති ක්‍රමයන් තුළින් ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ වී වගාවේ කෘෂිකාර්මික ඵලදායිතාවයේ අංශ කෙරෙහි ඇති බලපෑම විශ්ලේෂණය කළ අතර, අවශ්‍ය වූ විට ඉඩම් බෙදීම හා ඒකාබද්ධ කිරීම සඳහා සුදුසු නීති ආයතන පිහිටුවීමට නිර්දේශ කරන ලදී.

ගොවි සංවිධාන සඳහා සුළු වාරිමාර්ග පුනරුත්ථාපන (Minor Irrigation Rehabilitation - MIR) කොන්ත්‍රාත් පිරිනැමීමේ බලපෑම තක්සේරු කිරීම සහ තරඟකාරී ලංසු තැබීමේ ක්‍රමය අනුගමනය නොකර ගොවි සංවිධාන වෙත සුළු වාරිමාර්ග පුනරුත්ථාපන කොන්ත්‍රාත් ලබා දීමෙන් එහි අරමුණු ළඟා කර ගැනීමට හැකි වුණේ ද යන්න පිළිබඳව තක්සේරු කිරීමක් සිදු කර තිබේ. ගොවි සංවිධානයන්හි ධාරිතාව (මානව/භෞතික විද්‍යාත්මක) සලකා බැලීමෙන් පසු සුළු වාරිමාර්ග යෝජනා ක්‍රම ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ඒවා ගොවි සංවිධාන වෙත ප්‍රදේශයේ ගොවිජන නිලධාරීන් විසින් භාර දීමට අධ්‍යයනයෙන් නිර්දේශ කර තිබේ.

බාහිරින් සම්පාදනය කළ අරමුදල් භාවිතයෙන් අධ්‍යයන කිහිපයක් ද පාරිසරික හා ජල සම්පත් කළමනාකරණ අංශය විසින් සිදු කර තිබේ. ශ්‍රී ලංකාවේ තෝරාගත් බෝග වගාවන් සඳහා ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රම භාවිතයෙහි ජල හා බලශක්ති පාදක ඇගයීමක් සිදු කර ඇති අතර ජලසම්පාදන ක්‍රමවල ඇති වාසි ගැන සැලකිලිමත් වීම සඳහා වාරිමාර්ග ක්‍රම පිළිබඳව ගොවීන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සහ දෛනික වගා ජල අවශ්‍යතා සපුරාලීම එම අධ්‍යයනය මඟින් නිර්දේශ කර තිබේ. එසේම, 'රූරල් ඉන්වෙස්ට්' (RURALINVEST) පුහුණු වැඩසටහන, කුඩා ග්‍රාමීය ආයෝජන සඳහා කෘෂිකාර්මික ව්‍යාපාර/ ව්‍යාපෘති සැලසුම් සකස් කිරීමට ආයෝජකයින්ට/ ආයෝජක කණ්ඩායම්වලට සහය වීම අපේක්ෂා කර සංවිධානය කරන ලදී.

මෙම අංශයේ සිදු කෙරෙමින් පවතින පර්යේෂණවලට ඇතුළත් වන්නේ,

1. ශ්‍රී ලංකාවේ ජාතික වශයෙන් වැදගත් කෘෂිකාර්මික උරුමයන් හඳුනා ගැනීම හා නවීන කෘෂිකාර්මික ක්‍රම වැඩිදියුණු කිරීමේ දී ඒවායේ අදාළතාවය
2. වියළි කලාපයේ සුළු පරිමාණ වී වගා අංශය තුළ ඉඩම් ඒකාබද්ධ කිරීම කෙරෙහි ගොවි ප්‍රජාවගේ දැක්ම සහ එකඟත්වය
3. ශ්‍රී ලංකාවේ ප්‍රධාන විදේශීය එළවළු වට්නාකම් දාමයන්හි සියලුම පාර්ශවකරුවන්ගේ කාර්යයන්වල සමස්ත තත්ත්වය විශ්ලේෂණය කිරීම යන අධ්‍යයනයන්ය.

2020 වර්ෂයේ දී අලෙවිකරණ ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය ප්‍රධාන වශයෙන් අවධානය යොමු කළේ ශ්‍රී ලංකාවේ එළවළු නිෂ්පාදන අංශයෙහි එළවළු වගා කරන්නන්ගේ තීරණ ගැනීම සඳහා දැනට පවතින තොරතුරු හුවමාරු කිරීමේ මෙවලම්/යෙදුම්/පද්ධතිවල සඵලතාවය සහ ගොවීන්ගේ තීරණ ගැනීමේ ක්‍රියාවලියට බලපාන සාධක/නිර්ණායක අවබෝධ කර ගැනීම සඳහා ය.

ඒ සඳහා සිදු කළ අධ්‍යයනයෙහි නිර්දේශ අතර තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා ක්ෂණික දුරකථන ඇමතුම් අංකයක් හඳුන්වා දීම, තෝරාගත් එළවළු බීජ වල බදු අඩු කිරීම හෝ ඉවත් කිරීම සහ එළවළු වගා කරන්නන් සඳහා පොහොර සහනාධාරය සැපයීම ආදී නිර්දේශ ඇතුළත් වේ.

එම අංශය විසින් සිදු කරන ලද තවත් පර්යේෂණයකින් මෙරට විශාලතම සහල් සැකසුම් කලාපය වන පොළොන්නරුව දිස්ත්‍රික්කයේ අගය දාම විශ්ලේෂණය (Value Chain Analysis -VCA) මඟින් වී/සහල් අගය දාමයන් පැහැදිලි කර ගොවිපළ මට්ටමින්,වී එකතු කරන්නන් සහ සහල් මෝල් මට්ටමින් නිර්දේශ ඉදිරිපත් කර තිබේ.

අලෙවි අංශය විසින් සිදු කරන ලද තවත් පර්යේෂණයක දී, අතරමැදි කන්නයේ දී අතිරේක ආහාර බෝග ව්‍යාප්තියට බාධා කරන ගැටලු පරීක්ෂා කළ අතර ගුණාත්මක බීජ ලබා දීම සඳහා නිසි යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම, නිදැල්ලේ යන ගවයින්ගෙන් සිදු වන බෝග හානි වැළැක්වීම සඳහා පියවර ගැනීම සහ ගොවිජන සේවා මධ්‍යස්ථාන, වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ අනෙකුත් අදාළ සංවිධාන අතර වඩා හොඳ සම්බන්ධීකරණයක් ඇති කිරීම නිර්දේශ කරන ලදී.

බාහිර අරමුදල් භාවිතා කරමින් මෙම අංශය විසින් මුලතිව් දිස්ත්‍රික්කයේ ගැටුම්වලින් පීඩාවට පත් වූ කාන්තාවන් සඳහා ආර්ථික සවිබල ගැන්වීම, සමාජ ඒකාබද්ධතාව, ඔරොත්තු දීමේ හැකියාව සහ සාමය ගොඩනැගීම සඳහා සහභාගීත්වය පිළිබඳව අධ්‍යයනයක් සිදු කර තිබේ. විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන සහ පොළ අලෙවිකරණය වැනි සාමූහික අලෙවි කිරීමේ ක්‍රම ස්ථාපිත කිරීම පිණිස අධ්‍යයනය මඟින් නිර්දේශ ඉදිරිපත් කර තිබේ.

ඊට අමතරව, කොවිඩ් තත්ත්වය යටතේ ක්‍රියාත්මක වූ 'කෘෂිකාර්මික වෙළෙඳපොළ තොරතුරු සේවාව' (Agricultural Market Information System - AMIS) පිළිබඳ පර්යේෂණයක් ද සිදු කර ඇත.

මෙම අංශය විසින් දැනට කෙරෙන පර්යේෂණ අධ්‍යයන අතරට බඩඉරිහුවල අගයදාම විශ්ලේෂණය, ශ්‍රී ලංකාවේ ලොකු ලූනු පිළිබඳ සවිස්තරාත්මක අගයදාම විශ්ලේෂණයක් සිදු කිරීම සහ නිෂ්පාදන හා අලෙවි කිරීමේ ඇති ප්‍රධාන ගැටලු සහ අවස්ථා හඳුනා ගැනීම ආදි අධ්‍යයන ඇතුළත් වේ.

ශ්‍රී ලංකාවේ ගොවි ජනතාවගේ සමාජ ආර්ථික මට්ටම ඉහළ නැංවීම සඳහා කෘෂිකාර්මික හා ග්‍රාමීය සංවර්ධන කටයුතුවල නියැළී සිටින ජනතාවගේ දැනුම, ආකල්ප හා කුසලතා වැඩි දියුණු කිරීම සඳහා මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශය පුහුණු කිරීම් හි නියුක්ත වී සිටී.

ගෙවතු වගාව තුළින් පොල් නිෂ්පාදනය ඉහළ නැංවීමේ හැකියාව සහ කුටුම්භ හා කර්මාන්ත සඳහා නිර්දේශ ලබා දීම සම්බන්ධයෙන් ද අධ්‍යයනයක් මෙම අංශයෙන් සිදු කර තිබේ.

කෘෂිකාර්මික නිෂ්පාදන වෙළඳපොළේ සහ සහය සේවාවන්හි සැපයුම්කරුවන් සහ පාරිභෝගිකයින් අතර සම්බන්ධතාවක් ඇති කිරීම සඳහා භූගෝල විද්‍යා තොරතුරු තාක්ෂණික ඒකකය මඟින් මෘදුකාංගයක් වැඩි දියුණු කර තිබේ.

සංඛ්‍යාන හා දත්ත සැකසුම් අංශය, පුස්තකාලය හා ප්‍රකාශන ඒකකය වැනි අනෙකුත් අංශ ආයතනයේ පර්යේෂණ කටයුතු සඳහා ආධාරක සේවාවන් අඛණ්ඩව ලබා දී තිබේ.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රංජිත් ප්‍රේමලාල් ද සිල්වා
අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී

01

කෘෂිකාර්මික ප්‍රතිපත්ති සහ ව්‍යාපෘති ඇගයීම් අංශය

අවසන් නොකළ අධ්‍යයන

1. ශ්‍රී ලංකාවේ වී නිෂ්පාදනයට රජයේ ප්‍රතිපත්තිවල බලපෑම තක්සේරු කිරීම

පර්යේෂණ කණ්ඩායම :

එම්.ඩී.ඩී. පෙරේරා	සම්බන්ධීකාරක
ආචාර්ය ඩබ්.ඒ.ආර්. වික්‍රමසිංහ	සම පර්යේෂක
ඒ.කේ.ඒ. දිසානායක	සම පර්යේෂක
යූ.ඩී.ආර්. උදාරි	සම පර්යේෂක

මූල්‍ය ප්‍රභවය : ඒකාබද්ධ අරමුදල

අරමුණු

සෑම ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණයක්ම ආර්ථිකය සහ ජනගහනයේ ලක්ෂණ අනුව සමාජයට ධනාත්මක බලපෑමක් මෙන්ම අහිතකර බලපෑමක් ඇති කරනු ඇත. ශ්‍රී ලංකාවේ සහල්වල ස්වයංපෝෂිතභාවය ළඟා කර ගැනීම සඳහා වඩා හොඳ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ පසුගිය දශක දෙක තුළ ක්‍රියාත්මක කරන ලද රජයේ ප්‍රතිපත්ති ඇගයීමට මෙම අධ්‍යයනය උත්සාහ කරයි.

වී නිෂ්පාදනයට අදාළ ප්‍රතිපත්ති සියල්ල වාරිමාර්ග, වී ගොවිතැන සහ විවිධාංගීකරණය, ඉඩම්, පොහොර සහනාධාර, වාරිමාර්ග සහනාධාර, අනුවර්තනය, පර්යේෂණ හා සංවර්ධන, වී අලෙවිකරණය සහ වෙළඳ ප්‍රතිපත්ති ලෙස වර්ග කළ හැකිය. සිල්ලර මිල සහ සහතික කළ මිල අතර ආන්තිකය පිළිවෙළින් නාඩු සහල් සහ සම්බා සහල් සඳහා පිළිවෙළින් 1.26 සහ 1.52 ක් වේ. එකම පාරිභෝගික උපයෝගිතා මට්ටම් පවත්වා ගනිමින් නිෂ්පාදන ප්‍රමාණය දිරිගැන්වීම සඳහා ගොවිපළ ගේට්ටු මිල ඉහළ නැංවීමේ හැකියාවක් පවතින බව මෙයින් ඇඟවෙයි. නිෂ්පාදක ආධාරක ඇස්තමේන්තුව **(Producer Support Estimate - PSE)** සහ වෙළඳපල මිල සහාය **(Market Support Estimate- MPS)** ඇස්තමේන්තුවල සෘණාත්මක අගයක් ඇති අතර එයින් ඇඟවෙන්නේ ශ්‍රී ලංකාවේ පවතින රජයේ ප්‍රතිපත්තිමය මෙවලම් අඩු ගොවිපළ දොරටුවක් සහ දේශීය වෙළඳපළ මිලක් ඇති කරන අතර එමඟින් භාණ්ඩ නිෂ්පාදනය අධෛර්යමත් කරන බවයි. නාමික ආධාර අනුපාතය **(Nominal Rate of Assistance - NRA)** වී අස්වැන්න සමඟ ධනාත්මක සම්බන්ධතාවයක් ඇති අතර, එයින් අදහස් වන්නේ වී සඳහා වන නාමික ආධාර අනුපාතය වසරකින්

වැඩි වුවහොත් (වැඩි සහනාධාරයක් හෝ අඩු බදු අය කිරීමක්) ඊළඟ වර්ෂයේදී අස්වැන්න වැඩි වන අතර අනෙක් විචල්‍යයන් නියතව තබා ගන්නා බවයි. තවද, තොරතුරු සඳහා වැඩි ප්‍රවේශයක් අස්වැන්න කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කරන අතර දේශගුණික විචල්‍යයන් විශේෂයෙන් වර්ෂාපතනය වී අස්වැන්න කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරයි. එමඟින් වී නිෂ්පාදනය වැඩි කිරීම සඳහා වැඩි දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දීමේ ප්‍රතිපත්තිවල අවශ්‍යතාව ඉස්මතු කරයි. වෙළඳපළ වඩා හොඳින් සංවර්ධනය වූ විට සහ තොරතුරු සඳහා ප්‍රවේශය ඇති විට අස්වැන්න ධනාත්මක ලෙස බලපායි.

නිර්දේශ

වෙළඳපළ විකෘති කිරීමේ පියවරයන්ගෙන් සහ බිලැන්කට් ආදායම් හුවමාරුවලින් ඉවතට යන කෘෂිකාර්මික ප්‍රතිපත්ති නිර්දේශ කරනුයේ තිරසාර ඵලදායිතා වර්ධනයක් සහ දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දීමේ හැකියාව ලබා දීමට උපකාරී වන උපායමාර්ගික ආයෝජන කෙරෙහි අවධානය යොමු කරමිනි. එමඟින් ගොවි පවුල් සඳහා ආදායම් අවස්ථා වැඩි කිරීම සහ ගොවි සංක්‍රමණය අඩු කිරීම සිදු වේ. තවද, දේශගුණික විපර්යාසයන්ට අනුවර්තනය වීමට ගොවීන්ගේ ධාරිතාව ඉහළ නැංවීමට සහ විශේෂයෙන් වර්ෂාපතන විචල්‍යතාවයට සහාය වන ප්‍රතිපත්තිමය උපකරණ නිර්දේශ කෙරේ.

2. ශ්‍රී ලංකාවේ එළවළු සහ පලතුරු පරිභෝජන රටා සහ ඒ කෙරෙහි බලපාන සාධක පිළිබඳ අධ්‍යයනය

පර්යේෂණ කණ්ඩායම :	යු.ඩී.ආර්. උදාරි	- සම්බන්ධීකාරක
	ඒ.කේ.ඒ. දිසානායක	- සම පර්යේෂිකා
	එම්.ඩී.ඩී. පෙරේරා	- සම පර්යේෂිකා
	ආචාර්ය ඩබ්ලිව්.ඒ.ආර්. වික්‍රමසිංහ	- සම පර්යේෂක

මූල්‍ය ප්‍රභවය : ඒකාබද්ධ අරමුදල

විෂය පථය හා අරමුණු :

ශ්‍රී ලංකාවේ දෛනික ඒක පුද්ගල එළවළු සහ පලතුරු පරිභෝජනය නිර්දේශිත මට්ටමට වඩා බෙහෙවින් අඩු මට්ටමක පවතියි. නිරෝගී ප්‍රජාවක් බිහි කිරීමේ අභිමතාර්ථ සපුරා ගැනීමේදී, දෛනික ඒක පුද්ගල එළවළු සහ පලතුරු පරිභෝජනය ඉහළ නැංවීම අත්‍යවශ්‍ය වේ. එබැවින් එළවළු සහ පලතුරු පරිභෝජනය සඳහා බලපාන සාධක සහ පරිභෝජනය ඉහළ නැංවීමට ඇති බාධක සහ විභවතාවයන් හඳුනා ගැනීමට මෙම අධ්‍යයනයෙන් අවධානය යොමු කරන ලදී.

සොයාගැනීම් :

- බහුතරයක් ගෘහ ඒකක (නාගරික-69%, වතු-69% සහ ග්‍රාමීය-56%) එළවළු සහ පලතුරු අවශ්‍යතාව සඳහා සම්පූර්ණයෙන් බාහිර වෙළඳපොළ මත යැපෙයි. ග්‍රාමීය සහ වතු අංශයේ ගෘහ ඒකක සිදු කරන වියදම මෙන් දෙගුණයකට වඩා නාගරික ගෘහ ඒකක එළවළු සහ පලතුරු සඳහා මාසිකව වැය කරයි. එළවළු සහ පලතුරු මිලට ගැනීම කෙරෙහි ඒවායේ ගුණාත්මකභාවය, නැවුම්බව, මිල සහ සෞඛ්‍යාරක්ෂිත බව වැදගත් වෙයි.

- උපකල්පන සහිතව ඒක පුද්ගල එළවළු සහ පලතුරු පරිභෝජනය ගණනය කළ අතර, ගෘහ ඒකක අතර ඒක පුද්ගල පලතුරු පරිභෝජනය නාගරික, ග්‍රාමීය සහ වතු ලෙස පිළිවෙළින් දිනකට, ග්‍රෑම් 187.78, ග්‍රෑම් 151.51 සහ ග්‍රෑම් 43.34ක් ලෙස වෙනස්වෙයි. තවද ඒක පුද්ගල එළවළු පරිභෝජනය දිනකට ග්‍රෑම් 180.55ක් (නාගරික) ග්‍රෑම් 165.89ක් (ග්‍රාමීය) සහ ග්‍රෑම් 108.38ක් (වතු) වෙයි.

- **Simpson Index** විශ්ලේෂණයට අනුව, එළවළු සහ පලතුරු පරිභෝජන විවිධත්වය නාගරික **(0.65)**, ග්‍රාමීය **(0.58)** සහ වතු (0.32) යන ගෘහ ඒකක අතර වෙනස් වන අතර, ඉහළම විවිධත්වය නාගරික ගෘහ ඒකක ආශ්‍රිතව පෙන්වයි. අංශ තුනම සැලකූ විට පලතුරු පරිභෝජන විවිධත්වයට වඩා එළවළු පරිභෝජන විවිධත්වය ඉහළ අගයක් ගනී.

  - රේඛීය ප්‍රතිගාමී විශ්ලේෂණයට අනුව **(Linear Regression Analysis)** ගෘහ ඒකකයේ ප්‍රමාණය, ස්ත්‍රී පුරුෂභාවය, ගෘහ මූලිකයාගේ අධ්‍යාපන මට්ටම, දරුවන් සංඛ්‍යාව, ආහාර පුරුදු, නාගරික ප්‍රදේශයක වාසය කිරීම සහ පහසුවෙන් වෙළඳපොළ ප්‍රවේශ වීම ගෘහ ඒකක විසින් එළවළු සහ පලතුරු සඳහා යොදවන වියදම කෙරෙහි සැලකිය යුතු ලෙස බලපායි.

  - එළවළු සහ පලතුරු පරිභෝජනයේ විභවතාවයන් සහ බාධක හඳුනා ගැනීම සඳහා ගවේශණාත්මක **(Exploratory Factor Analysis)** සාධක විශ්ලේෂණයක් සිදුකළ අතර, පරිභෝජන රටාව වෙනස් කිරීම, ආහාර සඳහා ඇති කැමැත්ත, විවිධත්වයකින් යුතු තෝරා ගැනීම, පෝෂණ නිර්දේශ පිළිබඳ දැනුවත්භාවය, එළවළු සහ පලතුරු පරිභෝජනයට ඇති කැමැත්ත, තමන්ගේ සෞඛ්‍ය පිළිබඳ සැලකිලිමත් බව, පහසුව සහ එළවළු සහ පලතුරුවල ගුණාත්මකභාවය යන ප්‍රධාන සාධක අට හඳුනාගත් අතර ඒවා විචල්‍යතාවයෙන් **70%**ක් පැහැදිලි කරයි.

  - ප්‍රතිචාර දැක්වූවන්ගෙන් වැඩි පිරිසක් **(75%)** ජාතික ආහාර මාර්ගෝපදේශ **(National Food Guidelines)** පිළිබඳව දැනුවත් නොවූ අතර, දෛනික එළවළු සහ පලතුරු පරිභෝජන ප්‍රමාණය හෝ විවිධත්වය පිළිබඳව ද දැනුවත් නොවීය.

  - නොමේරූ පලතුරු රසායනික ද්‍රව්‍ය යොදා ඉදවීම, රසයෙන් අඩු වීම සහ ඉහළ මිල, පලතුරු පරිභෝජනය ඉහළ නැංවීමට ඇති ප්‍රධාන බාධක අතර වෙයි. එළවළු සහ පලතුරු පරිභෝජනයේ පෝෂණ වටිනාකම පිළිබඳ දැනුවත්භාවය, නිෂ්පාදනවල ගුණාත්මකභාවය,

ගෙවතුවලින් ලබාගත හැකි වීම සහ සාධාරණ මිල, එළවළු සහ පලතුරු පරිභෝජනය වැඩි කිරීමේ ප්‍රධාන සාධක වෙයි.

- ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 97% ක් තමන් මිල දී ගන්නා එළවළු සහ පලතුරු ආරක්ෂිත නොවන බව සහ පළිබෝධනාශක අවශේෂ ද්‍රව්‍යවලින් ඒවා දූෂණය වී ඇති බව විශ්වාස කරයි. මෙම විශ්වාසය බහුතරයක් ගෘහ ඒකකවල (74%) එළවළු සහ පලතුරු මිල දී ගැනීම සහ පරිභෝජනය කෙරෙහි ඍණාත්මකව බලපායි.

- ප්‍රතිචාර දැක්වූවන්ගෙන් පිරිසක් (60%) කාබනික එළවළු සහ පලතුරු පිළිබඳ දැනුවත්ව සිටියි. පහසුවෙන් ලබාගත නොහැකි වීම, නිෂ්පාදන සහතිකය පිළිබඳ ඇති සැකය, කාබනික එළවළු සහ පලතුරු ප්‍රවර්ධන වැඩසටහන් නොමැති වීම සහ කාබනික එළවළු සහ පලතුරු බව තහවුරු කරන සහතිකයක් නොමැති වීම කාබනික එළවළු සහ පලතුරු මිල දී ගැනීම අඩු කරයි.

නිර්දේශ:

- ගෘහ ඒකකවල එළවළු සහ පලතුරු පරිභෝජනය ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රජා සෞඛ්‍ය හා පෝෂණ වැඩසටහන් අඛණ්ඩව සිදුකළ යුතුය. අවම පරිභෝජන මට්ටම සහ අවම විවිධත්වය සලකා වතු අංශය ප්‍රධාන වශයෙන් ඉලක්ක ගත කළ යුතුය. විවිධත්වයකින් යුතු එළවළු සහ පලතුරු පරිභෝජනය සහ ඒවායෙන් ලැබෙන සෞඛ්‍යමය වාසි සහ සෞඛ්‍ය සම්පන්න ආහාර වේල් පිළිබඳ නිවැරදි තොරතුරු ජනතාවට ලබාදීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

- බහුතරයක් ගෘහ ඒකක කාබනික එළවළු සහ පලතුරු පිළිබඳ දැනුවත් අතර නිෂ්පාදන ධාරිතාව වැඩි කළ හැකි නම් සෞඛ්‍යාරක්ෂිත එළවළු සහ පලතුරු සඳහා ශක්‍ය වෙළඳපොළක් තිබේ. ඒ සඳහා නිෂ්පාදන ප්‍රවර්ධනය, සහතික කිරීම සහ විකිණීම ප්‍රවර්ධනය කිරීම සඳහා සියලුම අංශ එකට කටයුතු කළ යුතුය. තව ද කාබනිකව නිෂ්පාදනය කළ එළවළු සහ පලතුරු දේශීය වෙළඳපොළට නිකුත් කිරීමේ දී පිළිගත් කාබනික සහතිකයක් නිකුත් කිරීම සඳහා ජාතික නීති සම්පාදනයේ වැදගත්කම අවධාරණය කරයි.

- ග්‍රාමීය ජනතාවගේ එළවළු සහ පලතුරු පරිභෝජනය ඉහළ නැංවීමේ එක් ක්‍රමයක් වන්නේ ගෙවතු වගාව ප්‍රවර්ධනයයි. කෙසේ වෙතත් එළවළු සහ පලතුරු ඉල්ලුම සැපිරීමේ දී ගෙවතුවල පවත්නා සීමාවන් හඳුනාගත යුතු අතර ගෘහ ඒකක බහුතරයක් බාහිර වෙළඳපොළ මත රඳා පවතින බැවින් සාධාරණ මිලකට අවශ්‍ය එළවළු සහ පලතුරු ලබා ගැනීම සහ ප්‍රවේශ වීමේ හැකියාව සහතික කළ යුතුය.

- ප්‍රතිචාර දැක්වූවන්ගේ බහුතරය (97%) තමන් මිල දී ගන්නා එළවළු සහ පලතුරු සෞඛ්‍යාරක්ෂිත නොවන බවත්, ඒවායේ පළිබෝධනාශක අවශේෂ අන්තර්ගත බවත්, විශ්වාස කරන අතර මෙම ඍණාත්මක විශ්වාසය බහුතරයක් ගෘහ ඒකකවල එළවළු සහ පලතුරු පර්භෝජනය සහ මිල දී ගැනීම අඩු කිරීම කෙරෙහි බලපායි. එම නිසා අවශ්‍ය පර්යේෂණ සහ විමර්ශන සිදු කර එහි සත්‍ය අසත්‍යභාවය පිළිබඳ ජනතාව දැනුවත් කිරීම අත්‍යවශ්‍ය වේ.

3. ශ්‍රී ලංකාවේ බීජ ක්ෂේත්‍රයේ වත්මන් ප්‍රගතිය, එහි විභවතාවයන් සහ එය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය විකල්පයන් සැපයීම පිළිබඳ අධ්‍යයනය

පර්යේෂණ කණ්ඩායම:	යූ.ඩී.ආර්. උදාරි	- සම්බන්ධීකාරක
	අයි.පී.එම්. විජේසිංහ	- සම පර්යේෂක
	ඒ.කේ.ඒ. දිසානායක	- සම පර්යේෂිකා
	එම්.ඩී.ඩී. පෙරේරා	- සම පර්යේෂිකා
	එස්.පී. ප්‍රනාන්දු	- සම පර්යේෂක

මූල්‍ය ප්‍රභවය : ඒකාබද්ධ අරමුදල

විෂය පථය හා අරමුණු:

කෘෂිකාර්මික බෝග නිෂ්පාදනය හා වැඩිදියුණු කිරීම සඳහා බීජ මූලික වන අතර ආහාර සුරක්ෂිතතාව ගොවි ප්‍රජාවේ බීජ සුරක්ෂිතතාව මත බෙහෙවින් රඳා පවතී. කෙසේ වෙතත්, ගුණාත්මක බීජ ප්‍රමාණවත් නොවීම, කෘෂිකාර්මික අංශයේ මන්දගාමී වර්ධන වේගය සඳහා දායක වන ප්‍රධාන සාධකයක් ලෙස සලකනු ලබන අතර වඩා හොඳ තත්ත්වයේ බීජ සැපයීම සඳහා පර්යේෂණ හා ව්‍යාප්ති සේවාවන් අවධානය යොමු කළ යුතුය. කෘෂිකර්මාන්තය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය මගින් ආහාර සුරක්ෂිතතාවයේ ජාතික අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ ගොවීන්ගේ ජීවනෝපාය වැඩිදියුණු කිරීම සඳහා බීජ ක්ෂේත්‍රය සංවර්ධනය කිරීමේ අවශ්‍යතාව දැඩි ලෙස හඳුනා ගෙන තිබේ. එබැවින් මෙම අධ්‍යයනයෙන් බීජ ක්ෂේත්‍රයේ ක්‍රියාකාරිත්වය, වර්ධන ප්‍රවණතා සහ එහි විභවතාවයන් ඉස්මතු කරමින් වී, බඩ ඉරිඟු, අර්තාපල්, ලොකුළූණු සහ තෝරාගත් එළවළු බෝග කිහිපයක් පිළිබඳව ගවේෂණය කරයි. ආහාර සුරක්ෂිතතාව සඳහා තරඟකාරී බීජ පද්ධතියට අවශ්‍ය පරිසරය නිර්මාණය කරන උපාය මාර්ග සහ ප්‍රතිපත්තිමය විකල්පයන් එමඟින් සපයනු ඇත.

ප්‍රධාන අරමුණ:

බීජ ක්ෂේත්‍රයේ වත්මන් ප්‍රගතිය තක්සේරු කිරීම, වර්ධන වේගය විශ්ලේෂණය කිරීම සහ බීජ කර්මාන්තය දියුණු කිරීම සඳහා ඇති බාධක සහ විභවතාවයන් හඳුනා ගැනීම තුළින් ශ්‍රී ලංකාවේ බීජ ක්ෂේත්‍රය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය විකල්පයන් සැපයීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වෙයි.

සෙසු අරමුණු:

- බීජ ක්ෂේත්‍රයේ වර්ධන ප්‍රවණතා පරීක්ෂා කිරීම.
- ශ්‍රී ලංකාවේ බීජ අංශයේ ක්‍රියාකාරිත්වය තක්සේරු කිරීම.
- ශ්‍රී ලංකාවේ බීජ අංශයේ සංවර්ධනයට පවතින විභවයන් හා බාධක හඳුනා ගැනීම.

වර්තමාන ප්‍රගතිය:

අධ්‍යයන යෝජනාව පර්යේෂණ හා පුහුණු කමිටුවට ඉදිරිපත් කරන ලදී. අධ්‍යයනය 2022 වසරේ දී අවසන් කරනු ඇත.

4. ශ්‍රී ලංකාවේ ප්‍රධාන පලතුරු අපනයන විභවය පිළිබඳ ආර්ථික විශ්ලේෂණය

පර්යේෂණ කණ්ඩායම:	ඒ.කේ.ඒ. දිසානායක	- සම්බන්ධීකාරක
	එම්.ඩී.ඩී. පෙරේරා	- සම පර්යේෂිකා
	යූ.ඩී.ආර්. උදාරි	- සම පර්යේෂිකා
	ජී. වී. එන්. අයෝමි	- සම පර්යේෂිකා
මූල්‍ය ප්‍රභවය:	ඒකාබද්ධ අරමුදල	

විෂය පථය හා අරමුණු:

කලාපයේ වෙනත් රටවල් හා සසඳන විට ශ්‍රී ලංකාවේ පලතුරු හා එළවළු වගාව රටේ පරිපූර්ණ දේශගුණික තත්ත්වයන් සහ සාරවත් පස් හේතුවෙන් තවදුරටත් සංවර්ධනය සඳහා හොඳ හැකියාවක් ඇත. නිදසුනක් වශයෙන්, ශ්‍රී ලංකාවේ සමහර නිවර්තන පලතුරු වන අන්නාසි, රඹුටන්, මැන්ගුස්ටීන් සහ පැෂන් ෆෘට් වැනි දෑ විදේශ වෙළඳපොළ තුළ ඉතා ජනප්‍රිය වන්නේ ඒවායේ රසය, සුවඳ සහ වර්ණය වැනි සුවිශේෂී ලක්ෂණ නිසාය. නිසි වෙළඳපළ පිළිගැනීමත් සමඟ, නැවුම් හා සැකසූ පලතුරුවලින් අපනයන සංවර්ධනය කිරීමට ශ්‍රී ලංකාවට හැකියාවක් ඇත. එබැවින්, වෙළඳපළ වෙනස්වීම් සහ විභව වෙළඳපළ සඳහා මූලික හේතු සොයා බැලීම සඳහා විද්‍යාත්මක පර්යේෂණ සිදු කළ යුතුය.

ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වනුයේ ශ්‍රී ලංකාවේ පලතුරු අපනයන කර්මාන්තය නංවාලීම සඳහා වූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග යෝජනා කිරීම සඳහා වර්තමාන අපනයන තත්ත්වය කාර්යයසාධනය, අපනයන විභවය විශ්ලේෂණය කිරීම සහ අපනයනය සඳහා බලපාන බාධක හඳුනා ගැනීමයි. මෙම ව්‍යාපෘතියෙහි සෙසු අරමුණු ලෙස පලතුරු අපනයන ක්ෂේත්‍රයේ ලක්ෂණ හා ව්‍යුහය පිළිබඳව අධ්‍යයනය කිරීම, අපනයනය සඳහා ඉහළ විභවතාවයක් ඇති පලතුරු බෝග හඳුනා ගැනීම, ප්‍රධාන පලතුරු අපනයනයේ ප්‍රවණතාවය සහ වර්ධන රටාව විශ්ලේෂණය කිරීම හා පලතුරු අපනයන ක්ෂේත්‍ර විභවතා සහ අභියෝග හඳුනා ගැනීම යන කරුණු දැක්විය හැකිය.

මෙම අධ්‍යයනයේ සොයාගැනීම් ප්‍රතිපත්ති සම්පාදකයින්ට සහ විවිධ පාර්ශවකරුවන්ට පලතුරු අපනයන කර්මාන්තයේ අභිවෘද්ධිය සඳහා කටයුතු කිරීමේ දී සහාය වනු ඇත.

වත්මන් ප්‍රගතිය :

පර්යේෂණ කටයුතු සිදු වෙමින් පවතී. මෙම ව්‍යාපෘතිය **2022** වර්ෂයේ අවසන් කිරීමට අපේක්ෂිතය.

5. ශ්‍රී ලංකාවේ අර්තාපල් අගයදාම විශ්ලේෂණය

පර්යේෂණ කණ්ඩායම: ආර්.ඩී විජේසිංහ - සම්බන්ධීකාරක
අයි.පී.පී.එම්. විජේසිංහ - සම පර්යේෂක
දිලූපා බමුණුආරච්චි - සම පර්යේෂක

මූල්‍ය ප්‍රභවය : ඒකාබද්ධ අරමුදල

විෂය පථය සහ අරමුණු:

ශ්‍රී ලංකාවේ අර්තාපල් වගාව ආරම්භ වූයේ 1960 දශකයේ දී ය. ඉහළ පාරිභෝගික කැමැත්ත සහ ගොවියාට බෝගයෙන් ලැබෙන ඉහළ ලාභය හේතුවෙන් ශ්‍රී ලංකාවේ වඩාත් වැදගත් ආහාර බෝගයක් බවට අර්තාපල් පත්වී ඇත. මීට අමතරව අර්තාපල් ගෘහස්ත පරිභෝජනය සඳහා භාවිතා වන අත්‍යවශ්‍ය ආහාර බෝගයක් වශයෙන් මෙන්ම ආදායම් උපයන වාණිජ බෝගයක් ලෙසද වැදගත්කමක් දක්වන බෝගයක් වේ.

තවද, කෘෂිකර්මය තුළ අර්තාපල් වගා පද්ධතියේ තිරසාරභාවය පවත්වා ගැනීම ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ප්‍රතිපත්තියේ සෑම විටම ඉතා වැදගත් අංගයක් ලෙස සලකනු ලබන්නේ ආහාර සුරක්ෂිතතාවය කෙරෙහි මෙන්ම සමාජ-ආර්ථික සහ දේශපාලනික අංශයන් කෙරෙහිද මෙමඟින් ඇති කරනු ලබන බලපෑම හේතුවෙනි. එබැවින් අර්තාපල් යනු ශ්‍රී ලංකාවේ සෑම අයවැයකම කතාබහට ලක්වන පාරිභෝගික භාණ්ඩයක් වන අතර ඊට මූලිකම හේතුව මෙම බෝගය ආනයන ආදේශන ප්‍රතිපත්ති කෙරෙහි සෘජුවම සම්බන්ධවීමයි.

අර්තාපල් බෝගයේ පවතින ඉහත දැක්වෙන වැදගත්කම් හඳුනා ගනිමින් වර්තමාන රජයේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයේ අතිරේක බෝග කාණ්ඩය යටතේ නිෂ්පාදනය සහ වගා වපසරිය වැඩි කළ යුතු බෝගයක් ලෙස අර්තාපල් බෝගය හඳුනාගෙන ඇත. එබැවින් අර්තාපල් බෝගයේ සම්පූර්ණ අගයදාම විශ්ලේෂණයක් සිදුකිරීම තුළින් එම දාමය තුළ සිටින දාම ක්‍රියාකාරින් තීරණ ගැනීමේදි උපකාරී වන අතර විශේෂයෙන්ම ප්‍රතිපත්ති සම්පාදකයින්ට බෝගය සම්බන්ධ ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා වඩාත් උපකාරී වෙයි.

තවද මෙමඟින් බෝගයේ ප්‍රවර්ධනය අඩාල වීමට හේතුවන දුර්වලතා සහ ඒවා මහහරවා ගැනීමට සුදුසු ක්‍රියාමාර්ගයන් යෝජනා කිරීම ද සිදු කළ හැකිවේ. එමඟින් ශ්‍රී ලංකාව තුළ අර්තාපල් වගාව නගාසිටුවීමට අදාළ වන ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට උපකාරී වේ.

මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ අගයදාම විශ්ලේෂණ ප්‍රවේශය භාවිතා කරමින් ශ්‍රී ලංකාවේ අර්තාපල් බෝග වගා අංශයේ සංවර්ධනයට පවතින බාධාකාරී සාධක හඳුනාගැනීම සහ විශ්ලේෂණය කිරීම තුළින් එම බාධක මහහරවා ගැනීමට අදාළ පිළියම් යෝජනා කිරීමයි.

විශේෂිත අරමුණු

1. අධ්‍යයන ප්‍රදේශයන්හි පවතින අර්තාපල් අගයදාමයන් සහ සියලුම දාම ක්‍රියාකාරින් හඳුනාගැනීම සහ සිතියම්ගත කිරීම
2. අර්තාපල් අගයදාමය තුළ සිටින දාම ක්‍රියාකාරින්ගේ ආර්ථික කාර්යසාධනය තක්සේරු කිරීම

3. අර්තාපල් අගය දාමයන් තුළ පවතින ප්‍රධානතම බාධාවන් සහ සංවර්ධනය සඳහා පවතින අවස්ථාවන් හඳුනාගැනීම
4. ශ්‍රී ලංකාවේ අර්තාපල් වගාව තවදුරටත් නගාසිටුවීම සඳහා අර්තාපල් අගයදාමය වැඩිදියුණු කිරීමට අදාළ ක්‍රියාකාරකම් සහ ප්‍රතිපත්තිමය නිර්දේශ යෝජනා කිරීම

වර්තමාන ප්‍රගතිය

පර්යේෂණ යෝජනාව පර්යේෂණ හා පුහුණු කමිටුවට ඉදිරිපත් කර අනුමැතිය ලබාගත් අතර අධ්‍යයනය **2022** මාර්තු මස අවසන් කිරීමට සැලසුම් කර ඇත.

02

කෘෂිකාර්මික සම්පත් කළමනාකරණ අංශය

අවසන් නොකළ අධ්‍යයන

1. ආහාර බෝග අංශයේ පළිබෝධ සහ රෝග කළමනාකරණය සඳහා පරිශීලක කේන්ද්‍රීය ජංගම දුරකථන පාදක විසඳුම

බටහිර සිඩ්නි විශ්ව විද්‍යාලය , කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයනායතනය සමග සිදු කරන ලද සහයෝගිතා පර්යේෂණ ව්‍යාපෘතියකි.

පර්යේෂණ කණ්ඩායම :	එම්.බී.එෆ් රිෆානා	- සම්බන්ධීකාරක
	පී.ආර් වීරක්කොඩි	- සම පර්යේෂක
	ඩී.ටී.පී.එස් ධර්මවර්ධන	- සම පර්යේෂක
	ඩී.එම්.ඒ.සී දිසානායක	- සම පර්යේෂක
	අයි.වී කුරුප්පු	- සම පර්යේෂක

මූල්‍ය ප්‍රභවය : ඒකාබද්ධ අරමුදල

විෂය පථය සහ අරමුණු

කෘෂිකාර්මික බෝගවල රෝග හා පළිබෝධ මර්දනය සම්බන්ධයෙන් ගොවීන් වෙත තොරතුරු ගලායාම විවිධ දුර්වලතාවලින් සමන්විත වේ. පළිබෝධ සහ රෝග ඇතිවීම හඳුනා ගැනීමටත්, ඒවා වසංගත බවට වර්ධනය වෙනවාද යන්න අවබෝධ කර ගැනීමටත්, එවැනි අවස්ථාවලදී කවර පාලන ක්‍රම අනුගමනය කළ යුතුද යන්නත් සම්බන්ධයෙන් ගොවීන්ට අවශ්‍ය වූ විට, අවබෝධ කරගත හැකි ආකෘතියකින් සහ තේරුම්ගත හැකි භාෂාවකින් තොරතුරු ලබා ගැනීමේ හැකියාව සීමිත ය. මේ කරුණු සියල්ල එකට ගත් කල, එය සම්බන්ධීකරණ අසමත්වීමක් ලෙස හැඳින්විය හැකි ය. ගොවි ප්‍රජාවට තත්‍ය කාලීන තොරතුරු නොමැතිකම දැඩි බෝග හානිවලට හේතු වී ඇති බැවින් පළිබෝධ සහ රෝග ගොවි ප්‍රජාව මුහුණ පාන එක් ප්‍රධාන ගැටලුවක් බවට පත්ව තිබේ. මෙම තත්ත්වය සැලකිල්ලට ගෙන දියත් කළ මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන පරමාර්ථය වූයේ ස්මාර්ට් පරිගණකය, සහභාගීත්ව සංවේදනය සහ පළිබෝධ සහ රෝග සිදුවීම් කල්තියා හඳුනා ගැනීම තුළින් බෝග හානි අවම කිරීම සඳහා ප්‍රජා පාදක ප්‍රවේශයන් සංවර්ධනය කිරීම හා ඒවායේ වලංගුභාවය පරීක්ෂා කිරීමයි. ඒ අනුව 'ලේඩ්බර්ඩ්' (Lady Bird) නමින් ජංගම දුරකථන පදනම් කරගත් යෙදුමක් සංවර්ධනය කර කුරුණෑගල, මාතර සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්කවල වී ගොවීන් වෙත හඳුන්වා දෙන ලදී.

පර්යේෂණ සොයා ගැනීම් සහ නිගමන

1. වී වගාවේ පළිබෝධ සහ රෝග කළමනාකරණය සම්බන්ධ බොහෝ දුර්වලතා මූලික සමීක්ෂණයෙන් හෙළි විය. නිර්දේශිත වගා පිළිවෙත් භාවිතා නොකිරීම, පළිබෝධ සහ රෝග හටගැනීම් පිළිබඳව නිසි ලෙස හඳුනා නොගැනීම, පළිබෝධ සහ රෝග කළමනාකරණය

පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් නොමැති වීම, රසායනික පාලන ක්‍රම මත අධික ලෙස යැපීම සහ පළිබෝධ සහ රෝග කළමණාකරණයේ දී තහවුරු නොකළ තොරතුරු ප්‍රභවයන් මත යැපීම, නුසුදුසු පළිබෝධනාශක තෝරා ගැනීම, පළිබෝධනාශක අනිසි ලෙස භාවිතා කිරීම සහ කෘෂි ව්‍යාප්ති තොරතුරු ලැබීමේ ප්‍රමාදයන් මෙයට ඇතුළත් ය. 'ලේඩ්බර්ඩ්' යනු මෙම බහුවිධ ගැටලු සඳහා පිළිතුරු ඇතුළත් විසඳුමකි. වී වගාවේ බෝග පාඩු සිදුවීමට ප්‍රධාන හේතුව පළිබෝධ සහ රෝග වන අතර පළිබෝධ සහ රෝග කළමනාකරණය කිරීමේදී තත්‍ය කාලීන තොරතුරු සහිත 'ලේඩ්බර්ඩ්' යෙදවුමේ දායකත්වය අතිමහත් බව ගොවීන් වටහාගෙන ඇත.

2. පසු ඇගයීම ඔස්සේ එළිදරව් වන පරිදි මෙම ජංගම යෙදවුම ගොවීන්ට විවිධාකාරයෙන් ප්‍රයෝජනවත් හා ආකර්ෂණීය මෙවලමක් වී ඇත. නිවැරදි පළිබෝධනාශක තෝරා ගැනීමට (53%); පළිබෝධ නාශක නිර්දේශ අනුගමනය කිරීමට (49%); පරිශීලක-හිතකාමීබව (72%); නිවැරදි සන්දර්භය තුළ දැනුම ප්‍රායෝගිකව භාවිතා කිරීමට (76%); කෘෂිකර්ම උපදේශක හා ගොවියා අතර තත්‍ය කාලීන සම්බන්ධතාවය ශක්තිමත් වීම සහ කෘෂිකර්ම උපදේශක විසින් රෝග හා පළිබෝධ නිශ්චය කර පාලන ක්‍රම නිර්දේශ කරන බැවින් හඳුනාගැනීමේ වැරදි හා පළිබෝධනාශක අව භාවිතය අවම වීම (85%).

3. පශ්චාත් ඇගයීමෙන් තව දුරටත් හෙළිවන පරිදි නියැදි ගොවීන්ගෙන් 90%ක් පළිබෝධ සහ රෝග හඳුනා ගැනීම සඳහා ජංගම යෙදවුම භාවිතා කළ අතර ඔවුන්ගෙන් 45%ක් ජංගම යෙදවුම හරහා පළිබෝධ සහ රෝග වාර්තා කර විසඳුම් බලාපොරොත්තු විය. වයස අවුරුදු 40 ට අඩු ගොවීන් වැඩිහිටි ගොවීන්ට වඩා ජංගම යෙදවුම මගින් පළිබෝධ සහ රෝග සිදුවීම් වාර්තා කළහ. තරුණයන් කෘෂිකර්මාන්තයට ආකර්ෂණය කර ගැනීමේදී තොරතුරු තාක්ෂණයේ වැදගත්කම ඉන් ගම්‍ය වේ.

4. කෙසේ නමුත්, ගොවි ප්‍රජාව විසින් ලේඩ්බර්ඩ් වැනි ජංගම යෙදුවුමක් භාවිතා කිරීමට බාධා කරන සාධක ගණනාවක් ඇති අතර ඒවා වැඩි දියුණු කළ යුතුය. රටේ ජනගහනය විසින් ජංගම දුරකථන අධික ලෙස භාවිතා කළද, වී ගොවීන් බොහොමයක් භාවිත කරන්නේ තාක්ෂණයෙන් ඉහළ ජංගම යෙදවුම්වලට නොගැලපෙන මූලික අනුවාදවල ජංගම දුරකථන යි. ගොවිතැන් කරන ප්‍රදේශවල දුර්වල සංඥා ශක්තිය සහ අන්තර්ජාල පහසුකම් නොමැතිකම ද ප්‍රධාන බාධක වේ. එබැවින් සම්බන්ධතාවය වැඩි දියුණු නොකර ජංගම යෙදුම් හඳුන්වා දීම ඵලදායී නොවේ. කෘෂිකර්මාන්තය ඩිජිටල්කරණය පිළිබඳ අපේක්ෂාවන් සාක්ෂාත් කර ගැනීම සඳහා ගොවිතැන් කරන ප්‍රදේශ හා ගොවීන් සමඟ සම්බන්ධතා වැඩි දියුණු කිරීම මූලික අවශ්‍යතාවයකි. එබැවින්, ගොවිබිම් ආවරණය කරමින් ගොවීන් වෙත සමීපවීම සඳහා ඒකාබද්ධව හෝ සාමූහිකව සියලු ආකාරයේ සන්නිවේදන යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට රජය රාජ්‍ය හා පෞද්ගලික ව්‍යවසායන් දිරිමත් කළ යුතුය.

5. තවද, ජංගම යෙදුම් හරහා ගොවිපළ කුටුම්භයන්ට සාධාරණ වටිනාකමක් එක් කිරීමට හිතකර පරිසරයක් ගොවිජන සේවා මධ්‍යස්ථානවල නොපවතී. එබැවින්, ගොවීන්ගේ තොරතුරු අවශ්‍යතා තත්‍ය කාලීනව සපුරාලීම සඳහා ව්‍යාප්ති හා තොරතුරු සන්නිවේදන තාක්ෂණ හැකියාවන්ගෙන් යුත් නිලධාරීන් නිරන්තරයෙන් සම්බන්ධ වන සම්පත්වලින් පරිපූර්ණ ඒවා බවට ගොවිජන සේවා මධ්‍යස්ථාන පරිවර්තනය කළ යුතුය.

6. මෙවැනි ජංගම විසඳුම්වලින් ප්‍රයෝජන ගැනීම සඳහා ගොවීන් ද ප්‍රමාණවත් තරම් තාක්ෂණික වශයෙන් බලගැන්වී නොමැත. එබැවින්, ගොවි ප්‍රජාව ඊ-විසඳුම් භාවිතා කිරීමට හුරු කරවීම සඳහා කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවට දායක විය හැකි ය. නිදසුනක් වශයෙන්, තොරතුරු හා

සන්නිවේදන තාක්ෂණය භාවිතා කිරීම සඳහා සිය සාමාජිකයින් සවිබල ගැන්වීමට සහ ප්‍රජා මට්ටමින් ගොවිතැන සම්බන්ධ ගැටලු විසඳීමට ගොවි සංවිධානවලට සහාය වීම.

2. ශ්‍රී ලංකාවේ පහතරට තෙත් කලාපීය කුඹුරු ඉඩම් තීව්‍ර ලෙස භාවිතා කිරීමේ උපාය මාර්ග

පර්යේෂණ කණ්ඩායම	පී.ආර් වීරක්කොඩි	- සම්බන්ධීකාරක
	ආර්.එම්.ඩී.එච් රත්නායක	- සම පර්යේෂක
	එම්.බී.එෆ් රිෆානා	- සම පර්යේෂක
	ඩී.ටී.පී.එස් ධර්මවර්ධන	- සම පර්යේෂක

අරමුදල් ප්‍රභවය : ඒකාබද්ධ අරමුදල

විෂය පථය සහ අරමුණු

ප්‍රධාන අරමුණ

පහතරට තෙත් කලාපීය කුඹුරු ඉඩම් තීව්‍ර ලෙස භාවිතා කිරීම සඳහා විකල්ප උපාය මාර්ග හඳුනා ගැනීම.

සෙසු අරමුණු:

1. පහතරට තෙත් කලාපීය ක්‍රියාකාරී කුඹුරු ඉඩම් තවදුරටත් අත්හැරීම වැළැක්වීමට උපකාරීවන උපාය මාර්ග හඳුනා ගැනීම
2. පහතරට තෙත් කලාපීය අස්වද්දන ලද සහ වපුරනු ලබන කුඹුරු ඉඩම් ප්‍රමාණය වැඩි කිරීම සඳහා පුරන් කුඹුරු නැවත වගා කිරීමේ වැඩසටහන් වල ඵලදායීතාවය වැඩි දියුණුවන උපාය මාර්ග හඳුනා ගැනීම
3. පුරන් කුඹුරුවල සිදු කරනු ලබන අනෙකුත් කෘෂිකාර්මික කටයුතුවල කාර්ය සාධනය වැඩි දියුණු කිරීමේ උපාය මාර්ග හඳුනා ගැනීම සහ වෙනත් කෘෂිකාර්මික කටයුතු සඳහා යොදා ගන්නා පුරන් කුඹුරුවල නැවත වී වගා කිරීමට ගොවීන් දිරිමත් කිරීමේ උපාය මාර්ග හඳුනා ගැනීම

අපේක්ෂිත ප්‍රතිඵල

ප්‍රදේශයේ සක්‍රීය වී ඉඩම් තවදුරටත් අත්හැරීම වැළැක්වීම; අස්වද්දන ලද හා වපුරන ලද බිම් ප්‍රමාණය ඉහළ නැංවීම සඳහා පුරන් කුඹුරු නැවත වගා කිරීමේ ප්‍රයත්නයන්වල ඵලදායීතාව ඉහළ නැංවීම; පුරන් කුඹුරුවල සිදු කරන වෙනත් කෘෂිකාර්මික කටයුතුවල කාර්ය සාධනය වැඩි දියුණු කිරීම හා වෙනත් කෘෂිකාර්මික කටයුතු සිදු කරන පුරන් කුඹුරුවල නැවත වී වගා කිරීම දිරි ගැන්වීමේ උපාය මාර්ග හඳුනා ගැනීමෙන් අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ සාක්ෂාත් කරගනු ඇත.

වත්මන් ප්‍රගතිය:

සාහිත්‍ය සමාලෝචනය සහ පර්යේෂණ යෝජනාව සකස් කිරීම.

අපේක්ෂිත ප්‍රතිඵලය: පහත රට තෙත් කලාපීය වී පාදක පරිසර පද්ධතිය තවදුරටත් පිරිහීම වැළැක්වීමට උපකාරී වන උපාය මාර්ග හඳුනා ගැනීම තුළින් ප්‍රතිපත්ති සම්පාදනයට මෙම අධ්‍යයනය දායක වේ.

3. ශ්‍රී ලංකාව තුළ වනඝත්ත්ව හානි හේතුවෙන් සිදුවන බෝග සහ අස්වනු හානිය

පර්යේෂණ කණ්ඩායම: ඩී.එම්.ඒ.සී දිසානායක - සම්බන්ධීකාරක
සංගීත් ප්‍රනාන්දු - සම පර්යේෂක
අයි.වී කුරුප්පු - සම පර්යේෂක

අරමුදල් ප්‍රභවය : ඒකාබද්ධ අරමුදල

විෂය පථය සහ අරමුණු

වන සතුන්ගේ හානි හේතුවෙන් කෘෂි අංශයේ සිදුවන අස්වනු හානිය මේ වන විට ඉතා ඉහළ සමාජාර්ථික ගැටලුවක් බවට පත්වී ඇත. එමෙන් මේ තත්ත්වය හේතුවෙන් නිර්මාණය වී ඇති මිනිස් වනඝත්ත්ව ගැටුම වනඝතුන්ගේ ජීවිත වලට මෙන්ම මිනිස් ජීවිත සහ දේපොළ සඳහා ඇතිකරන හානියද දිනෙන් දින ඉහළ යමින් පවතී. මෙම තත්වය පිළිබඳව සිදුකෙරී ඇති අධ්‍යන වල සොයා ගැනීම් අනුව මෙන්ම, කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යනු ලබන 'කෘෂිකාර්මික ප්‍රදේශවල වගාවන්ට හානි කරනු ලබන වනඝතුන්ගෙන් වන හානි හේතුවෙන් මතුවන ගැටලු අවම කිරීම සඳහා වන කමිටුව' විසින් වනඝංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත **'wildlife Acceptance Capacity (WAC)'** හෙවත් ප්‍රශස්ත මට්ටමේ වනජීවී ගහන කළමනාකරණ වැඩසටහනක් යෝජනා කරන ලදී. ඒ හරහා සංරක්ෂණය වියයුතු සහ නොවිය යුතු වනඝතුන් පිළිබඳව දැනට පවතින හඳුනා ගැනීම් සහ නෛතික ප්‍රතිපාදන යාවත්කාලීන කිරීම අපේක්ෂා විය. එහෙත් එම දෙපාර්තමේන්තුවේ තක්සේරු වනුයේ එවැනි කටයුත්තක් සඳහා විශාල කාලයක් ගතවනු ඇති බවයි. එබැවින්, ඒ සඳහා විකල්පයක් වශයෙන් දිවයින පුරා වනඝතුන්ගෙන් කෘෂි අංශයට සිදුවන හානිය පිළිබඳ වාර්තාවක් පදනම් කරගනිමින් අදාළ නීතිමය යාවත්කාලීන කිරීම් සිදුකළ හැකි බව කෘෂිකර්ම අමාත්‍යාංශයේ උක්ත කමිටුවේදීම යෝජනා විය.

ඒ අනුව කැබිනට් මණ්ඩලය විසින් **2019.06.20** වන දින අනුමත කරන ලද අංක **19/1796/118/082** දරණ වන සතුන්ගෙන් සිදුවන හානි අවම කිරීම සඳහා වන තිරසර වැඩපිළිවෙළට අදාළ කැබිනට් පත්‍රිකාව මඟින් විවිධ ආයතන හඳුනාගෙන එම ආයතන මඟින් ඉටුවිය යුතු කාර්යයන්ද ප්‍රකාශයට පත්කරන ලදි. එම කැබිනට් පත්‍රිකාව ප්‍රකාරව, හෙක්ටර් කොඩ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ සහා පුහුණු කිරීමේ ආයතනය සඳහා දිපව්‍යාප්ත මට්ටමින් සිදුකෙරෙන මෙම අධ්‍යයනය පැවරී ඇත. මෙය කෘෂිකර්ම අමාත්‍යාංශයේ බහුතර මුල්‍ය ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කිරීමට යෝජනා වී ඇත. (අප ආයතනයේ මූල්‍ය දායකත්වය රුපියල් මිලියනයක උපරිමයකට යටත් වේ). එමෙන්ම මෙම අධ්‍යයනය, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ජනසංඛ්‍යා හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය ඒකාබද්ධව මෙහෙයවීමට අපේක්ෂා කරන අතර සම්බන්ධීකරණ කටයුතු කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් සිදු කෙරේ.

අපේක්ෂිත ප්‍රතිඵල

දිවයින පුරා බෝග වගාවන්ට වනසතුන්ගෙන් සිදුවන හානි තක්සේරු කිරීම මෙහිදි අපේක්ෂා කෙරේ. ඒ අනුව හඳුනාගනු ලබන ප්‍රධාන කෘෂි කලාප ආශ්‍රිත ප්‍රධාන බෝග වර්ග සඳහා ඒ ඒ සත්ත්ව කාණ්ඩ මඟින් සිදුවන හානිය වෙන් වෙන්ව හඳුනාගැනීමට අපේක්ෂා කෙරේ.

වත්මන් ප්‍රගතිය

පර්යේෂණ සඳහා වන යෝජනාවලිය කෘෂිකර්ම අමාත්‍යාංශයේ ‘කෘෂිකාර්මික ප්‍රදේශවල වගාවන්ට හානිකරනු ලබන වන සතුන්ගෙන් වන හානි හේතුවෙන් මතුවන ගැටලු අවම කිරීම සඳහා වන කමිටුව’ වෙත යොමු කොට ඇති අතර අදාළ කමිටුවේ නිර්දේශ අපේක්ෂාවෙන් පසුවේ.

03

පාරිසරික හා ජලසම්පත් කළමනාකරණ අංශය

අවසන් නොකළ අධ්‍යයන

1. මධ්‍ය කඳුකරයේ නැගෙනහිර බෑවුම ආශ්‍රිත ජල කළමනාකරණ ගැටලු

පර්යේෂණ කණ්ඩායම :	ඩබ්.එච්.ඒ ශාන්ත	- සම්බන්ධීකාරක
	ජී.ජී.ද.එල්.ඩබ්.සමරසිංහ	- සම පර්යේෂිකා
	එම්.ඒ.සී.එස් බණ්ඩාර	- සම පර්යේෂක
	ටී.පී මුණසීරගේ	- සම පර්යේෂිකා

මූල්‍ය ප්‍රභවය : ඒකාබද්ධ අරමුදල්

විෂයපථය සහ අරමුණු

මධ්‍ය කඳුකරයේ දේශගුණික අවදානමට ලක්විය හැකි නැගෙනහිර බෑවුම් ප්‍රදේශවල ජල ගැටලු වැඩිවීමට ප්‍රධාන හේතුවක් ලෙස විවිධ පරිශීලකයන් අතර ජල බෙදා හැරීම නියාමනය කිරීම සහ ජල සම්පත් පිළිබඳ ආරවුල් සහ ගැටුම් නිරාකරණය කිරීම සඳහා පිහිටුවන ලද ආයතනයක් නොමැති වීම ප්‍රධාන වී ඇත. වියළි කලාපයේ ජල යෝජනා ක්‍රම තුනක දැනට සිදු කර ඇති අධ්‍යයනය මඟින් විවිධ පරිශීලකයන් අතර සාධාරණ ලෙස ජලය බෙදා හැරීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කරන අතරම ජල ගැටුම් නිරාකරණය සඳහා විධිමත් ආයතනික විධිවිධානයක අවශ්‍යතාවය මතුකර පෙන්වීමට උත්සාහ දරා ඇත.

සහභාගීත්ව වාරිමාර්ග/ජල කළමනාකරණ සංකල්ප හා භාවිතයන් යොදා ගැනීමේ වැදගත්කම, පවතින පද්ධතිය/පද්ධති (ඇත්නම්) ශක්තිමත් කිරීම සහ මෙම කලාපයේ විවිධ පරිශීලකයින් අතර සීමිත ජල සම්පත් ප්‍රමාණයක් වෙන් කිරීමට අදාළ ගැටලු සඳහා විවිධ පාර්ශ්වකරුවන් විසින් එකඟ වන පරිදි තිරසාර යාන්ත්‍රණයක් සැකසීමේ වැදගත්කම, අධ්‍යයනයෙන් අනාවරණය කිරීමට අපේක්ෂා කරයි.

පර්යේෂණ අරමුණු

> මෙම පර්යේෂණයේ මූලික පරමාර්ථය නම් මධ්‍යම කඳුකරයේ දේශගුණික අවදානමට ලක්විය හැකි නැගෙනහිර බෑවුම් ප්‍රදේශවල ජල කළමනාකරණ ගැටලු හඳුනා ගැනීම සහ විවිධ පරිශීලක කණ්ඩායම් අතර ජලය බෙදා හැරීම සඳහා තිරසාර යාන්ත්‍රණයක් යෝජනා කිරීම ය.

අධ්‍යයනයේ විශේෂිත අරමුණු වන්නේ:

- විවිධ අවශ්‍යතා ඇති විවිධ ජල පරිහරණ කණ්ඩායම් හඳුනා ගැනීම

- විවිධ බෝග නිෂ්පාදන පද්ධතීන්හි ඉඩම් ප්‍රසාරණයේ ව්‍යාප්තිය/පහත වැටීම තක්සේරු කිරීම
- අවාසිදායක ජල පරිහරණ කණ්ඩායම්/කණ්ඩායම්වල ජීවනෝපාය සහ ගෘහස්ත ආහාර සුරක්ෂිතතාවයට ජල හිඟයේ බලපෑම පරීක්ෂා කිරීම සහ විවිධ පාර්ශ්වකරුවන් සඳහා පිළිගත හැකි තිරසාර ජල බෙදා හැරීමේ යාන්ත්‍රණයක් ලබා ගැනීම.

සොයා ගැනීම් සහ නිර්දේශ

ගංගාවේ ජල සම්පත් භාවිතා කරන්නන් විශාල සංඛ්‍යාවක් ඇත, එනම් ගංගා ද්‍රෝණියේ ඉතා ඉහළ පෙදෙස් වල (පිදුරුතලාගල වන රක්ෂිතයට ආසන්නව) විශාල පරිමාණයේ එළවළු වගා කරන්නන්, ඉතා උස් ස්ථානවල තේ වතුවල වෙසෙන ගෘහස්ත ජල භාවිතා කරන්නන්, ආක්‍රමණය කරන ලද රක්ෂිතවල එළවළු සහ වාණිජ බෝග වගා කරන වතු කම්කරුවන්, කුඩා ජල විදුලි බලාගාර හරහා ජල විදුලිය නිෂ්පාදනය, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් පානීය ජලය බෙදා හැරීම, වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් සපයනු ලබන කෘෂිකාර්මික වාරිමාර්ග ජලය, සුළු වාරිමාර්ග ක්‍රම යටතේ වී සහ අනුබද්ධ බෝග වගා කරන්නන් (පහත් බිම්වල අමුණ සහ කුඩා ජල මාර්ග) වශයෙනි.

පහත් බිම්වල වී, එළවළු සහ අනෙකුත් උප භෝග වගා කිරීමේ බිම් ප්‍රමාණය සැලකිය යුතු ලෙස පහත යමින් පවතින අතර තේ වතුවල සහ බොහෝ උස්බිම්වල ආක්‍රමණය කරන ලද ඇළ රක්ෂිතයන්හි එළවළු සහ වාණිජ බෝග වගා කිරීමේ බිම් ප්‍රමාණය අඛණ්ඩව ඉහළ යමින් පවතී.

ඉහළ උච්ඡත්වය සහිත ප්‍රදේශවල අධික ජල භාවිතය හේතුවෙන් පහත් බිම්වල කුඹුරු ඉඩම් ජල හිඟවීම සිදු වී ඇත. මේ නිසා පහත් ප්‍රදේශවල කුඹුරු ඉඩම් සැලකිය යුතු ප්‍රමාණයක් වගා නොකර අත්හැර දමා ඇත. මේ හේතුවෙන් කෘෂිකර්මාන්තය පදනම් කරගත් ජීවනෝපාය මාර්ගවලට තර්ජනයක් එල්ල වන අතර පීඩාවට පත් ප්‍රදේශවල පවුල්වල ආහාර සුරක්ෂිතතාවයට උග්‍ර බලපෑමක් එල්ල කර තිබේ.

භූමියේ පිහිටීම ඔස්සේ විවිධ ජල භාවිතා කරන්නන් අතර සාධාරණ ලෙස ජලය බෙදා හැරීම සඳහා ආයතනික මැදිහත් වීමක් සිදු කළ යුතුය.

2. ශ්‍රී ලංකාවේ තෙත් කලාපීය ඉඩම්වල ඵලදායීතාවය කෙරෙහි සම්ප්‍රදායික ඉඩම් බුක්ති ක්‍රමයන්හි බලපෑම (තට්ටු මාරු හා කට්ටි මාරු ක්‍රම ඇසුරෙන්)

පර්යේෂණ කණ්ඩායම	ටී.පී මුණසීරගේ	සම්බන්ධීකාරක
	ජී.ජී.ද එල්.ඩබ් සමරසිංහ	සම පර්යේෂිකා
	එම්.ඒ.සී.එස් බණ්ඩාර	සම පර්යේෂක
මූල්‍ය ප්‍රභවය	ඒකාබද්ධ අරමුදල	

විෂය පථය සහ අරමුණු

තට්ටු මාරු සහ කට්ටි මාරු යනු පහතරට සහ මැදරට තෙත් කලාපය ආශ්‍රිත කුඹුරු ඉඩම් කේන්ද්‍රකොට ඇති ප්‍රාදේශීය ඉඩම් බුක්ති ක්‍රමයකි. එම ක්‍රමයන්හි මූලාරම්භය, ඉතිහාසය, මෙහෙයුම් ස්වභාවය සහ එහි ප්‍රතිඵල පිළිබඳ සවිස්තරාත්මකව සොයා බැලීම පිණිස ප්‍රමාණවත් අධ්‍යයන සිදු කර නොමැත. එබැවින් මෙම අධ්‍යයනයේ අරමුණ ශ්‍රී ලංකාවේ තෙත් කලාපීය ඉඩම්වල ඵලදායීතාවය කෙරෙහි

තට්ටු මාරු හා කට්ටි මාරු ඉඩම් බුක්ති ක්‍රමයන්හි බලපෑම සොයා බැලීම සහ ඊට අදාළ ගැටලු සහ ගැටලු විසඳීම සඳහා විසඳුම් සොයා බැලීමයි.

අධ්‍යයනයේ අරමුණු

මෙම අධ්‍යයනයේ මූලික අරමුණ ශ්‍රී ලංකාවේ තෙත් කලාපීය ඉඩම්වල වී වගාවේ ඵලදායීතාවය කෙරෙහි තට්ටු මාරු හා කට්ටි මාරු ඉඩම් බුක්ති ක්‍රමයන්හි බලපෑම විශ්ලේෂණය කිරීමයි.

විශේෂිත අරමුණු

- තට්ටුමාරු සහ කට්ටිමාරු ඉඩම් බුක්ති ක්‍රමයන්ට ආවේණික ලක්ෂණ හඳුනාගෙන කට්ටිමාරු සහ තට්ටු මාරු පාලන ක්‍රමය කෘෂිකාර්මික ඵලදායීතාවයට කෙතරම් දුරට බලපා ඇත්ද යන්න සොයා බැලීම.

- දැනට පවතින කෘෂිකාර්මික/ගොවිජන සැකසුමේදී මෙම ක්‍රමය කෙරෙහි ගොවීන්ගේ ආකල්පය කවාරාකාරදැයි සොයා ගැනීම සහ එම එක් එක් විශේෂිත ඉඩම් බුක්ති ක්‍රමය හා සම්බන්ධ ඵලදායිතා ගැටලු විසඳීම පිණිස පිළියම් සෙවීම.

සොයා ගැනීම් සහ නිර්දේශ

ගොවීන්ගෙන් වැඩි දෙනෙක් වැඩිහිටියෝ වන අතර වී ගොවිතැන මූලික ආදායම් මාර්ගයක් ලෙස සිදු නොකරති. අනාගතයේ දී වගා ඉඩම් අතහැරයාමේ අවදානමක් පෙන්නුම් කරමින් වී ගොවිතැන සඳහා තරුණයින්ගේ සහභාගීත්වය සීමා වී ඇති බව ද සංඛ්‍යා විද්‍යාත්මක තොරතුරු මඟින් අනාවරණය වේ. දිස්ත්‍රික්ක තුනේම ගොවිපළ මිලට වඩා ආරෝපිත පිරිවැය ඇතුළත්ව ඒකකයක නිෂ්පාදන පිරිවැය ඉහළ යන අතර සමස්ත පිරිවැය විභේදනය කර බැලීමේ දී පෙනී යන්නේ පිරිවැයෙන් 50%කට වඩා වැඩි ප්‍රතිශතයක් ශ්‍රමය සඳහා වැය කර ඇති අතර ඉන් අනතුරුව පිළිවෙළින් වැඩි ප්‍රතිශතයක් යන්ත්‍ර සූත්‍ර සහ උපකරණවලට වැය වී තිබේ. මෙම ඉඩම් හිමිකාරිත්ව ක්‍රමයේ ස්වභාවය හේතුවෙන් යම් අනාරක්ෂිතභාවයක් ඇති කළත්, ඉඩම් සංවර්ධනය කිරීමට හා නඩත්තු කිරීමට බාධාවක් වූවත් අධ්‍යයනය කළ ප්‍රදේශවල කුඹුරු වගා නොකිරීමට ප්‍රධාන හේතුව වූයේ නිෂ්පාදනයේ ආර්ථිකමය නොවන ස්වභාවයයි.

නිර්දේශ

තට්ටුමරු-කට්ටිමාරු ක්‍රමය සංකීර්ණ ඉඩම් හිමිකාරිත්ව සංසිද්ධියක් වන අතර එහි ආර්ථිකමය නොවන නිෂ්පාදන ස්වභාවය හේතුවෙන් විවිධ ගැටලු ඇති වන්නකි. එබැවින් එම ගැටලුවට විසඳුම සාකල්‍ය ප්‍රවේශයක් ලෙස පැමිණිය යුතුව ඇත. අවශ්‍ය වන ඕනෑම අවස්ථාවක ඉඩම් බෙදීම හා ඒකාබද්ධ කිරීම ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු නීති ආයතන පිහිටුවා වේගයෙන් වියැකී යන මෙම ඉඩම් බුක්ති ක්‍රම පද්ධතිය යථා තත්ත්වයට පත් කිරීම ගැන සලකා බැලිය යුතුය.

3. ගොවි සංවිධාන සඳහා සුළු වාරිමාර්ග පුනරුත්ථාපන **(Minor Irrigation Rehabilitation-MIR)** කොන්ත්‍රාත් පිරිනැමීම තක්සේරු කිරීම: ශ්‍රී ලංකාවේ තිරසාර සුළු වාරිමාර්ග සංවර්ධනය සඳහා වන බලපෑම් විශ්ලේෂණය කිරීම

පර්යේෂණ කණ්ඩායම	:	එම්.ඒ.සී.එස් බණ්ඩාර	සම්බන්ධීකාරක
		එම්.ටී පද්මජානී	සම පර්යේෂිකා
		ඩබ්.එච්.ඒ ශාන්ත	සම පර්යේෂක
		ජී.ජී. ද එල් .ඩබ් සමරසිංහ	සම පර්යේෂිකා

මූල්‍ය ප්‍රභවය : ඒකාබද්ධ අරමුදල

විෂයපථය සහ අරමුණු :

ගොවි සංවිධාන සඳහා සුළු වාරිමාර්ග පුනරුත්ථාපන කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම ආරම්භ කරන ලද්දේ MNPEA 3/2003 යටතේ නිකුත් කරන ලද චක්‍ර ලේඛය සමඟය. ගොවි සංවිධාන වෙත ලබා දුන් කොන්ත්‍රාත් මුදල මුලින් රු. මිලියන දෙකක් වූ අතර පසුව එම මුදල MNPEA 3/2016 චක්‍රලේඛය මගින් රුපියල් මිලියන පහක් දක්වා ඉහළ දමන ලදී.

ඉහත චක්‍ර ලේඛනයෙන් අරමුණු දෙකක් සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කෙරුණි. මූලික වශයෙන් සුළු වාරිමාර්ග පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම සහ අමතර වශයෙන් ගොවි සංවිධානයට හිමිකාරිත්වය පිළිබඳ හැඟීමක්, තාක්ෂණික කුසලතාවයන්, වැඩි මූල්‍ය හැකියාවක් සහ කායික ශ්‍රමය පිළිබඳ තහවුරුවක් සපයමින් පද්ධතියේ තිරසාරභාවය පිළිබඳ පවත්වා ගෙන යාමයි. මෙම අධ්‍යයනය සැලසුම් කර ඇත්තේ ඉහත වැඩසටහනට අදාළ මූලික ප්‍රශ්න දෙකකට පිළිතුරු සැපයීම සඳහා ය. එනම්,

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට තරඟකාරී ලංසු ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලියක් අනුගමනය නොකර ගොවි සංවිධාන වෙත සුළු වාරිමාර්ග පුනරුත්ථාපන කොන්ත්‍රාත් ලබා දීමේ අරමුණ ඉටු කර ගැනීමට හැකි වූයේද? තරඟකාරී ලංසු තැබීමේ ක්‍රමය අනුගමනය නොකර ගොවි සංවිධාන වෙත සුළු වාරිමාර්ග පුනරුත්ථාපන කොන්ත්‍රාත් ලබා දීම තිරසාරද? ගොවි සංවිධාන හරහා සුළු වාරිමාර්ග පුනරුත්ථාපන කොන්ත්‍රාත් ලබා දීමේ බලපෑම අධ්‍යයනය කිරීම මඟින් චක්‍ර ලේඛනය නැවත සලකා බැලීම සහ ශ්‍රී ලංකාවේ සුළු වාරිමාර්ග පද්ධතිවල තිරසාරභාවය සඳහා අවශ්‍ය සංශෝධන සිදු කිරීම සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත අවබෝධයක් ලබා දෙනු ඇතැයි අපේක්ෂා කෙරිණි.

මෙම අධ්‍යයනයේ ප්‍රධාන පරමාර්ථය වූයේ ගොවි සංවිධානවලට සුළු වාරිමාර්ග පුනරුත්ථාපන (MIR) කොන්ත්‍රාත් පිරිනැමීමේ බලපෑම තක්සේරු කිරීමත්, තරඟකාරී ලංසු තැබීමේ පටිපාටිය අනුගමනය නොකර ගොවි සංවිධාන වෙත කොන්ත්‍රාත් ලබා දීමෙන් එහි මුල් අරමුණු සාක්ෂාත් කර ගැනීමේ බලපෑම තක්සේරු කිරීමයි.

විශේෂිත අරමුණු වන්නේ,

- සුළු වාරිමාර්ග පුනරුත්ථාපන (MIR) කොන්ත්‍රාත් සම්බන්ධයෙන් ගොවි සංවිධානවල ආයතනික ශක්තිය, හැකියාවන් සහ දුර්වලතා තක්සේරු කිරීම

- ප්‍රතිසංස්කරණ කාර්යයේ සමස්ත ගුණාත්මකභාවය, ගොවීන්ගේ අවශ්‍යතා සපුරාලීම සහ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියට ගොවීන්ගේ සහභාගීත්වය තක්සේරු කිරීම

- වාරි යෝජනා ක්‍රම පුනරුත්ථාපනය කිරීමෙන් ගොවීන්ගේ ජීවනෝපාය හා ගොවි සංවිධානයන්හි හැකියාවන් වර්ධනය කිරීමේ බලපෑම් තක්සේරු කිරීම.

- වාරිමාර්ග ප්‍රතිසංස්කරණ පුනරුත්ථාපන කටයුතු තමන් විසින්ම පාලනය කිරීම තුළින් ගොවි සංවිධානය (ගොවීන්) සතු අයිතිය, වගකීම සහ වගවීම පිළිබඳ හැඟීමක් ඇති කිරීම තක්සේරු කිරීම

- වඩාත් තිරසාර හා ඵලදායී වාරිමාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ගොවි සංවිධාන වෙත කොන්ත්‍රාත් ලබා දීමේ ක්‍රියා පටිපාටිය සමාලෝචනය කිරීම

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කිරීමෙන් පසු, පසුගිය වසර පහ තුළ (2015-2019) දිස්ත්‍රික්ක පහක (කුරුණෑගල, අනුරාධපුර, නුවරඑළිය, බදුල්ල සහ වවුනියාව) ක්‍රියාත්මක වූ, අඟඹු ලෙස තෝරාගත් වාරිමාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති 40 ක් ක්ෂේත්‍ර සමීක්ෂණය සඳහා තෝරා ගන්නා ලදී.

සොයා ගැනීම්

- ප්‍රතිලාභීන්ගේ අපේක්ෂාවන් විවිධ මට්ටම්වල පැවතුණ ද ගොවි සංවිධාන විසින් සිදු කරන ලද බොහෝ පුනරුත්ථාපන කොන්ත්‍රාත්තු සාර්ථක වී ඇත.
- සක්‍රීය නිලධාරී මණ්ඩලය සහිතව හොඳින් කටයුතු කළ ගොවි සංවිධාන පුනරුත්ථාපන කටයුතු සඳහා වෙන් කළ මුදලින් උපරිම ප්‍රතිලාභ ලබා ඇත.
- පුනරුත්ථාපන කටයුතු තමන්ගේම ගොවි සංවිධානය මඟින් හෝ අසල්වැසි ගොවි සංවිධානයක් විසින් සිදු කළ විට බාහිර කොන්ත්‍රාත්කරුවෙකුට වඩා ගොවීන්ට වැඩි ප්‍රතිලාභයක් ලැබී ඇත.

නිර්දේශ

- ප්‍රදේශයේ කෘෂිකාර්මික නිලධාරීන් විසින් ගොවි සංවිධානයේ ධාරිතාව (මානව/භෞතික) සලකා බැලීමෙන් සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු පසු ගොවි සංවිධානය වෙත පැවරිය යුතුය.
- ප්‍රතිසංස්කරණ කටයුතු භාර ගැනීමට අදාළ ගොවි සංවිධානයට හැකියාවක් නොමැති අවස්ථාවක, ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්තුව සඳහා වෙනත් ආයතන ගොවි සංවිධානයක් සලකා බැලීම වඩාත් සුදුසු ය.

4. ශ්‍රී ලංකාවේ ජාතික වශයෙන් වැදගත් වන කෘෂිකාර්මික උරුම පද්ධති ; හඳුනා ගැනීම, යෝග්‍යතාවය සහ සංරක්ෂණය

පර්යේෂණ කණ්ඩායම : ජේ.ඒ.යූ.පී ජයසිංහ සම්බන්ධීකාරක
ආර්.එම්.එම්.එච්.කේ රම්බොඩගෙදර සම පර්යේෂිකා
ආර්.ඩී විජේසිංහ සම පර්යේෂිකා

මූල්‍ය ප්‍රභවය : ඒකාබද්ධ අරමුදල

විෂයපථය සහ අරමුණු :

"ජාතික වශයෙන් වැදගත් කෘෂිකාර්මික උරුම පද්ධති (Nationally Important Agriculture Heritage Systems - NIAHS)" යන සංකල්පය 2019 වසරේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් යෝජනා කරන ලද නව සංකල්පයකි. එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ "ගෝලීය වශයෙන් වැදගත් කෘෂිකාර්මික උරුමයන්" යන සංකල්පය පදනම් කරගෙන මෙම සංකල්පය ආරම්භ කරන ලදී. කාලයත් සමඟ විවිධ පාරිසරික, දේශගුණික, සමාජ හා ආර්ථික විචලනයන්ට සාර්ථකව අනුවර්තනය වීමෙන් පරම්පරාවෙන් පරම්පරාවට උරුම වූ පොහොසත්, තිරසාර, දේශීය හා විචක්ෂණ කෘෂිකාර්මික දැනුම් පද්ධති ලෙස ශ්‍රී ලංකාවේ "ජාතික වශයෙන් වැදගත් කෘෂිකාර්මික උරුම පද්ධති (NIAHS)" හැඳින්විය හැකිය. දේශගුණික, සංස්කෘතික හා සමාජ-ආර්ථික කැලඹීම් නොතකා ආහාර හා ජීවනෝපාය සුරක්ෂිතතාව සහතික කිරීමට මෙම පද්ධතිවලට හැකියාව තිබූ හෙයින්, විද්‍යාඥයන් යෝජනා කරන්නේ මෙම පද්ධති තුළ කාවැදී ඇති දැනුමට වර්තමානයේ පවතින දේශගුණික විපර්යාස, බලශක්ති සහ ආර්ථික අර්බුද වැනි අනපේක්ෂිත වෙනස්කම්වලට ඔරොත්තු දීම සඳහා නව කෘෂිකාර්මික ආකෘති සකස් කිරීමට ශක්තිමත් පදනමක් සැපයීමේ හැකියාව ඇති බවයි.

කෙසේ වෙතත්, වාණිජමය සූක්ෂම කෘෂිකර්මාන්තයේ ශීඝ්‍ර පරිණාමයත් සමඟ මෙම පද්ධති ඒවායේ විද්‍යාත්මක පදනම සහ තිරසාර නවීන කෘෂිකාර්මික ක්‍රම දියුණු කිරීම සඳහා වාසිදායක පදනමක් ලෙස භාවිතා කිරීමේ හැකියාව හඳුනා නොගෙනම විනාශ වෙමින් පවතී. මෙම පද්ධති නිර්වචනය කිරීම, හඳුනා ගැනීම, එකතු කිරීම සහ සංරක්ෂණය කිරීම සඳහා දැනට ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්තියක් සහ යාන්ත්‍රණයක් නොමැත. මෙම ගැටලුවේ කාලෝචිත වැදගත්කම හඳුනා ගනිමින් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයෙන් ඉල්ලා සිටියේ ශ්‍රී ලංකාවේ ග්‍රාමීය කෘෂිකර්මාන්තයේ තිරසාරභාවය කෙරෙහි කෘෂිකාර්මික උරුමයන් ඇති කරන බලපෑම අධ්‍යයනය කරන ලෙසයි. එබැවින් මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ ජාතික වශයෙන් වැදගත් කෘෂිකාර්මික උරුම පද්ධති හඳුනා ගැනීම, ඒවායේ අදාළත්වය සහ සංරක්ෂණය පිළිබඳව සොයා බැලීමයි.

අරමුණු

මෙම අධ්‍යයනයේ සමස්ත පරමාර්ථය වන්නේ ජාතික වශයෙන් වැදගත් වන ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික උරුම පද්ධති හඳුනා ගැනීම සහ නවීන කෘෂිකාර්මික ක්‍රම වැඩිදියුණු කිරීම සඳහා ඒවායේ ඇති අදාළභාවය හඳුනා ගැනීම සහ ඒවා සංරක්ෂා කිරීමට ක්‍රම යෝජනා කිරීම ය.

විශේෂිත අරමුණු වන්නේ,

- ජාතික වශයෙන් වැදගත් කෘෂිකාර්මික උරුමයන් හඳුනා ගැනීම සඳහා සුදුසු තෝරා ගැනීමේ නිර්ණායකයක් උපයෝගී කරගනිමින් වර්ගීකරණ ක්‍රමයක් සකස් කිරීම.
- ජාතික වශයෙන් වැදගත් කෘෂිකාර්මික උරුමයන් හඳුනා ගැනීම, එකතු කිරීම සහ ගබඩා කිරීම සඳහා පද්ධතියක් සකස් කිරීම.
- නූතන කෘෂිකාර්මික පද්ධතිවල ඵලදායිතාව, ඔරොත්තු දීමේ හැකියාව සහ තිරසාරභාවය වැඩි දියුණු කිරීම සඳහා ජාතික වශයෙන් වැදගත් කෘෂිකාර්මික උරුම පද්ධතිවල අදාළ බව හඳුනා ගැනීම.
- ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික උරුමයන් ආරක්ෂා කිරීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා ප්‍රතිපත්තිමය මහ පෙන්වීමක් ලබා දීම

වර්තමාන ප්‍රගතිය

මේ සම්බන්ධයෙන් ලියවුණු සාහිත්‍යය හොඳින් විශ්ලේෂණය කිරීමෙන් පසුව ජාතික වශයෙන් වැදගත් කෘෂිකාර්මික උරුමයන් විශ්ලේෂණය කිරීම සඳහා සමාජ-පාරිසරික පද්ධති ආකෘතියක් තෝරා ගන්නා ලදී. පද්ධති සංරචක සංකීර්ණ අනුවර්තී පද්ධති ආකෘතියේ මූලධර්මයන් විශ්ලේෂණය කිරීම සහ තෝරාගත් රාමුව මත පදනම්ව විෂය විශේෂඥයින් සමඟ සාකච්ඡා පැවැත්වීම තෝරා ගෙන තිබේ.

5. වියළි කලාපයේ සුළු පරිමාණ වී වගා අංශය තුළ ඉඩම් ඒකාබද්ධ කිරීම: ගොවි ප්‍රජාවගේ දැක්ම සහ එකඟත්වය

පර්යේෂණ කණ්ඩායම :	ආර්.එම්.එම්.එච්.කේ රම්බොඩගෙදර	සම්බන්ධීකාරක
	ජේ.ඒ.යූ.පී ජයසිංහ	සම පර්යේෂිකා
	අයි.පී.පී.එම් විජේසිංහ	සම පර්යේෂක

මූල්‍ය ප්‍රභවය : ඒකාබද්ධ අරමුදල

විෂයපථය සහ අරමුණු :

වර්තමාන ශ්‍රී ලංකාව තුළ කෘෂිකාර්මික ඉඩම් පරිහරණය සම්බන්ධයෙන් විශේෂයෙන් ම සුළු පරිමාණ වී වගා ක්ෂේත්‍රය සම්බන්ධයෙන් විවිධ ගැටලුකාරී තත්ත්වයන් පවතී. එබැවින් කාර්යක්ෂම හා තිරසාර ඉඩම් පරිහරණ භාවිතාවක් සඳහා වඩා යෝග්‍ය ප්‍රතිපත්තිමය පියවරයන් සකස් කිරීමේ අවශ්‍යතාවය දැඩිව මතු වී තිබේ. මේ පිළිබඳ සලකා බැලීමේ දී ඉඩම් ඒකාබද්ධකරණය කෘෂිකාර්මික ඉඩම් ආර්ථික වශයෙන් ඵලදායී බවට පත් කිරීම සඳහා වඩා උචිත එළඹුමක් ලෙස හඳුනාගත හැකිය. එමෙන් ම, එය කෘෂිකාර්මික ඉඩම් සම්පත් කළමනාකරණය සම්බන්ධව පවතින බාධාකාරී තත්ත්වයන් අවම කිරීමෙහි ලා වඩා යෝග්‍ය උපාය මාර්ගයක් ලෙස පිළිගැනීමට ලක්ව ඇත. ඉඩම් ඒකාබද්ධකරණයේ ඇති මෙම සාධනීය තත්ත්වයන් හේතුකරගෙන එය ක්‍රියාත්මක කිරීමේ විභවතාවය දීර්ඝ කාලයක් තිස්සේ ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්තිමය කතිකාවත්වල සලකා බලනු ලැබූ වැදගත් කරුණක් විය.

එහෙත්, එවැනි වැඩසටහන් සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය ලබාගැනීම අත්‍යාවශ්‍ය කරුණක් වේ. ඒ අනුව ඉඩම් ඒකාබද්ධකරණය ක්‍රියාත්මක කිරීමේ දී ඒ සඳහා ගොවින් ඒ පිළිබඳ දක්වන දැක්ම සහ එකඟත්වය හඳුනාගැනීම, ඒ සම්බන්ධ වැඩසටහන් සැලසුම් කිරීමට මෙන්ම ක්‍රියාවට නැංවීමෙහි ලා වඩා යෝග්‍ය පදනමක් සකස් කරනු ඇත. එමෙන්ම බිම් මට්ටමේ දී ඇතිවිය හැකි ගැටලුකාරී තත්ත්වයන් අවම කරගැනීමට ද එය ඉවහල්වනු ඇත. ඒ අනුව මෙම අධ්‍යයනය සැලසුම් කරන ලද්දේ වඩා පුළුල් කෘෂිකාර්මික සහ ග්‍රාමීය සංවර්ධන ඉලක්ක සපුරාගැනීමේ උචිත එළඹුමක් ලෙස ඉඩම් ඒකාබද්ධකරණය පිළිබඳ වියළි කලාපයේ සුළු පරිමාණ වී ගොවිතැනෙහි නිරතවන ගොවීන්ගේ දැක්ම නැතහොත් සංජානනය මෙන්ම ඒ පිළිබඳ ඔවුන්ගේ එකඟත්වය හෝ අකමැත්ත කෙරෙහි බලපා ඇති සාධක හඳුනා ගැනීමටය.

විශේෂිත අරමුණු

1 ශ්‍රී ලංකාවේ ඉඩම් සම්බන්ධ ප්‍රතිපත්තීන් කොතරම් දුරට ඉඩම් ඒකාබද්ධකරණය සඳහා යෝග්‍ය ද යන්න සහ වියළි කළාපයේ වී වගාවේ යෙදෙන සුළු පරිමාණ ගොවියන් අතර ඉඩම් ඒකාබද්ධකරණය ක්‍රියාත්මක කළහැකි සුදුසු තත්ත්වයන් හඳුනාගැනීම

2 ඉඩම් ඒකාබද්ධකරණය පිළිබඳ වියළි කලාපයේ සුළු පරිමාණව වී ගොවිතැනෙහි යෙදෙන ගොවීන්ගේ දැක්ම සහ එකඟත්වය හඳුනා ගැනීම;

3 ඉඩම් ඒකාබද්ධකරණ ක්‍රියාවලියට සුළුපරිමාණ වී ගොවීන්ගේ ඇති එකඟත්වය අකමැත්ත කෙරෙහි බලපා ඇති සාධක හඳුනාගැනීම;

4 ඉඩම් ඒකාබද්ධකරණය හඳුනාගත් සුදුසු තත්ත්වයන් යටතේ ක්‍රියාත්මක කිරීම උදෙසා සුළුපරිමාණ වී ගොවි ප්‍රජාවගේ එකඟතාවය සහ සහයෝගීත්වය ඉහළ නංවා ගැනීමට සුදුසු උපායමාර්ගයන් හඳුනා ගැනීම

වත්මන් ප්‍රගතිය

- පර්යේෂණ යෝජනාවලිය සකසා නිම කරන ලද අතර එය ආයතනයේ අධ්‍යයන කවයට සහ පර්යේෂණ සහ පුහුණු කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී. ගුණාත්මක හා ප්‍රමාණාත්මක දත්ත එකතු කිරීම සඳහා අදාළ විචල්‍යයන් හඳුනාගෙන ඇත. අධ්‍යයනයට අදාළ ද්විතියික දත්ත රැස් කිරීම සිදු කරමින් පවතී.

6. තෝරාගත් එළවළු බෝගවල ගොවිපළ සිට බත්පත තෙක් නිෂ්පාදන සහ අලෙවිකරණ කාර්ය සාධනය

පර්යේෂණ කණ්ඩායම	ජී.ජී.ද.එල්.ඩබ්.සමරසිංහ	සම්බන්ධීකාරක
	එම්.ටී පද්මජානි	සම පර්යේෂක
	ඩබ්.එච්.ඒ ශාන්ත	සම පර්යේෂක
	එම්.ඒ.සී.එස් බණ්ඩාර	සම පර්යේෂක

මූල්‍ය ප්‍රභවය ඒකාබද්ධ අරමුදල

විෂයපථය සහ අරමුණු

එළවළු වගාව ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික නිෂ්පාදනයේ වැදගත්ම කොටසකි. එළවළු නිෂ්පාදන උප අංශයේ කාර්යක්ෂම හා තිරසාර ක්‍රියාකාරිත්වය රජයේ කෘෂිකාර්මික ප්‍රතිපත්තියේ අවධානයට ලක්විය යුතු කරුණක් වන්නේ එළවළු නිෂ්පාදන උප අංශයේ සැලකිය යුතු ගොවි පවුල් සංඛ්‍යාවක් සිටින බැවින් සහ සමස්ත රටේම ජනතාවගේ ආහාර හා පෝෂක ආරක්ෂාව සහතික කරන පාරිභෝගික භාණ්ඩයක් වීම නිසයි. කෙසේ වෙතත්, ප්‍රධාන වශයෙන් ම උච්චාවචනය වන ගොවිපළ සහ සිල්ලර මිල තුළින් පිළිබිඹු වන එළවළු නිෂ්පාදන හා අලෙවි කිරීමේ පද්ධතිවල ගැටලු රාශියක් ඇති බව පෙන්වීමට ප්‍රමාණවත් තරම් සාක්ෂි තිබේ.

පාරිභෝගිකයින්ට සාධාරණ මිලක් ලැබෙන අතරේ ගොවීන්ට ඉහළ ලාභයක් ලැබීමටත්, ජාතික ආහාර සුරක්ෂිතතාව සහතික කිරීමටත් අවශ්‍ය නම්, ආහාර දාම ක්‍රමානුකූලව ශක්තිමත්, කාර්යක්ෂම, සෞඛ්‍ය සම්පන්න සහ ගතික ලෙස සකස් කළ යුතුව තිබුණි.

නිෂ්පාදකයන්ට මෙන්ම පාරිභෝගිකයින්ට ද ජයග්‍රාහී වාතාවරණයක් ලබා ගැනීම සඳහා අගය දාමයන්, එහි ක්‍රියාකාරිකයින් සහ ඇඟවීම් අවබෝධ කර ගැනීම ඉතා වැදගත් ය.

කෙසේ වෙතත්, දාමයේ සියලුම ක්‍රියාකාරිකයින් සැලකිල්ලට ගනිමින් නිසි එළවළු අගය දාම විශ්ලේෂණ පිළිබඳ අධ්‍යයනයන් විද්‍යාත්මක සාහිත්‍යයේ හිඟය. එම නිසා, කාර්යක්ෂම නිෂ්පාදන ප්‍රවාහයක් ඇති කිරීම සඳහා යෙදවුම් සැපයුම්කරුගේ සිට අවසාන පාරිභෝගිකයා දක්වා වූ අගය දාමයේ සෑම පියවරකදීම ගැටලු, ප්‍රගතිය වළක්වන දුර්වලතා සහ ශක්‍යතා හඳුනා ගැනීම සඳහා සවිස්තරාත්මක අගයදාම විශ්ලේෂණයක් සිදු කිරීම ඉතා වැදගත් වේ.

ප්‍රධාන අරමුණ

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වනුයේ රට තුළ දැනට පවතින ප්‍රධාන විදේශීය එළවළු වටිනාකම් දාමයන්හි සියලුම පාර්ශ්වකරුවන්ගේ ක්‍රියාකාරිත්වයේ සමස්ත තත්ත්වය පරීක්ෂා කිරීමයි.

විශේෂිත අරමුණු

1. තෝරාගත් විදේශීය එළවළුවල පවතින අගය දාමයන් හඳුනා ගැනීම
2. තෝරාගත් විදේශීය එළවළු වල පවතින වටිනාකම් දාමයන් හඳුනා ගැනීම
3. දාමය දිගේ එක් එක් පියවර හා සම්බන්ධ මායිම් සහ ලාභ විශ්ලේෂණය කිරීම
4. එක් එක් එළවළු වටිනාකම් දාමයේ එක් එක් පාර්ශ්වකරුවන් මුහුණ දෙන බාධක හඳුනා ගැනීම සහ එළවළු අංශය දියුණු කිරීමේ ශක්‍යතා හඳුනා ගැනීම

වර්තමාන ප්‍රගතිය

අධ්‍යයන කවයේ දී ලැබුණු අදහස් ඇතුළත් කිරීමෙන් පර්යේෂණ කෙටුම්පත වැඩි දියුණු කරන ලදි. ද්විතීයික දත්ත සහ තොරතුරු ප්‍රධාන තොරතුරු සපයන්නන්ගේ සාකච්ඡා තුළින් සහ ප්‍රකාශයට පත් කළ මෙන්ම ප්‍රකාශයට පත් නොකළ සාහිත්‍යය තුළින් එකතු කරගන්නා ලදී.

බාහිර අරමුදල් මත සිදු කළ අධ්‍යයන (අවසන් කළ)

1. ශ්‍රී ලංකාවේ තෝරාගත් බෝග වගාවන් සඳහා ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රම භාවිතයෙහි ජල හා බලශක්ති පාදක ඇගයීම

පර්යේෂණ කණ්ඩායම	:	එම්.ඒ.සී.එස් බණ්ඩාර මහතා	සම්බන්ධීකාරක
		ඩබ්.එච්.ඒ ශාන්ත මහතා	සම පර්යේෂක
		එම්.ටී පද්මජානි මිය	සම පර්යේෂක
		ඩබ්.ඒ.එන් විජේසූරිය මහතා	සම පර්යේෂක
		ආර්.ඒ.සී.ජේ පෙරේරා මහතා	සම පර්යේෂක
මූල්‍ය ප්‍රභවය	:	ලෝක ආහාර වැඩසටහන	
කාල පරාසය	:	2019 සැප්තැම්බර් - 2020 ජනවාරි	

විෂයපථය සහ අරමුණු

ගොවීන් විසින් සාම්ප්‍රදායික ජල සම්පාදන ක්‍රම (පිටාර ජලසම්පාදනය, තීරු ජල සම්පාදනය වැනි ජල සම්පාදන ක්‍රම) විවිධ බෝග වගා පද්ධතීන් සඳහා මෙන් ම විවිධ භූගෝලීය ප්‍රදේශවල දී පුළුල් ලෙස භාවිතා කරනු ලැබේ. 1990 වර්ෂයේ ගොවිජන සංවර්ධන අධිකාරිය විසින් ජලය හා ශ්‍රමය කාර්යක්ෂමව භාවිතා කිරීමේ ක්‍රමයක් ලෙස ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රම (විසිරුම් හා බිංදු ජල සම්පාදන ක්‍රම) මූලින්ම හඳුන්වා දෙන ලදී. පසුව, මෙම තාක්ෂණය ජනප්‍රිය කිරීම සඳහා දක්ෂිණ සංවර්ධන අධිකාරිය, මහවැලි අධිකාරිය , ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) සහ ප්‍රාදේශීය රාජ්‍ය නොවන සංවිධාන ඇතුළු විවිධ සංවිධාන විසින් විවිධ මූලපිරීම් හඳුන්වා දී තිබේ.

ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රම හඳුන්වාදීම හා ප්‍රවර්ධනය කිරීම හරහා කෘෂිකර්ම අමාත්‍යාංශය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව වැනි රජයේ ආයතනවල බෝග විවිධාංගීකරණ උපාය මාර්ගවලට වඩාත් හොඳ පිටිවහලක් ලැබිණි. විවිධ බෝග සහ විවිධ භූගෝලීය ප්‍රදේශ සඳහා මෙම තාක්ෂණය භාවිතයේ දී සත්‍ය ජල හා බලශක්ති ඉතිරිකිරීම් විමර්ශනය කිරීම, විගණනය කිරීම හා ලේඛනගත කිරීම වඩාත් විධිමත්ව ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රම ප්‍රචලිත කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා ඉවහල් වේ.

පෞද්ගලික අංශයේ සමාගම් විශාල සංඛ්‍යාවක් සම්බන්ධ වීමෙන් වෙළෙඳපොළ පුළුල් වීමත් සමඟ විවිධ වගා පද්ධති සහ ප්‍රදේශ සඳහා වඩාත් සුදුසු ක්ෂුද්‍ර වාරිමාර්ග ඒකක හඳුන්වා දීමෙන් මෙම තාක්ෂණය ගොවීන් අතර ඉතා ජනප්‍රිය විය. රජය සහ පෞද්ගලික අංශයේ ආයතන විසින් ක්‍රියාත්මක කරන ලද සහනාධාර යෝජනා ක්‍රම ඔස්සේ රජය විසින් මෙම තාක්ෂණය අඛණ්ඩව ප්‍රවර්ධනය කරමින් සිටී. ක්ෂුද්‍ර වාරිමාර්ග පද්ධතිවලට සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන ජල පොම්ප එක් කිරීම වැනි දියුණු තාක්ෂණයන් හේතුවෙන් අඛණ්ඩ විදුලිබල සැපයුමක් නොතිබූ දුර බැහැර ප්‍රදේශවල ගොවීන්ට/කෘෂි ව්‍යවසායකයින්ට පවා මෙම ක්‍රම භාවිතා කිරීමට හැකියාව ලැබී තිබේ.

කෙසේ වෙතත්, මෙම පද්ධති ස්ථාපිත කිරීමය වැයවන ඉහළ ආරම්භක පිරිවැය සහ තාක්ෂණික හේතු නිසා බහුතරයක් ගොවීන්ට මෙම ප්‍රශස්ත තාක්ෂණය භාවිතා කිරීමට නොහැකි වී තිබේ. ජලය, ශ්‍රමය සහ බලශක්තිය (ඉන්ධන/විදුලිය) ඉතිරි කිරීම සහ සැලකිය යුතු ලෙස ඉහළ අස්වැන්නක් ලබා ගැනීමේ හැකියාව මෙම විශේෂ වාරිමාර්ග ක්‍රම පිළිබඳව සිදු කළ පර්යේෂණ අධ්‍යයනයන් තුළින් ඉස්මතු කර දැක්වුවද, එම අංශ වල සත්‍ය හා ප්‍රමාණාත්මක තොරතුරු විද්‍යාත්මක සාහිත්‍යයේ නොමැත. එම නිසා ක්ෂුද්‍ර වාරිමාර්ග පද්ධති වඩාත් ක්‍රමානුකූලව ජනප්‍රිය කිරීම හා තවදුරටත් ප්‍රවර්ධනය

කිරීම සඳහා විවිධ භෝග සහ විවිධ ප්‍රදේශ සඳහා මෙම තාක්ෂණයේ සත්‍ය ජල හා බලශක්ති ඉතිරිකිරීම් පිළිබඳව විමර්ශනය කිරීම, විගණනය කිරීම සහ ලේඛනගත කිරීම වැදගත් වේ.

එම සන්දර්භය තුළ මෙම අධ්‍යයනයෙ අරමුණු වන්නේ,

- විශේෂිත බෝග ප්‍රභේද සඳහා තෝරා ගත් ගොවි ප්‍රජාවන් විසින් යොදන විවිධ ජල සම්පාදන පද්ධති හඳුනා ගැනීම
- විවිධ ප්‍රදේශවල විවිධ ජල සම්පාදන ක්‍රම යටතේ තෝරාගත් බෝග වගා කිරීම සඳහා ගොවීන් භාවිතා කරන ජල පරිමාව සොයා බැලීම
- විවිධ ජලසම්පාදන ක්‍රම මඟින් තෝරා ගත් බෝගවලට ජලය සැපයීම සඳහා බලශක්ති පරිභෝජනයේ (මිනිස් ශ්‍රමය ඇතුළත්ව) ඇති වෙනස්කම් පරීක්ෂා කිරීම.

සොයාගැනීම් සහ නිර්දේශ

ජල සම්පාදන ක්‍රමයන්හි නියැළෙන ගොවීන් පවා (සාම්ප්‍රදායික වාරිමාර්ග ක්‍රම හෝ ක්ෂුද්‍ර ජලසම්පාදන ක්‍රම මඟින්) බෝගයේ වර්ධක අවධිය අනුව බෝගයේ දෛනික ජල අවශ්‍යතාවය, පොම්ප කිරීමේ උපකරණ ධාරිතාව සහ වැඩ කරන පැය ගණන (පොම්ප කරන උපකරණවල) නොදන්නා බව අධ්‍යයනයෙන් පැහැදිලි විය. එබැවින් ජලසම්පාදන පුරුදු පිළිබඳව ගොවීන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් පැවැත්වීම සහ දෛනික බෝග ජල අවශ්‍යතා සපුරාලීම අත්‍යවශ්‍ය අවශ්‍යතාවක් ලෙස නිර්දේශ කෙරේ.

ගොවීන්ගෙන් වැඩි දෙනෙක් පැය 1 - 1.5 kW/අතර පරාසයක විදුලි ජල මෝටර භාවිතා කරන අතර අනෙක් අය 1.5 - 3.3 HP බලයක් ඇති භූමිතෙල් ජල පොම්ප භාවිතා කරති. බොහෝ ගොවීන් පළමු භාවිතයේ සිට වසර 10 කටත් අඩු කලක් තුළ භාවිතා වන ජල පොම්ප භාවිතා කරන නමුත් නිතිපතා සේවා හා නඩත්තු කිරීමකින් නොමැති බැවින් දිගුකාලීන කාර්යක්ෂමතාව සහ අවම කල්පැවැත්ම කෙරෙහි අහිතකර ලෙස බලපා තිබේ.

එබැවින් ජල සම්පාදන මෙවලම් කාර්යක්ෂමව භාවිතා කිරීම සහ ජලසම්පාදනයෙහි වාසි ගැන ගොවීන් දැනුවත් කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම වැදගත් ය. විශේෂයෙන් ම දේශගුණික විපර්යාසයන්ට අනුගත වීමේ ක්‍රමයක් ලෙස ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රමයන්හි වැදගත්කම පිළිබඳ අවබෝධයක් ලබා දීම වැදගත් වේ.

අදාළ බෝග ප්‍රභේදවල ආයු කාලය හා සසඳන කල කෙටි කාලයක් තුළදී එම බෝගය සඳහා ආයෝජනය කළ මුදල ආපසු උපයා ගත හැකි බැවින් අධ්‍යයනය කරන ලද සියලුම භෝග සඳහා ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රම සඳහා ආයෝජනය කිරීම වටිනා බව මූල්‍ය විශ්ලේෂණයෙන් පෙන්වා දී තිබේ. එම නිසා බෝග අස්වැන්න, ජලය හා බලශක්ති ඉතිරිකිරීම් ඉහළ නැංවීමේ හොඳ තාක්ෂණයක් ලෙස සහ වෙනස් වන දේශගුණය හමුවේ දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව වැඩි කිරීමේ තාක්ෂණයක් ලෙස ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති ප්‍රවර්ධනය කිරීම නිර්දේශ කෙරේ.

2. වැඩි දියුණු කළ කෘෂිකාර්මික ව්‍යාප්ති සේවා අනුරාධපුර දිස්ත්‍රික්කයේ වී නිෂ්පාදනයට ඇති කරන බලපෑම පිළිබඳ සාක්ෂි ගොඩනැගීම

පර්යේෂණ කණ්ඩායම : ඩබ්.එච්.ඒ ශාන්ත මහතා සම්බන්ධීකාරක

එම්.ඒ.සී.එස් බණ්ඩාර මහතා සම පර්යේෂක

එම්.ටී පද්මජානි මහතා සම පර්යේෂිකා

ජී.ජී ද එල්.ඩබ් සමරසිංහ මිය සම පර්යේෂිකා

මූල්‍ය ප්‍රභවය : ආහාර හා කෘෂිකර්ම සංවිධානය

විෂයපථය සහ අරමුණු :

රටෙහි සහල් ස්වයංපෝෂිතභාවයට සහ ග්‍රාමීය දරිද්‍රතාවය අඩු කිරීමේ අරමුණුවල සාධනීය ප්‍රගතියට බාධාවක් නොවන පරිදි, වර්තමාන පොහොර සහනාධාර වැඩසටහන සංශෝධනය කිරීමේ තිරසාර මාර්ග හඳුනා ගැනීමට ශ්‍රී ලංකා රජය උත්සාහ කරමින් සිටියි.

කෘෂිකර්ම අමාත්‍යාංශයට විවිධ සහනාධාර ක්‍රමවල බලපෑම (පොහොර වශයෙන් හෝ මුදල් වශයෙන්) සහනාධාර ප්‍රමාණ සහ පොහොර සහනාධාරය සැලසුම් කිරීම වැඩි දියුණු කිරීම සඳහා ඉලක්ක නිර්ණායකයන් අවබෝධ කර ගැනීමට විශ්වාසදායක දත්ත සහ තොරතුරු අවශ්‍ය වේ. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී විස්තරාත්මක ආනුභවික දත්ත ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි

එපමණක් නොව, සහනාධාර වැඩසටහන වැඩි දියුණු කිරීමේ දී ද වර්තමාන සහනාධාර වැඩසටහන පිළිබඳව ගොවීන්ගේ රුචිකත්වයන් සහ අභියෝගයන් අවබෝධ කර ගැනීමට එය ප්‍රයෝජනවත් වේ.

අරමුණු

මෙම අධ්‍යයනයේ මූලික පරමාර්ථය වන්නේ වී නිෂ්පාදකයින් පිළිබඳව ගෘහස්ථ සමීක්ෂණයක් සිදු කිරීම සහ තිරසාර කෘෂිකාර්මික භාවිතාවන් භාවිතයට ගැනීම සහ එහි ක්‍රියාකාරිත්වය පිළිබඳ දත්ත විශ්ලේෂණය කිරීම යි.

මෙම සමීක්ෂණය පදනම් වී ඇත්තේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය සහ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය අතර සහයෝගීතාවය යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ආරම්භ කරන ලද 'සම්පත් සුරකිමින් වගා කිරීමේ ව්‍යාපෘතිය' මතය.

එම ව්‍යාපෘතිය යටතේ 2018 ඔක්තෝම්බර් සිට 2019 පෙබරවාරි දක්වා ගොවි සංවිධාන 110 වී ගොවීන් 1,100 දෙනෙකුගෙන් යුත් සමීක්ෂණයක් අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ සිදු කරන ලදී. මෙම දත්ත සැකසුම වත්මන් ව්‍යාපෘතිය සඳහා මූලික පදනම ලෙස ක්‍රියා කරයි.

විශේෂිත අරමුණු

- විවිධ කෘෂිකාර්මික පිළිවෙත්හි භාවිත ධාවකයන් සහ සුභසාධන ප්‍රතිඵල කෙරෙහි ඒවායේ බලපෑම තක්සේරු කිරීම

- විවිධ පොහොර සහනාධාර ක්‍රම මඟින් ගෘහස්ථ සුභසාධනය සහ ඵලදායිතාව කෙරෙහි ඇති කරන බලපෑම මෙන්ම ගොවීන්ගේ මනාපයන් විශ්ලේෂණය කිරීම.

විශේෂයෙන් වර්තමාන අධ්‍යයනය සැලසුම් කර ඇත්තේ 2019 ඔක්තෝම්බර් සිට 2020 පෙබරවාරි දක්වා කාලය තුළ සම්පත් සුරකිමින් වගා කිරීමේ සමීක්ෂණයේ දී සලකා බැලූ කුටුම්භ 1,100ක්ම ආවරණය වන පරිදි සමීක්ෂණයේ දෙවන වටයේ දත්ත එකතු කිරීමට වන අතර සහ ගෘහස්ථ සුභසාධනය සහ ඵලදායිතාව කෙරෙහි විවිධ පොහොර සහනාධාර ක්‍රමවල බලපෑම මෙන්ම ගොවීන්ගේ රුචිකත්වයන් විශ්ලේෂණය කිරීම සඳහා ය.

පොහොර සහනාධාර මනාපයන්ට අදාළ අතිරේක ප්‍රශ්න එකතු කරන අතරම මෙම සමීක්ෂණය මඟින් කලින් සිදු කළ සම්පත් සුරකිමින් වගා කිරීමේ සමීක්ෂණය පෙර සුරැකීමේ හා වගීයේ සමීක්ෂණය නැවත ප්‍රතිනිර්මාණය කරයි.

සමීක්ෂණයේ පළමු වටය සහ දෙවන වටය අතර කාලය තුළ රජය විසින් සහනාධාරය වෙනුවට මුදල් ලබා දීම අත්හදා බැලීය. ඒ නිසා සමීක්ෂණ දත්තවල දෙවන වටය සහනාධාර ක්‍රියාත්මක කිරීමේ ක්‍රම දෙකක් සැසඳීමට හැකියාව ලැබේ.

වත්මන් ප්‍රගතිය

COVID-19 ගෝලීය වසංගත තත්ත්වය හේතුවෙන් සැලසුම් කළ පරිදි සමීක්ෂණය කිරීමට නොහැකි විය. සමීක්ෂණය 2021 දී ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ.

අවසන් කළ පුහුණු වැඩසටහන්

1. 'RURALINVEST' පුහුණු වැඩසටහන

පුහුණු කණ්ඩායම	ඩබ්.එච්.ඒ ශාන්ත	සම්බන්ධීකරණ නිලධාරී
	එම්.ඒ.සී.එස් බණ්ඩාර	සම සම්බන්ධීකාරක
	ජී.ජී ද එල්.ඩබ් සමරසිංහ	සම සම්බන්ධීකාරක
	එම්.ටී පද්මජානි	සම සම්බන්ධීකාරක

මූල්‍ය ප්‍රභවය ආහාර හා කෘෂිකර්ම සංවිධානය

කාල වකවානුව ; 2020 පෙබරවාරි 09-13

විෂයපථය සහ අරමුණු

එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ශ්‍රී ලංකා කාර්යාලය සහ එහි ආයෝජන මධ්‍යස්ථාන අංශය සමඟ සහයෝගයෙන් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් RURALINVEST පුහුණු වැඩසටහනක් සාර්ථකව සංවිධානය කරන ලදී.

RURALINVEST යනු තිරසාර කෘෂිකාර්මික හා ග්‍රාමීය ආයෝජන ව්‍යාපෘති සහ ව්‍යාපාර සැලසුම් සකස් කිරීම හා ඇගයීම සඳහා උපයෝගී කර ගැනෙන බහුභාෂා ක්‍රමවේදයක් සහිත මෙවලම් කට්ටලයකි.

මෙම වැඩමුළුවේ පරමාර්ථය වූයේ කුඩා ග්‍රාමීය ආයෝජන සඳහා කෘෂිකාර්මික ව්‍යාපාර/ ව්‍යාපෘති සැලසුම් සකස් කිරීමට සහ ජාතික මට්ටමින් RURALINVEST ආයතනිකකරණයට සහාය වීමට මෙන් ම ආයෝජකයින්ට / ආයෝජක කණ්ඩායම්වලට උපකාර කිරීම සඳහා අදාළ වන RURALINVEST වෘත්තිකයින් ප්‍රජාවක් රට තුළ නිර්මාණය කිරීමයි.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, පෞද්ගලික අංශයේ සමාගම් සහ විවිධ සංවිධානවල සහභාගීවන්නන් හැට දෙනෙකු සමඟින් වැඩසටහන සාර්ථකව පැවැත්විණි.

04

අලෙවි ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය

අවසන් නොකළ අධ්‍යයන

1. ශ්‍රී ලංකාවේ එළවළු නිෂ්පාදකයන්ගේ තීරණ ගැනීම සඳහා බලපාන සාධක

පර්යේෂණ කණ්ඩායම :	අයි.පී.පී.එම් විජේසිංහ	- සම්බන්ධීකරණ නිලධාරී
	ඩබ්.ඒ.ආර් වික්‍රමසිංහ	- සම පර්යේෂක
	ආචාර්ය ඊ. එම්. සී. ප්‍රියංකර	- සම පර්යේෂක
	අයි.වී කුරුප්පු	- සම පර්යේෂක
මූල්‍ය ප්‍රභවය :	ඒකාබද්ධ අරමුදල	

විෂයපථය සහ අරමුණු

ශ්‍රී ලංකාවේ එළවළු නිෂ්පාදනයේ පවතින අස්ථායීභාවය නිසා එළවළු මිල උච්චාවචනය වීම සිදු වෙන අතර එළවළුවලට පවතින ඉල්ලුම නොවෙනස්ව පවතී. ගොවීන්ගේ බෝග තෝරා ගැනීම සඳහා වන තීරණ එළවළු සැපයුම සඳහා ඍජුවම බලපානු ලබයි. ආර්ථිකමය වශයෙන් යෝග්‍ය තීරණ ගැනීමේ දී තොරතුරු ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. කෙසේ නමුත් ශ්‍රී ලංකාවේ එළවළු නිෂ්පාදන අංශයේ පවතින යථාර්ථය වන්නේ ගොවීන් කුමක් වගා කරන්නේ ද, කොපමණ ප්‍රමාණයක් කුමන කාලයේ දී වගා කරන්නේ ද යන්න පිළිබඳ නොදැනුවත් වීමයි. තොරතුරුවල අසමමිතිකභාවය මෙම ගැටලුවේ මූලය විය හැක. මෙවැනි පසු බිමක් තුළ මෙම අධ්‍යයනය මගින් සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂිත අරමුණු ලෙස,

I. ශ්‍රී ලංකාවේ එළවළු නිෂ්පාදකයන්ගේ තීරණ ගැනීම සඳහා ඉවහල් වන දැනට පවතින තොරතුරු හුවමාරු කරන මෙවලම්/යෙදවුම්/පද්ධතිවල ඵලදායීභාවය පරීක්ෂා කිරීම
II. එළවළු නිෂ්පාදන අංශයේ ගොවීන්ගේ තීරණ ගැනීමේ ක්‍රියාවලියට බලපාන සාධක පිළිබඳ අධ්‍යනය කිරීම
III. එළවළු නිෂ්පාදන අංශයේ පවතින තොරතුරු අසමමිතිකභාවය අඩු කිරීම සඳහා අවශ්‍ය උපාය මාර්ග යෝජනා කිරීම දැක් විය හැකිය.

ප්‍රධාන සොයා ගැනීම්

2019 වසර වන විට ශ්‍රී ලංකාවේ කෘෂි තොරතුරු හුවමාරු වන මෙවලම්/යෙදවුම්/පද්ධති 11ක් තිබුණ ද ඒවා පිළිබඳ අඩු දැනුවත්භාවයක් හා අඩු භාවිතයක් දැකිය හැකිය. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් ක්‍රියාත්මක "1920 ගොවි උපකාරක සේවාව" ගොවීන්ගෙන් 33%ක් ද, 12%ක් හෙක්ටර් කොඩ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයෙන් ක්‍රියාත්මක "6666 මිල තොරතුරු බෙදා හරින සේවාව" පිළිබඳව දැනුවත්ව සිටින ලදි. "ගොවි මිතුරු ඇප්", "කෘෂි එෆ් එම් වෙබ් රේඩියෝ" සහ "ගොවිපළ ඇප්" පිළිබඳව 3% ක් 4% පමණ ප්‍රමාණයක් දැනුවත් වූ අතර අනෙකුත් කිසිම යෙදවුමක දැනුවත් මට්ටම 1% ක ඉක්ම වූයේ නැත.

බොහොමයක් එළවළු ගොවීන්ට (65%) මෙම තොරතුරු හුවමාරු වන මූලාශ්‍රවලට ප්‍රවේශ වීමට අඩු විභවතාවයක් පවතින අතර එයට හේතුව වන්නේ ඔවුන්ට සාමාන්‍ය ජංගම දුරකථන (ස්මාට් නොවන) හා ස්ථාවර දුරකථන පැවතීමයි.

එළවළු වගාකරුවන් දැනට තොරතුරු ලබා ගැනීමට විවිධ මූලාශ්‍ර භාවිතා කරනු ලබන අතර ඒවා නම් ව්‍යාප්ති සේවාව (1/3ක් පමණ), කෘෂි රසායන අලෙවි මධ්‍යස්ථාන (20%), අසල්වාසී ගොවීන් මගින් (25%) ආදිය වේ.

නිෂ්පාදන පිරිවැය උඩරට එළවළු අක්කරයක වගා කිරීමට රු. 88,000 සිට රු. 185,000 දක්වාත් පහතරට එළවළු සඳහා රු. 23,000 සිට රු. 223,000 දක්වාත් විචලනය වේ. එළවළු නිෂ්පාදකයන්ගෙන් 48%ක් පමණ ලාභදායී ප්‍රතිලාභ ලබා ගෙන ඇත. අනෙක් අතට එළවළු නිෂ්පාදකයන්ගෙන් 86% කට පමණක් ලැබූ ආදායමෙන් තම මූල්‍ය පිරිවැය ආවරණය කර ගත හැකි වෙද්දී 14%කට තම මූල්‍ය පිරිවැයවත් ආවරණය කරගැනීමට නොහැකි විය.

උඩරට හා පහතරට එළවළු සඳහා ඇස්තමේන්තු කරන ලද මල්ටිනොමියල් ලොජිට් ප්‍රතිපායන ආකෘති (Multinomial Logit Models) ප්‍රතිඵල මගින් බෝග තෝරා ගැනීමේ දී සලකා බලන සාධක දැක්වේ. වගා කරන බිම් ප්‍රමාණය බෝංචි, රතුඅල, ගෝවා, මාළුම්රිස්, කැරට්, නෝකෝල්, ලික්ස්, පතෝල, පිපිඤ්ඤා, බණ්ඩක්කා, වැටකොළු, මෑ, තක්කාලී සහ එළබටු යන බෝග තෝරා ගැනීමේ සාධකයක් වේ. රතුඅල, ගෝවා, මාළුම්රිස්, නෝකෝල්, ලික්ස් සහ දඹුල හා තුඹ වගා කරුවන් හැර අනෙකුත් පහතරට එළවළු වගාකරුවන් අනාගත කාලගුණික දත්ත දැනගැනීමට රුචිකත්වයක් දක්වනු ලබයි. නව වෙළඳපොළ අවස්ථා හා ව්‍යවසායකත්ව තොරතුරු දැන ගැනීමට සියලුම එළවළු නිෂ්පාදකයන් රුචිකත්වයක් දක්වනු ලබයි. බෝංචි, ගෝවා සහ ලික්ස් වගාවන් තෝරා ගැනීමේ දී අනෙකුත් පාර්ශ්වයන්ගේ බලපෑම ද හේතු වී ඇත.

පුරෝකථන වෙළඳපොළ මිල/අපේක්ෂිත මිල වට්ටක්කා, පතෝල, පිපිඤ්ඤා, බණ්ඩක්කා, වැටකොළු, මෑ සහ එළබටු නිෂ්පාදකයන් සලකා බලනු ලබයි. කරවිල, වැටකෙළු, මෑ සහ එළබටු වගා කරුවන් වෙළඳපොළ ඉල්ලුම බෝග තෝරා ගැනීමේ දී සලකා බලා ඇත. බෝංචි, රතුඅල, ගෝවා, මාළුම්රිස්, කැරට්, ලීක්ස් සහ දඹුල හා තුඹ වගාකරුවන් හැර සියලු පහතරට එළවළු වගාකරුවන් එම බෝගවල බීජවල සුලභතාවය බෝග තෝරා ගැනීමේ දී සලකා බලනු ලැබේ. වෙළඳපොළේ පොහොර පවතී ද නැද්ද යන්න රතුඅල, කැරට් හා රාබු වගා කරුවන් නොසලකා හරිනු ලැබුවත් කරවිල, බණ්ඩක්කා හා කැකිරි වගාකරුවන් සලකා බලනු ලබයි. නෝකෝල්, ලීක්ස් සහ රාබු වගාකරුවන් පළිබෝධනාශක පැවතීම බෝග තෝරා ගන්නා අවස්ථාවේ දී නොසලකා හරිනු ලැබුවත් කරවිල, මෑ හා තක්කාලී වගාකරුවන් සලකා බලනු ලබයි.

නිෂ්පාදන පිරිවැය පිළිබඳව බෝංචි, ගෝවා, මාළුම්රිස්, නෝකෝල්, ලීක්ස්, පතෝල, පිපිඤ්ඤා, වැටකොළු, කැකිරි හා තක්කාලි වගාකරුවන් සලකා බලනු ලබයි. විධිමත් ණය පහසුකම් ලබා ගැනීමේ හැකියාවට වඩා අවිධිමත් ණය පහසුකම් පැවතීම සියලු උඩරට එළවළු සහ කරවිල හා මෑ නිෂ්පාදකයන් ධෛර්යමත් කරනු ඇත. ජලය පැවතීම හා ලබා ගැනීමේ හැකියාව බෝංචි, රතුඅල, ගෝවා, මාළුම්රිස්, කැරට්, ලීක්ස්, වට්ටක්කා, පිපිඤ්ඤා, බණ්ඩක්කා, වම්බටු, වැටකොළු, මෑ, තක්කාලී හා එළබටු යන බෝග තෝරා ගැනීමේ සාධකයක් වී ඇත.

ශ්‍රම සුලභතාවය සියලු උඩරට එළවළු බෝග තෝරා ගැනීමේ දී හා වට්ටක්කා, බණ්ඩක්කා හා තක්කාලී වගාකරුවන්ගේ ප්‍රධාන සාධකයක් වේ. වගාවන් සඳහා තම අරමුදල් පැවතීම සියලු උඩරට එළවළු වගාකරුවන් හා වට්ටක්කා, පිපිඤ්ඤා, කරවිල, බණ්ඩක්කා, වම්බටු, වැටකොළු, කැකිරි, තුඹ හා එළබටු වගාකරුවන් එම බෝග තෝරා ගැනීමේ දී සලකා බලනු ලැබේ. ගිය කන්නයේ

වෙළඳපොළ මිල බෝංචි, රතුඅල, ගෝවා, කැරට්, ලීක්ස්, වට්ටක්කා, පිපිඤ්ඤා, බණ්ඩක්කා, වම්බටු, තක්කාලි හා එළබටු වගාවන් තෝරා ගැනීමේ දී සලකා බලා ඇත.

එමෙන් ම බෝගය අලෙවිකරගැනීමේ හැකියාව මත බෝංචි, රතුඅල, ගෝවා, කැරට්, ලීක්ස්, රාබු, වට්ටක්කා, පිපිඤ්ඤා, වම්බටු, මෑ, කැකිරි හා තක්කාලි තෝරා ගෙන ඇත. මාළුමිරිස්, කැරට්, ලීක්ස්, රාබු හා දඹල හැර අනෙකුත් සියලු එළවළු බෝග වගාකරුවන් බීජ සඳහා යන වියදම දැඩිව සලකා බලා ඇත. බෝගයේ අස්වැන්න රතුඅල, පතෝල, දඹල, කැකිරි හා තුඹ වගාකරුවන් හැර අනෙකුත් සියලු බෝග තෝරා ගැනීමේ දී වැදගත් සාධකයක් වී ඇත.

නිර්දේශ

ගොවින්ට තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු ලබාගැනීමට හැකි ක්‍රමවේදයන් පිළිබඳ ගොවින්ගේ දැනුවත්භාවය ඉහළ නැංවීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කිරීමට නිර්දේශ කරනු ලැබේ. අන්තර්ජාල පහසුකම් හා යෙදවුම් වෙත ප්‍රවේශ වීමේ පහළ හැකියාව නිසා විශේෂිත දුරකථන අංක හරහා ගොවීන්ට අවශ්‍ය තොරතුරු බෙදා හැරීමේ ක්‍රමවේද පුළුල් කිරීමට නිර්දේශ කෙරේ. තෙවන පාර්ශ්වයක් හරහා ඉහළ සිට පහළට තොරතුරු හුවමාරු වන පද්ධතින්වල ඵලදායිතාවය වඩා වැඩි වන නිසා තීරණ ගැනීම සඳහා අවශ්‍ය යාවත්කාලීන තොරතුරු ව්‍යාප්ති නිලධාරීන් හරහා ගොවින්ට ලබා ගත හැකි ක්‍රමවේදයක් සැකසීමට නිර්දේශ කරයි.

එළවළු නිෂ්පාදකයන්ගෙන් 52%කට පිරිවැයට සරිලන ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි වීම නිසා නිෂ්පාදන පිරිවැය අඩු කිරීමට ආනයනික එළවළු බීජ සඳහා බදු සහන බීජවල මිල අඩු කිරීමේ එකඟතාවය මත ලබා දීම හා පොහොර සහනාධාරයක් එළවළු ගොවීන්ට ද ලබා දීමට නිර්දේශ කරනු ලැබේ. දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය තොරතුරු හුවමාරු වන ප්‍රධාන මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා වෙළඳපොළ තොරතුරු බෙදාහරින මධ්‍යස්ථානයක් දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය කේන්ද්‍රගතව ස්ථාපනය කිරීමට නිර්දේශ කරනු ලැබේ.

එළවළු වෙළඳපොළ මිල උච්චාවචනය පාලනය කිරීමට ඉල්ලුමට සරිලන සැපයුමක් ලබා දීම සිදු කළ යුතු අතර ඒ සඳහා කලාප මට්ටමෙන් නිෂ්පාදන සැලැස්මක් සැකසීමට හා ක්‍රියාත්මක කිරීමට නිර්දේශ කරනු ලැබේ. සාමූහික අලෙවිකරණ උපාය මාර්ගයක් භාවිතා කිරීම තුළින් ගොවිපළේ අලෙවි කරන මිල ස්ථාවර මට්ටමක පවත්වා ගත හැකි අතර ඒ සඳහා ගොවීන් අභිප්‍රේරණය කිරීමට ක්‍රමවේදයක් සැකසීමට යෝජනා කෙරේ. සියලු ආර්ථික මධ්‍යස්ථාන කෘෂිකර්ම අමාත්‍යාංශය යටතට පවරා ගැනීමත් ඒවායෙන් අය කරන කොමිස් මුදල අඩු කිරීමටත් යෝජනා කෙරේ. බෝගයේ අස්වැන්න බෝගයක් තෝරා ගැනීමේ ප්‍රධාන නිර්ණායකයක් වීම නිසා බීජ ඇසුරුමේ අස්වැන්න පිළිබඳ තොරතුරු ඇතුළත් කිරීමට නිර්දේශ කරනු ලැබේ. එමෙන්ම එක් එක් බෝගවලට හැදෙන ලෙඩ රෝග පිළිබඳ තොරතුරු බීජ මිල දී ගන්නා අවස්ථාවේ දී ගොවියාට දැන ගැනීමට සැලැස්වීමට කටයුතු කිරීමට යෝජනා කෙරේ.

නිෂ්පාදන තීරණ ගැනීමේ දී මිල තොරතුරු 80%ක් භාවිතා කිරීම නිසා ජනමාධ්‍ය හරහා පුරෝකථන මිලක් මෙන්ම නිෂ්පාදන පිරිවැය සම්බන්ධ තොරතුරු ප්‍රචලිත කිරීමට යෝජනා කෙරේ. ගොවීන් බෝග වගා කරන බිම් ප්‍රමාණය සම්බන්ධ දත්ත, කාලගුණික දත්ත, පුරෝකථන මිල සම්බන්ධ දත්ත ලබා ගැනීමට රුචිකත්වයක් දැක්වීම නිසා පුද්ගලික අංශයේ මෙන්ම රාජ්‍ය අංශයේ බීජ අලෙවි කිරීමේ මධ්‍යස්ථාන සම්බන්ධීකරණ කරමින් දත්ත එක් රැස් කරන හා බෙදාහැරීමේ පද්ධතියක් සංවර්ධනය කිරීමට යෝජනා කරන අතර එමගින් බීජ මිල දී ගැනීමට පෙර එම තොරතුරු දැනගැනීමට හැකියාව ද පැවතිය යුතු වේ.

2. ශ්‍රී ලංකාවේ වී/සහල් අගයදාමය පිළිබඳ විශ්ලේෂණය : පොළොන්නරුව දිස්ත්‍රික්කය

පර්යේෂණ කණ්ඩායම : ඩබ්ලිව්.ඒ.එන්. විජේසූරිය - සම්බන්ධීකාරක
ඩබ්.එච්.ඩී. ප්‍රියදර්ශන - සම පර්යේෂක
අයි.වී කුරුප්පු - සම පර්යේෂක

මූල්‍ය ප්‍රභවය : ඒකාබද්ධ අරමුදල

වී/ සහල් කර්මාන්තය මෙරට ආහාර සුරක්ෂිතතාවය සඳහා මෙන්ම ආර්ථික සංවර්ධනයෙහි ද ලා ඉතාමත් වැදගත් වන අතර වර්තමාන රජය වී භෝගය ග්‍රාමීය ජනතාවගේ අභිමානයේ සංකේතය **(Symbol of their Dignity)** ලෙස සලකනු ලබයි. මෙරට වී වගාවෙහි නිරත ගොවීන් සංඛ්‍යාව **900,000**කට ආසන්න වේ.

අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ මෙරට ප්‍රධානතම සහල් සැකසුම් දිස්ත්‍රික්කය වන පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී/ සහල් අගයදාමය පිළිබඳව විශ්ලේෂණය කිරීමයි. අධ්‍යයනයේ විශේෂිත අරමුණු ලෙස, අගයදාමය තුළ විවිධ පාර්ශවකරුවන්ගේ කාර්යයභාරය හඳුනාගැනීම, වෙළඳපොළ ආන්තිකයන් විශ්ලේෂණය කිරීම, සහල් අතුරු නිෂ්පාදන සිදුවන ආකාරය පිළිබඳව අධ්‍යයනය සහ අදාළ පාර්ශ්වයන්ගේ ගැටලු හඳුනාගැනීමයි. ඒ අනුව අදාළ ප්‍රතිපත්තිමය නිර්දේශ ලබාදීම ද අරමුණු විය.

පර්යේෂණ ක්‍රමවේදයේදී ප්‍රමාණාත්මක සහ ගුණාත්මක ප්‍රවේශයන් භාවිතා කළ අතර බහු පියවර නියැදි ක්‍රමය යටතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මැදිරිගිරිය සහ දිඹුලාගල ප්‍රදේශවල ගොවීන් සමීක්ෂණය සඳහා තෝරා ගන්නා ලදී. මීට අමතරව වී එකතුකරන්නන්, සහල් මෝල් හිමියන්, අතුරු නිෂ්පාදන වෙළෙඳුන් සහ සිල්ලර වෙළෙඳුන් අධ්‍යයනයට භාජනය කරන ලදී.

අධ්‍යයනයේ සොයාගැනීම් :

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මහා වාරිමාර්ග යටතේ ඒකක වී අස්වැන්න මෙරට මහාවාරි සාමාන්‍ය වී අස්වැන්නට වඩා නිතරම **6%-8%** අතර ප්‍රමාණයකින් වැඩි අගයක් පවතී. එමෙන්ම පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සාමාන්‍ය අගයට වඩා විශේෂයෙන් මැදිරිගිරිය සහ දිඹුලාගල ප්‍රදේශවල ඒකක වී අස්වැන්න වැඩි අගයක් පෙන්නුම් කරයි. අධ්‍යයනයට අනුව ගොවීන්ගේ ඒකක වී අස්වැන්න අක්කරයකට බුසල් **89-138** අතර පරාසයක පැවතුණි. ප්‍රදේශයේ **2019** වසරේ වගා කන්නවල දී නිෂ්පාදන වියදම කිලෝවක් සඳහා රු.**24.50**ට ආසන්න විය. ප්‍රමිතියෙන් යුත් වී කිලෝ එකක් සඳහා ලැබී තිබුණු ගොවිපල මිල කිලෝවක් සඳහා රු.**48.00-52.00** අතර පැවතුණි. එම ගොවිපල මිල ගණන් **2018** වසරට සාපේක්ෂව **25%**කින් පමණ ඉහළ යාමක් පෙන්නුම් කෙරුණි. මෙයට හේතු වූයේ වී සඳහා වන සහතික මිල **2019/20** මහ කන්නයේ සිට කිලෝවක් සඳහා රු.**50.00** දක්වා වැඩි කිරීමට තීරණ කර තිබීම විය.

දිස්ත්‍රික්කයේ වඩාත් ප්‍රචලිතම වී/ සහල් සැපයුම් දාමය වනුයේ

ගොවියා ⟶ වී එකතුකරන්නා ⟶ සහල් මෝල්හිමියා ⟶ සහල් තොග වෙළෙන්දා ⟶ සිල්ලර වෙළෙන්දා ⟶ පාරිභෝගිකයා

ඇතැම් අවස්ථාවලදී වී එකතුකරන්නා හා සහල් මෝල් හිමියා අතරට අතරමැදියන්ගේ (Broker) සේවය ලබා ගනියි. වී තොග හිඟ කාලසීමාවේදී මෙම අතරමැදියන්ගේ කාර්යය වඩාත් ප්‍රමුඛ වේ. ගොවිපළ මට්ටමේදී වී සඳහා අගය එකතු කිරීම (Value addition) නිෂ්පාදන වියදමෙන් 10% පමණ විය. එය ගොවීන් නිසි ප්‍රමිතියට (14%) වී වියළීම සඳහා වැය කරන පිරිවැය විය. ගොවීන් මුහුණ දෙන ප්‍රධාන ගැටලුවක් වනුයේ වී වියළීම සඳහා නිසි ක්‍රමයක් නොමැති වීමය. දැනට කාපට් පාරවල එක් පැත්තක් ඒ සඳහා යොදා ගනී.

අගය දාමයේදී වැඩි ප්‍රතිශතයක් අගය එකතුකරන්නන් සහල් මෝල් හිමියා වේ. වී තොග පිරිසිදු කිරීම, ගබඩා කිරීම සහල් ඇසුරුම් කිරීම සහ ප්‍රවාහනය යන කාර්යයන් සිදු කර සහල් සඳහා අගය එකතු කිරීම සිදු කරන අතර එය සහල් මෝල් හිමියාගේ සහල් නිෂ්පාදන වියදමෙන් 44%ක ප්‍රතිශතයක් ගනී.

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වගා කටයුතුවල නිරතව සිටින 50,000කට ආසන්න ගොවීන් විසින් සාමාන්‍යයෙන් වාර්ෂිකව වී මෙට්‍රික් ටොන් 470,000ක් පමණ නිෂ්පාදනය කරන අතර දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන සහල් මෝල් ප්‍රමාණය 100-110 අතර පවතින අතර ඒ සඳහා අවශ්‍ය වන වාර්ෂික වී ප්‍රමාණය මෙට්‍රික් ටොන් 869,400ක් පමණ වේ. දිස්ත්‍රික්කය තුළ නිපදවන වී තොග ප්‍රමාණය සාමාන්‍ය වසරකදී මෙට්‍රික් ටොන් 471,000කි. ඒ අනුව මෙට්‍රික් ටොන් 397,000ක් පමණ වන හිඟ වී ප්‍රමාණය අම්පාර, අනුරාධපුරය සහ මඩකලපුව යන දිස්ත්‍රික්කවලින් ප්‍රධාන වශයෙන් සහල් මෝල් හිමියන් විසින් ලබා ගනියි.

සහල් නිපදවීමේදී දිස්ත්‍රික්කය තුළ සහල් මෝල් මඟින් වාර්ෂිකව මෙට්‍රික් ටොන් 46,000ක් පමණ සහල් නිවුඩු ද මෙට්‍රික් ටොන් 15,000ක ට ආසන්න සහල් පොලිෂ් කුඩු ද ප්‍රධාන අතුරු නිෂ්පාදන ලෙස නිපදවයි. සහල් නිවුඩු ප්‍රධාන වශයෙන් RICE-O නම් පොළොන්නරුවෙහිම පවතින Rice Oil නිපදවන ඉන්දියානු කර්මාන්ත සමාගම වෙත සැපයුම් වන අතර Rice පොලිෂ් කුඩු වයඹ පළාතේ බිංගිරිය, කුලියාපිටිය ප්‍රදේශවල සත්ත්ව ආහාර නිපදවන සමාගම් වෙත සැපයුම් වේ. සත්ත්ව ආහාර නිෂ්පාදකයින් මුහුණ දෙන ප්‍රධාන ගැටලුව වනුයේ සැපයුම්කරුවන් විසින් Branවලට ද්‍රව්‍ය කලවම්කර සැපයුම් කිරීමයි.

නිපදවන දහයියා ප්‍රධාන වශයෙන් සහල් මෝල් වල බොයිලේරු ක්‍රියාකාරීත්වය සඳහා භාවිතා කරන අතර ඉතිරි ප්‍රමාණය ත්‍රිකුණාමලය සහ පුත්තලම සිමෙන්ති කර්මාන්ත ශාලාවලට අමුද්‍රව්‍යයක් ලෙස සැපයුම් වේ. Rice bran සහ Polish එකතු කිරීම සඳහා එකතු කරන්නන් 20ක් පමණ පොළොන්නරුවෙහි සිටින අතර ඔවුන් සහල් මෝල් වලට සම්බන්ධව සිටී. දහයියා සැපයුම සඳහා ද එකතුකරන්නන් 20 පමණ දිස්ත්‍රික්කය තුළ ක්‍රියාකාරී වේ.

2011 වසරේදී ගම්මට්ටමින් වී එකතුකිරීමේ කඩ එක් ගමක තුනක් පමණ පැවතුණි. වර්තමානය වන විට මේ කඩ අහෝසි වී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසකට 20ක් පමණ බහු කාර්ය අලෙවි මධ්‍යස්ථාන (වී මිල දී ගැනීම, කෘෂිරසායන සහ පොහොර අලෙවිය, බීජ අලෙවිය) බිහි වී ඇත.

එමෙන්ම 2011 වසරේදී අධ්‍යයනයට අනුව සහල් මෝල් 160ක් දිස්ත්‍රික්කය තුළ පැවතුණු අතර වර්තමානයේ එය 110 දක්වා අඩු වී ඇත. කුඩා පරිමාණ සහල් මෝල් යම් ප්‍රමාණයක් කර්මාන්තයෙන් ඉවත්ව ගොස් ඇත. එමෙන්ම මහා පරිමාණ සහල් මෝල්වල ධාරිතාවයන් ඉහළ ගොස් ඇත. එමෙන්ම මධ්‍ය පරිමාණ සහල් මෝල් ද තමන්ගේ පරිමාණය ඉහළ නංවාගෙන ඇත.

වී/සහල් අගයදාමය සංවර්ධනය සඳහා නිර්දේශයන් :

- ගොවිපළ මට්ටමේදී **(Farm Level)**

වැඩි අස්වනු ලබාදෙන මැදිරිගිරිය වැනි නිෂ්පාදන ප්‍රදේශවල ඉහළ අස්වනු ලබන ගොවි මහතුන්ගේ ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රමවේදයන් හඳුනා ගැනීම තුළින් එම ක්‍රමවේදයන් අනෙකුත් ගොවීයන් අතර ද ප්‍රචලිත කිරීම (Replication) සඳහා උපායමාර්ගික වැඩසටහන් සැකසීම මේ තුළින් ඒකක අස්වැන්න මෙන්ම සමස්ථ නිෂ්පාදනයද ඉහළ නංවා ගත හැකි වනු ඇත.

ගොවින්ට වී අස්වනු සඳහා අගය වැඩිකිරීමට (Value addition) ප්‍රධාන වශයෙන් වී වියළීම සඳහා පහසුකම් අවශ්‍ය වේ. මේ සඳහා ප්‍රමිතියෙන් යුක්ත කොන්ක්‍රීට් කමත් පහසුකම් අවශ්‍යය. රජය මඟින් සහ කමත් ඇති කිරීම සඳහා පුද්ගලික අංශය දිරිගැන්වීම මඟින් සහ රාජ්‍ය, පෞද්ගලික සම්බන්ධතාවය යටතේ එවැනි වැඩසටහන් සැකසීම අවශ්‍යය. මේ තුළින් අගය දාමයේ කාර්යක්ෂමතාවය වැඩි වනු ඇත.

එමෙන්ම ගොවීන්ට තම තොග තොරතුරු Digital platform ප්‍රවේශයකට ඇතුළත් කිරීමට පහසුකම් සලසා දිය යුතු අතර ඒ තුළින් ගැණුම්කරුවන් සම්බන්ධකිරීමේ වැඩසටහනක් සැකසිය හැකිය.

- එකතුකරන්නන් මට්ටමේදී,

වී එකතු කිරීමේ කාර්යයේ නිරත වෙළෙඳුන්ට වී වියළීමේ කාර්යය සඳහා දායක විය හැකිය. ඔවුන්ව කොන්ක්‍රීට් කමත් සහ Mini Dryers සඳහා ආයෝජනයට පොළඹවන වැඩසටහන් අවශ්‍ය වේ.

- සහල් මෝල් හිමියා මට්ටමේදී

අගයදාමයේ වැඩිම ප්‍රමාණයන් අගය එකතු කරනුයේ සහල් මෝල් හිමියා වේ. මෙහිදී මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන්ට තම ධාරිතාවය වැඩි කර ගනිමින් ඉහළ මට්ටමට ළඟාවීම සඳහා ආයෝජන දිරිගැන්වීමේ වැඩසටහන් ද ගවේෂණාත්මක (Innovative), සතුටුදායක මූල්‍ය කලමනාකරණයක් බැංකු සහ පවත්වාගෙන යනු ලබන, හොඳ ව්‍යාපාරික ආකෘති සහිත කුඩා පරිමාණ සහල් මෝල් හිමියන්ට මධ්‍ය පරිමාණ දක්වා යාමට අවශ්‍ය පහසුකම් සහ දිරිගැන්වීම් ඇතිකිරීම.

විශේෂයෙන් මධ්‍ය පරිමාණ සහල්මෝල් හිමියන්ට, අම්පාර, මඩකලපුව සහ අනුරාධපුර දිස්ත්‍රික්කවල ඉහළ නිෂ්පාදනයක් ලබාදෙන ප්‍රදේශවල (High Producing Rural Areas) සහල් මෝල් ඇති කිරීම සඳහා දිරිගැන්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. වී/සහල් අගයදාමය තුළ සහල් මෝල් හා ආශ්‍රිත කර්මාන්තවල ආයෝජනය සඳහා දේශීය කෘෂි ආශ්‍රිත කර්මාන්තවල ආයෝජකයන් ප්‍රධාන ආහාර සමාගම්වලට දිරි ගැන්වීම් කළ යුතුය. උදාහරණ ලෙස දැනට පුද්ගලික සහල් මෝල් නොමැති නමුත් High Paddy Producing Zones වල (පදවිය, කැබිතිගොල්ලෑව, අම්පාර, ලාහුගල, පොතුවිල්, ඇලහැර, විලාච්චිය, තිරුක්කෝවිල්, මන්නාරම සහ මඩකලපුව දිස්ත්‍රික්කයේ ග්‍රාමීය ප්‍රදේශ) ස්වයංක්‍රීය (Automatic) සහල් මෝල් ඇතිකිරීමට කටයුතු කිරීම.

රටපුරා පවතින වාණිජ සහල් මෝල් ප්‍රමාණය, ධාරිතාවය පිහිටුවීම, යන්ත්‍රෝපකරණ, ගබඩා ධාරිතාවය, නිපදවන සහල් වර්ග, වෙළඳපොළ පිළිබඳ තොරතුරු සංගණනයක් වහාම සිදුවිය යුතුය. මෙම දත්ත පද්ධතිය (ICT based) වාර්ෂිකව යාවත්කාලීන විය යුතුය. මෙම කාර්යය, හෙක්ටර් කොඩ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, පසු අස්වනු තාක්ෂණ ආයතනය සහ වී අලෙවි මණ්ඩලය මඟින් ඒකාබද්ධව සිදු කළ යුතු බව නිර්දේශ කළ හැකිය.

දැනට සමාගම් දෙකක් පමණක් නිපදවනු ලබන Rice Oil කර්මාන්තය පිළිබඳව පුළුල් අධ්‍යයනයක් අවශ්‍යය. ඒ තුළින් Rice Oil මෙරට තුළ ප්‍රචලිත කිරීමට සුදුසු විභවය සහ උපායමාර්ග හඳුනාගත යුතුය. පවතින විද්‍යාත්මක තොරතුරු අනුව Rice Oil- පෝෂ්‍ය හා සෞඛ්‍ය ආරක්ෂිත බවින් සුවිශේෂී වේ. එමෙන්ම Rice Bran ලෙස ඉන්දියාවට අපනයනය වන ප්‍රමාණය සහ ඒ පිළිබඳව තොරතුරු ගවේෂණය කළ යුතුය. Rice Oil ප්‍රචලිත කිරීම සඳහා සොයා බැලීමට සෞඛ්‍ය සහ ආහාර විද්‍යාඥයන් සමන්විත කමිටුවක් නිර්දේශ කළ හැකිය.

එමෙන්ම දැනට විශාල වශයෙන් අපද්‍රව්‍යයක් ලෙස ඉවතලන දහයියා අළුවලින් Silica හෝ වෙනත් ලබාගතහැකි කර්මාන්ත අවස්ථාවන් පිළිබඳ විධිමත් අධ්‍යයනයක් තුළින් නිර්දේශ අවශ්‍ය වනු ඇත.

සහල්වලට අමතරව අගය එකතු කරන සහල් නිෂ්පාදනවලට යොමුවන සහල් මෝල් හිමියන් දිරිගැන්විය යුතුය. උදාහරණ ලෙස එක් සහල් මෝල් හිමියෙක්, ජපාන තාක්ෂණය යටතේ සහල්වලින් කොත්තු නිපදවා සුපිරි වෙළෙඳසැල් හරහා අලෙවි කරයි. මෙවැනි නවෝත්පාදන දිරි ගැන්විය යුතුය.

අධ්‍යයනයේ පළමු කෙටුම්පත සකස්කිරීම අවසන් අදියරේ පවතී.

3. අතරමැදි කන්නයේ අතිරේක ආහාර බෝග වගා කිරීමේ ගැටලු පිළිබඳ අධ්‍යයනය

පර්යේෂණ කණ්ඩායම	:	ආචාර්ය එන්.පී.ජී සමන්ත ආචාර්ය ඊ.ඒ.සී ප්‍රියංකර	සම්බන්ධීකරණ නිලධාරී සම පර්යේෂක
මූල්‍ය ප්‍රභවය	:	ඒකාබද්ධ අරමුදල	

විෂය පථය සහ අරමුණු

පසුගිය දශක හතර තුළ අතිරේක ආහාර බෝගයන්හි ජාතික නිෂ්පාදනයේ තියුණු පහත වැටීමත් සමඟ අතිරේක ආහාර බෝගයන්හි ආනයන වියදම සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත. 2018 වර්ෂයේ අතිරේක ආහාර බෝග ආනයනය සඳහා රුපියල් මිලියන 41,734ක් වැය වී තිබේ.

මෙය විදේශ විනිමය පිටතට ගලා ඒමට මෙන්ම ආහාර සුරක්ෂිතතාව සහ රටේ පෝෂණ තත්ත්වය අඩු කිරීමට ද හේතු වේ. එබැවින් අතිරේක ආහාර බෝග නිෂ්පාදනය ඉහළ නැංවීම කෙරෙහි වර්තමානයේ වැඩියන් අවධානයට ලක්ව ඇත. අතිරේක ආහාර බෝග නිෂ්පාදනය ඉහළ නැංවීමේ එක් විකල්පයක් ලෙස කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ තවත් බොහෝ ප්‍රතිපත්ති ලේඛන විසින් 'අතරමැදි කන්නයේ වගාව' නිර්දේශ කර ඇත. කෙසේ වෙතත්, බොහෝ අතිරේක ආහාර බෝගවල නිෂ්පාදන ඉලක්ක සපුරා ගැනීමට ශ්‍රී ලංකාවට නොහැකි වී තිබේ. 2019 අගෝස්තු මාසයේදී පැවති පාලක මණ්ඩල රැස්වීමේදී ශ්‍රී ලංකාවේ අතරමැදි කන්නයක දී අතිරේක ආහාර බෝග වගාව ව්‍යාප්ත කිරීමට ඇති ගැටලු පිළිබඳව සොයා බලන ලෙස හෙක්ටර් කොඩිතුවක්කුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා ඉල්ලීමක් කර තිබේ. එහි ප්‍රතිඵලයක් ලෙස 2019 නොවැම්බර් මාසයේදී මෙම අධ්‍යයනය ආරම්භ කර ඇත.

අධ්‍යයනයේ අරමුණු

අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ අතරමැදි කන්නයේ දී අතිරේක ආහාර බෝග ව්‍යාප්ත කිරීමට බලපාන ගැටලු පරීක්ෂා කිරීමයි.

මූලික අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා පහත සඳහන් අරමුණු විශේෂයෙන් සලකා බලා ඇත:

- අතරමැදි කන්නයේ දී අතිරේක ආහාර බෝග වගා කිරීමේ දී ගොවීන් මුහුණ දෙන ගැටලු සහ බාධක හඳුනා ගැනීම.

- අතරමැදි කන්නයේ දී අතිරේක ආහාර බෝග වගා කිරීමේදී ඇතිවන ගැටලු සහ බාධක ජය ගැනීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම.

අතරමැදි කන්නයේ දී අතිරේක ආහාර බෝග වගාව සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශ මත පදනම්ව අධ්‍යයනය සඳහා හම්බන්තොට සහ අනුරාධපුර දිස්ත්‍රික්ක තෝරාගෙන ඇත. අධ්‍යයනය සඳහා ප්‍රාථමික හා ද්විතීයික දත්ත එකතු කර ඇත. ද්විතීයික දත්තවල ප්‍රභවයන් වූයේ ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දත්ත, දිස්ත්‍රික් කෘෂිකාර්මික කාර්යාල සහ ගොවි සේවා මධ්‍යස්ථාන වාර්තා ය.

පළමු විශේෂිත අරමුණ ඉටු කර ගැනීම සඳහා ගොවීන්ගෙන් ප්‍රාථමික දත්ත හා තොරතුරු එක්රැස් කිරීම සඳහා හම්බන්තොට සහ අනුරාධපුර දිස්ත්‍රික්කවල ගොවීන් 150 දෙනෙකුගේ සහභාගීත්වයෙන් ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා 15 ක් පවත්වන ලදී.

සොයා ගැනීම්

- අන්තර් සම්බන්ධිත සමයේ කාලසීමාව දින 60-70 කි. එබැවින් කෙටි කාලයක් සඳහා වඩාත් යෝග්‍ය වන මුං ඇට තුන්වන කන්නයේ වගා කිරීම සඳහා බොහෝ ගොවීන් තෝරා ගෙන ඇත.

- අතරමැදි කන්නය ආරම්භයේදී ගුණාත්මක බීජ සොයා ගැනීමට නොහැකි වීම බොහෝ අධ්‍යයන ස්ථානවල ප්‍රධාන ගැටලුවක් වී තිබේ. නිර්දේශිත දේශීය බීජ ප්‍රභේදය වන MI5 සහ MI6 සැපයූ ප්‍රමාණය ප්‍රමාණවත් නොවූ බැවින් පරිභෝජන කටයුතු සඳහා ආනයන කළ මුං ඇට බීජ වශයෙන් ලෙස යොදා ගැනීමට ගොවීන් පෙළඹී තිබුණි.

- ගවයින් සහ වන සතුන් හානිවීම තවත් සැලකිලිමත් විය යුතු කරුණකි. ප්‍රධාන වගා කන්නයන් අතර කාල සීමාව සාමාන්‍යයෙන් ගවයින්ට නිදැල්ලේ තණකොළ කෑමට වෙන් කරන හෙයින් අතරමැදි කාලයේ දී කුඹුරුවල අතිරේක බෝග වගා කිරීම, විශේෂයෙන් හම්බන්තොට දිස්ත්‍රික්කයේ කිරි ගොවීන් සහ අතිරේක බෝග වගා කරන ගොවීන් අතර ගැටුමක් ඇති කිරීමට හේතු වී තිබේ. ගොවීන් අතිරේක බෝග වගාවෙන් ඈත් කිරීමට මෙය ප්‍රධාන හේතුවක් වී ඇත.

- නිසි අලෙවිකරණ යාන්ත්‍රණයක් නොමැතිකම, අස්වැන්න නෙළන අවස්ථාවේ අඩු වෙළඳපළ මිල, ගැනුම්කරුවන් නොමැතිකම සහ ආනයනික බීජ හා සසඳන විට MI5 සහ MI6 වර්ග සඳහා අඩු වෙළඳපළ වටිනාකම අලෙවිකරණ ගැටලු ලෙස හඳුනාගෙන ඇත.

- මුං ඇට අස්වනු නෙළීම සඳහා ඉහළ ශ්‍රමයක් වැය වේ. ශ්‍රම හිඟය සහ ඉහළ වැටුප් අනුපාතය නිෂ්පාදන පිරිවැය ඉහළ යාමට හේතු වේ.

- අතරමැදි කන්නයේ වගාව ප්‍රවර්ධනය කිරීම සඳහා වගකිව යුතු ආයතන අතර සම්බන්ධීකරණයේ ඌනතාවය ද ගැටලුවක් වී තිබේ.

නිර්දේශ:

- වගා කන්නය ආරම්භයේදී ගුණාත්මක බීජ ලබා දීම සඳහා විධිමත් යාන්ත්‍රණයක් ස්ථාපිත කළ යුතුය
- නිදැල්ලේ ඇති කරන ගවයින්ගෙන් බෝග හානිය අවම කිරීම සඳහා තෘණ ඉඩම් ලබා දීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. වගා හානි සඳහා වන්දි ලබා දීමට විධිමත් වැඩපිළිවෙළක් ස්ථාපිත කළ යුතුය.
- ගොවිජන සේවා මධ්‍යස්ථාන, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, පරිපාලන ආයතන ආදිය අතර වඩා හොඳ සම්බන්ධීකරණයක් ඇති කළ යුතු අතර තුන්වන කන්නයේ වගාව සඳහා ප්‍රමුඛතාවය දිය යුතුය.
- අලෙවිකරණ ගැටලු විසඳීම සඳහා ගොවීන් සහ පෞද්ගලික අංශයේ ආහාර සැකසුම් ආයතන අතර ඉදිරි විකුණුම් ගිවිසුම් ඇති කළ යුතුය.

4. කෘෂිකාර්මික වෙළෙඳපොළ තොරතුරු සේවාව (Agriculture Marketing Information System - AMIS)

කෘෂිකාර්මික වෙළෙඳපොළ තොරතුරු සේවාව (AMIS) යනු මිල තොරතුරු (තොග, සිල්ලර සහ ගොවිපළ මිල) එකතු කිරීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතියකි. සැලැස්මට අනුව, තොග මිල තොරතුරු වෙළඳපළ ස්ථාන තිස් හතරකින් (34) සිල්ලර මිල තොරතුරු වෙළඳපළ ස්ථාන හතළිස් තුනකින් (43) කින්(කොටුව, වැල්ලවත්ත, කිරුලාපන, නුගේගොඩ, නාරාහේන්පිට, දෙමටගොඩ, තොටළඟ, කඩවත සහ කිරිබත්ගොඩ) වෙතින් මිල තොරතුරු එකතු කළ යුතුය. නිෂ්පාදන මිල තොරතුරු ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශ 19කින් එකතු කරනු ලැබේ. මිල දත්ත රැස්කිරීමට සම්බන්ධ බොහෝ පිරිස් අනියම් විමර්ශකයින් වන අතර සෑම වෙළඳපලකම අනියම් විමර්ශකයින් සිටීම මෙම වෙළඳපළ ස්ථානවලින් දත්ත රැස් කිරීමේ කාර්යක්ෂමතාව තීරණය කරයි. ඊට අමතරව, අනපේක්ෂිත තත්ත්වයන්, කොවිඩ් -19 වැනි වසංගත තත්ත්වයන් හෝ වෙනත් ඕනෑම ව්‍යසනයක් තත්‍ය වෙළඳපොළ මිල දත්ත රැස් කිරීමට බලපායි.

2020 වර්ෂයේ ජනවාරි සිට අගෝස්තු අවසානය දක්වා සෑම වෙළඳපොළකින්ම පාහේ මිල දත්ත රැස් කිරීමට අප ආයතනයට හැකි වී තිබේ. ස්ථාන 28ක ක්ෂේත්‍ර නිලධාරීන් 28 දෙනෙකු සහ කොළඹ වෙළෙඳපොළෙන් තොරතුරු රැස් කිරීම සඳහා අනියම් පරීක්ෂකවරුන් 11 දෙනෙකු යොදවන ලදී. කෙසේ වෙතත්, සැප්තැම්බර් 24 වන දින උපාධිධාරීන් බඳවා ගැනීමේ රජයේ වැඩසටහන යටතේ සංවර්ධන නිලධාරීන් ලෙස රජයේ සේවයට බැඳීම සඳහා අනියම් විමර්ශකයින් 28 දෙනෙකුගෙන් 24 දෙනෙකු ඉල්ලා අස් වූහ. COVID වසංගතය හේතුවෙන් රට වසා දැමීම හේතුවෙන් බාධා ඇති වුවද, 2020 ඔක්තෝම්බර් මාසයේදී අප ආයතනය විසින් අනියම් විමර්ශකයින් 12 දෙනෙකු බඳවා ගන්නා ලදී. මීට අමතරව, 6666 නමින් මොබිටෙල් දුරකථන ඇමතුම් සේවාව ද අඛණ්ඩව ක්‍රියාත්මක වන අතර ඒ මඟින් දෛනිකව ආර්ථික මධ්‍යස්ථාන 7ක සිට දෛනික තොග මිල තොරතුරු සපයනු ලැබේ.

5. සත්ත්ව ආහාර සහ ආහාර කර්මාන්තය තුළ බඩඉරිඟු අගය දාම විශ්ලේෂණය : තත්ත්වය, ගැටලු සහ අවස්ථා

පර්යේෂණ කණ්ඩායම : ආර්.පී විදානපතිරණ - සම්බන්ධීකාරක
ආර්.එන්.කේ රඹුක්වැල්ල - සම පර්යේෂිකා
ඩබ්.ඒ.එන් විජේසිංහ - සම පර්යේෂක
අයි.වී කුරුප්පු - සම පර්යේෂක

මූල්‍ය ප්‍රභවය : ඒකාබද්ධ අරමුදල

සත්ත්ව ආහාර නිෂ්පාදන ක්ෂේත්‍රය තුළ බඩඉරිඟු සඳහා විශාල ඉල්ලුමක් නිර්මාණය වී තිබේ. විශේෂයෙන් කුකුළු ආහාර නිෂ්පාදනය සඳහා එය නැතිවම බැරි අමුද්‍රව්‍යයකි. කුකුළු ආහාර නිෂ්පාදන ක්ෂේත්‍රයේ භාවිතා කරන අමුද්‍රව්‍ය සඳහා ආසන්න වශයෙන් 60%ක් ම බඩඉරිඟු භාවිතා වේ.

බඩඉරිඟුවල මිල ගණන් දේශීය හා විදේශීය වශයෙන් ඉහළ යමින් පවතී. ගෝලීය වශයෙන් බඩඉරිඟුවල මිල ගණන් ඉහළ යාමේ ප්‍රවණතාවය සහ බඩඉරිඟු ආනයනය සඳහා පනවා ඇති බද්ද හේතුවෙන් ආනයනික බඩඉරිඟු මිල ඉහළ මට්ටමක පවතී.

බඩඉරිඟු කුකුළු ආහාරවල ප්‍රධාන සංඝටකයක් වන බැවින් කුකුළු ආහාර සඳහා වන පිරිවැය ද වසර ගණනාවක් තිස්සේ ඉහළ යන ප්‍රවණතාවක් පෙන්නුම් කරයි. කුකුළු ආහාර සඳහා හැරුණු විට ත්‍රිපෝෂ, සමපෝෂ වැනි ධාන්‍ය සීරියල් සකස් කිරීමටත්, පොප්කෝන් සහ තැම්බූ ඉරිඟු වශයෙන් ද බඩඉරිඟු සඳහා වූ ඉල්ලුම පසුගිය වසර කිහිපය තුළ ඉහළ ගොස් තිබේ.

මෙම අධ්‍යයනයේ දී බඩ ඉරිඟු අලෙවිකරණ පද්ධතිය විශ්ලේෂණය කරනු ලැබේ, බඩ ඉරිඟු ගබඩා කිරීම, ගබඩා කිරීම සහ සැකසුම් පහසුකම් තක්සේරු කරනු ලබන අතර රට තුළ බඩ ඉරිඟු වෙළඳාමේ මට්ටම තක්සේරු කෙරේ.

බඩඉරිඟු අගය දාමයෙහි තරගකාරිත්වය වැඩි දියුණු කිරීම සඳහා පාර්ශ්වකරුවන් විසින් ක්‍රියාත්මක කළ යුතු ව්‍යාපාර ආකෘති ඇතුළු බලපෑම් සහගත ක්ෂේත්‍ර සහ මැදිහත්වීම් සහ නිර්දේශ සැපයීම සඳහා බඩඉරිඟු අගය දාමය පිළිබඳ සවිස්තරාත්මක විශ්ලේෂණයක් සිදු කිරීම මෙම අධ්‍යයනයේ සමස්ත අරමුණයි.

විශේෂිත අරමුණු

- බඩඉරිඟු සැපයුම් දාමයේ දැනට පවතින භාවිතාවන් සහ එහි අගය එකතු කළ නිෂ්පාදන සොයා බැලීම
- සැපයුම් දාමයේ විවිධ ආර්ථික කාර්යසාධනය ආන්තිකය), පිරිවැය, ආදායම සහ කාර්ක්ෂමතාවය (විශ්ලේෂණය කිරීම
- ඵලදායීතාවය වැඩි කිරීම සඳහා සහ අගය දාමයේ තරහකාරිත්වය වැඩි කිරීම සඳහා අගය දාමයේ ප්‍රධාන ක්‍රියාකාරීන්ගේ ශක්‍යතා, දුර්වලතා, අවස්ථා සහ තර්ජන විශ්ලේෂණය කිරීම
- මෙරට බඩඉරිඟු අගය දාමයේ කාර්යක්ෂමතාවය වැඩි කිරීම සඳහා සහ ඉහළ තත්ත්වයට ගෙන ඒම සඳහා අවශ්‍ය ප්‍රධාන ප්‍රතිපත්තිමය මුල පිරීම් හඳුනා ගැනීම

වර්තමාන ප්‍රගතිය

කෘෂිකාර්මික භාණ්ඩවල අගය දාම විශ්ලේෂණයට අදාළ අධ්‍යයනයන්හි සාහිත්‍ය සමාලෝචනය අවසන් කර ඇත. ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, රේගු දෙපාර්තමේන්තුව, මහ බැංකුව, සහ ප්‍රකාශයට පත් කරන ලද දත්ත හා තොරතුරු ඇතුළත් ද්විතීයික දත්ත එකතු කිරීම සිදු කර ඇත. මෙම යෝජනාව පර්යේෂණ හා පුහුණු කමිටුවට (RTC) ඉදිරිපත් කරන ලද අතර, COVID-19 රෝගය රට තුළ ව්‍යාප්ත වීම හේතුවෙන් අධ්‍යයනයේ භෞතික ප්‍රගතිය වාර්තා කර ගත හැකි වූයේ 10% ක් පමණි.

6. ශ්‍රී ලංකාවේ ලොකු ලූණු නිෂ්පාදනය හා අලෙවිය: අගය දාම විශ්ලේෂණයක්

පර්යේෂණ කණ්ඩායම : ආර්.එන්.කේ රඹුක්වැල්ල -සම්බන්ධීකාරක
ආර්.පී විදානපතිරණ - සම පර්යේෂිකා

මූල්‍ය ප්‍රභවය : ඒකාබද්ධ අරමුදල

ලොකු ලූණු යනු ලංකාවේ දැඩිව සාකච්ඡාවට බඳුන් වන පාරිභෝගික භාණ්ඩයකි. ලොකු ලූණු වගාව සහ මිල ගණන් මූලික වශයෙන් තීරණය කරනු ලබන්නේ ආණ්ඩුවේ ආනයන ප්‍රතිපත්තිය මතය. ලොකු ලූණු නිෂ්පාදනයේ දී රජයේ ප්‍රධාන ප්‍රතිපත්තිය ලෙස දේශීය නිෂ්පාදකයින්ට උදව් කිරීම, දිරිගැන්වීම සහ ආරක්ෂා කිරීම පිණිස දේශීය ලොකු ලූණු නිෂ්පාදනය වෙළඳපොළ වෙත පැමිණෙන සමය වනවිට රජය විසින් සෑම වසරකම ආනයනික ලොකු ලූනු මත බද්දක් පනවනු ලබයි.

ලොකු ලූණු ආනයනය සඳහා සෑම වසරකම සැලකිය යුතු මුදල් ප්‍රමාණයක් ශ්‍රී ලංකාව වැය කරන හෙයින් (2019 වර්ෂයේදී රු. මිලියන 15,156/=) ලොකු ලූණු නිෂ්පාදනය අතින් ස්වයංපෝෂිතභාවය ළඟා කර ගැනීමට ලබා රජය උත්සාහ කරයි. මේ අතර, පසුගිය කාලය තුළ ලංකාවේ ලොකු ලූණු නිෂ්පාදනයට එල්ල වූ විවිධ වූ අතර එම නිසා පාරිභෝගිකයින් ද ලොකු ලූණු සඳහා ඉහළ මිලක් ගෙවන බව දක්නට ලැබුණි.

ලොකු ලූණු වගාව බොහෝ ආකාරවලින් ප්‍රවර්ධනය කිරීමට රජය උනන්දු වුවද මෙම අංශය තුළ යම් යම් පසුබෑම් නිරන්තරයෙන් මතුව තිබේ. ලොකු ලූණු වගාව, එයට සම්බන්ධ වූ ගොවීන්ගේ සංඛ්‍යාව සහ නිෂ්පාදනය පසුගිය කාලය තුළ විශාල ලෙස පහත වැටී ඇත. පසුගිය වසර දහය සලකා බැලීමේදී ආනයනික ලොකු ලූණු ප්‍රමාණය ද අඛණ්ඩව ඉහළ ගොස් තිබේ. දේශීය අවශ්‍යතාව සහ දේශීය නිෂ්පාදන අතර විශාල පරතරයක් ඇති කිරීමට මෙම තත්ත්වය හේතු වේ.

ශ්‍රී ලංකාව ප්‍රධාන වශයෙන් ලොකු ලූණු ආනයනය කරන්නේ ඉන්දියාවෙන් වන නමුත් අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් නිෂ්පාදනය පහළ බැසීම හේතුවෙන් ඉන්දියානු රජය 2019 ඔක්තෝම්බර් මාසයේ සිට ලොකු ලූණු අපනයනය කිරීම තහනම් කර තිබේ. මේ මොහොතේ පාරිභෝගික ඉල්ලුම සපුරාලීම සඳහා දේශීය නිෂ්පාදනය ප්‍රමාණවත් නොවන අතර මෙම තත්ත්වය ඔක්තෝබර් සහ නොවැම්බර් මාසවලදී ලොකු ලූණු තොග සහ සිල්ලර මිලට ඉහළ යාමට හේතු වී තිබේ. එසේම පාරිභෝගික ඉල්ලුම සපුරාලීම සඳහා දේශීය නිෂ්පාදනය ප්‍රමාණවත් නොවන අතර මෙම තත්ත්වය ඔක්තෝබර් සහ නොවැම්බර් මාසවලදී ලොකු ලූණු තොග සහ සිල්ලර මිලට ඉහළ යාමට හේතු වී තිබේ. එම කාලය තුළ ආනයනික ලොකු ලූනු මිල අසාමාන්‍ය ඉහළ යාමක් පෙන්නුම් කළ බව පාරිභෝගික කටයුතු අධිකාරිය සඳහන් කළ අතර 2020 පෙබරවාරි 22 වන විට එය රු. 300.00/kgක් විය. එයින් පෙන්නුම් කරන්නේ ලූණු මිල ඉහළ යාම නිසා ආහාර පරිභෝජන පිරිවැය වැඩි වීම තුළින් පාරිභෝගිකයාට බලපාන අතර වගා පිරිවැයට වඩා විකුණුම් මිල අඩු වීම නිෂ්පාදකයාට බලපාන බවයි.

එම කාලය තුළ දේශීය ලොකු ලූණු නිෂ්පාදනය අඩු වීම සහ සීමිත ආනයනය හේතුවෙන් එම කාලය තුළ වෙළඳපොළේ ලොකු ලූණු නිසි පරිදි සැපයුමක් නොා තිබූ අතර බොහෝ පාරිභෝගිකයින්ට ලොකු ලූනු මිල දරා ගත නොහැකි විය.

දුර්වල සැපයුම් දාමය සහ වෙළඳපළ අකාර්යක්ෂමතාව එම තත්ත්වයට බලපා ඇත. ඉහත සඳහන් පසුබෑම්වලට පිළියම් යෙදීම සඳහා ලොකු ලූණු අගය දාමයේ අංගයන් පිළිබඳව පූර්ණ දාම සිතියම අවබෝධ කර ගැනීමට සහ ක්‍රියාකාරිකයින්ගේ දළ ආන්තිකයේ කොටස අවබෝධ කර ගැනීමට සහ දාමයේ ප්‍රධාන ක්‍රියාකාරිකයින්ගේ සහ පහසුකම් සපයන්නන්ගේ භූමිකාව දැක ගැනීම අත්‍යවශ්‍ය වේ. ලොකු ලූණු අගය දාමයේ ගොවියාගේ සිට අවසාන පාරිභෝගිකයා දක්වා වූ ලාභ හා අලාභ අවබෝධ කර ගනිමින් සිතියම සකස් කෙරේ. නව රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය වන "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශය කෘෂිකාර්මික අංශය ප්‍රවර්ධනය කිරීමට දිරි දෙන අතර කුඩා නිෂ්පාදකයින් කුඩා ඉඩම් ප්‍රමාණයක් භාවිතා කරමින් නවීන තාක්ෂණික ක්‍රම උපයෝගී කරගනිමින් උසස් තත්ත්වයේ නිමැවුම් නිෂ්පාදනය කිරීමට එමඟින් දිරිමත් කරනු ලැබේ. ලොකු ලූණු වගාව සහ නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා යාන්ත්‍රණයක් සකස් කිරීම, දේශීය නිෂ්පාදනය වැඩිවීමත් සමඟ වාර්ෂිකව විදේශ විනිමය ඉතිරි කර ගැනීම එමඟින් අවධානය යොමු කෙරේ.

මෙම ඉලක්කය සපුරා ගැනීම සඳහා, මේ සම්බන්ධයෙන් ඇති බාධාවන් සහ අනාගත බලාපොරොත්තු හඳුනා ගැනීම සඳහා මෙම අංශයේ සමස්ත අගය දාම විශ්ලේෂණයක් සිදු කිරීම ඉතා වැදගත් වේ.

මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ ලොකු ලූණු නිෂ්පාදනය සම්බන්ධයෙන් සවිස්තරාත්මක අගය දාම විශ්ලේෂණයක් සිදු කිරීම, නිෂ්පාදනයේ හා අලෙවි කිරීමේ ප්‍රධාන බාධාවන් සහ අවස්ථා හඳුනා ගැනීම සහ ලොකු ලූණු වටිනාකම වැඩි දියුණු කිරීම සඳහා මැදිහත් වීම සහ උත්තේජක සඳහා නිර්දේශ යෝජනා කිරීම ය.

විශේෂිත අරමුණු වන්නේ,

i. ශ්‍රී ලංකාවේ දැනට පවතින ලොකු ලූණු වටිනාකම් දාම හඳුනාගෙන සිතියම් ගත කිරීම (ආනයනික හා දේශීය)
ii. ලොකු ලූණු වටිනාකම් දාමයන් ඔස්සේ විවිධ ක්‍රියාකාරිකයින්ගේ ආර්ථික ක්‍රියාකාරිත්වය (ආන්තික, පිරිවැය, ප්‍රතිලාභ සහ කාර්යක්ෂමතාව) විශ්ලේෂණය කිරීම
iii. අධ්‍යයන ප්‍රදේශවල ලූණු නිෂ්පාදනයට බලපෑම් සිදු කරන සාධක හඳුනා ගැනීම
iv. වටිනාකම් දාමය තුළ ඇති බාධක/ බාධක සහ අවස්ථා හඳුනා ගැනීම

වර්තමාන ප්‍රගතිය

අධ්‍යයන කවයට ඉදිරිපත් කිරීම, පර්යේෂණ හා පුහුණු කමිටුවට ඉදිරිපත් කිරීම අවසන් කර තිබුණි. ද්විතීයික දත්ත එකතු කිරීම සිදු වෙමින් පවතී (භෞතික ඉලක්කයෙන් 10%ක් සපුරා ඇත).

අවසන් කළ අධ්‍යයන - බාහිර අරමුදල් මත සිදු කළ

1. **EMPOWER:** ව්‍යාපෘතියේ අවසන් සමීක්ෂණය: ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ කාන්තාවන් ආර්ථිකව බල ගැන්වීම තුළින් සාමය ගොඩනැගීම.

පර්යේෂණ කණ්ඩායම:	අයි.වී.කුරුප්පු	සම්බන්ධීකාරක
	එම්.ඒ.සි.එස්. බණ්ඩාර	සම පර්යේෂක
	ඩබ්.එච්.ඒ. ශාන්ත	සම පර්යේෂක
	ඩබ්.ඒ.එන්. විජේසුරිය	සම පර්යේෂක
	එම්.ටී. පද්මජානි	සම පර්යේෂක

අරමුදල් ප්‍රභවය: ජාත්‍යන්තර කම්කරු සංවිධානය සහ ලෝක ආහාර සංවිධානය (ILO & WFP)

විෂය පථය සහ අරමුණු

ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ කාන්තාවන් ආර්ථිකව බල ගැන්වීම තුළින් සාමය ගොඩනැගීමේ (EMPOWER) ව්‍යාපෘතිය ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO) සහ ලෝක ආහාර වැඩසටහන (WFP) එක්ව ශ්‍රී ලංකානු රජයේ මැදිහත් වීමෙන් පුදුකුඩ්ඉරිප්පු කාන්තා ව්‍යවසායකයින්ගේ සමුපකාර සමිතියේ (PTK COOP) ද සහය ඇතිව ආරම්භ කරන ලද්දකි.

මෙම ව්‍යාපෘතියේ පුළුල් පරමාර්ථය වූයේ ගැටුම්වලින් පීඩාවට පත් ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ දිස්ත්‍රික්කවලින් එකක් වන මුලතිව් දිස්ත්‍රික්කයේ ආර්ථිකය සවිබල ගැන්වීම, සමාජ ඒකාබද්ධතාවය, ස්ථාවරත්වය සහ සාමය ගොඩනැගීමේ සහභාගීත්වය ඉහළ නැංවීමයි. ස්ථීරසාර සාමය පවත්වා ගැනීම උදෙසා විශ්ලේෂණාත්මක, සමාජ ජාල සහ ව්‍යාපාර උපායමාර්ගික කුසලතා වර්ධනය කිරීම, සමාජ හා ව්‍යාපාර භාෂා කුසලතා වැඩි දියුණු කිරීම, ව්‍යාපාර ආරම්භක කළමනාකරණය වැඩිදියුණු කිරීම, සාමය පිළිබඳ දැනුවත්භාවය සහ කුසලතා වැඩි දියුණු කිරීම සහ ශක්තිමත් කිරීම, සාමය පවත්වා ගැනීම සඳහා ආධාරක ක්‍රියාමාර්ග ස්ථාපනය කිරීම මෙම ව්‍යාපෘතියේ මූලික ක්‍රියාකාරකම් වශයෙන් අන්තර්ගත වේ.

අවසන් සමීක්ෂණයේ පරමාර්ථය වූයේ මූලික සමීක්ෂණයේ දී ගොනු කරනු ලැබූ කරුණු කාරණා සංසන්දනය කිරීම හරහා ප්‍රධාන ව්‍යාපෘතියේ කාලය තුළ දී එම ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගෙන ඇති ප්‍රමාණය තක්සේරු කිරීම සහ එම කාලය තුළ දී සිදු කරන ලද හා සිදු වූ වෙනස්කම් අධ්‍යයනය කිරීමයි.

සමීක්ෂණය සඳහා ප්‍රතිලාභී කුටුම්භ 300ක නියැදියක් ‘ස්ථරීකෘත අහඹු නියැදි’ භාවිතා කරමින් තෝරා ගන්නා ලදී. සමීක්ෂණය මගින් පුදුකුඩ්ඉරිප්පු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී වසම් (ගම් පොකුරු) 19ක් ආවරණය කරන ලදී. සමීක්ෂණයේ දත්ත එකතු කිරීම සඳහා KoBo ToolBox භාවිතා කරන ලදී. මීට අමතරව, සවිස්තරාත්මක තොරතුරු රැස් කිරීම සඳහා ව්‍යාපෘති ප්‍රතිලාභීන් සහ පුදුකුඩ්ඉරිප්පු කාන්තා ව්‍යවසායකයින්ගේ සමුපකාර සමිතියෙහි නිලධාරී මණ්ඩලය සමඟ ඉලක්ක ගත කණ්ඩායම් සාකච්ඡා පවත්වන ලදී.

සොයා ගැනීම්:

ප්‍රතිලාභීන්ගෙන් අතිමහත් බහුතරය හිටපු පදිංචිකරුවන් වන අතර සිවිල් ගැටුමෙන් පසු නැවත පදිංචි කරවනු ලැබූ පිරිස් වේ. පුදුකුඩ්ඉරිප්පු දමිළ බස ප්‍රධාන වශයෙන් භාවිතා කරනු ලබන ප්‍රදේශයක් බැවින් ඔවුන්ගෙන් බොහෝ දෙනෙකුට දමිළ භාෂාවෙන් කථනය, කියවීම හා ලිවීම පිළිබඳව යම් ප්‍රවීණතාවයක් ඇත.

EMPOWER ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් පසු යම් දියුණුවක් පෙන්නුම් කළද, ඉංග්‍රීසි හා සිංහල භාෂාවල ප්‍රවීණතාවය තවදුරටත් දුර්වල මට්ටමක පවතී. මූලික දත්ත හා සමානවම, ආහාර නොවන වියදම් වන ණය ආපසු ගෙවීම සහ දරුවන්ගේ අධ්‍යාපනය යන අවස්ථා සඳහා වැඩි ප්‍රතිශතයක් වියදම් කර ඇත. ගණනය කරන ලද ආහාර අනුපාත අගයන් පෙන්නුම් කරන්නේ මාසික වියදමෙන් අඩකට වඩා වැඩි ප්‍රමාණයක් ආහාර ද්‍රව්‍ය සඳහා වියදම් කර ඇති බවයි. ඉහළ ආහාර අනුපාතය සහ ඉහළ ණය ගෙවීම මගින් පෙන්නුම් කරණු ලබන්නේ

ප්‍රතිලාභී කුටුම්භයන්ගේ ජීවන තත්ත්වය නංවාලීම සඳහා තව බොහෝ දියුණු කිරීම් කළ යුතු බවයි. නියැදි කුටුම්භවල ප්‍රධාන ආදායම් මාර්ග ද්විත්වය වන්නේ නිපුණ ශ්‍රමය සහ කෘෂිකාර්මික නොවන නුපුහුණු ශ්‍රමයයි. කෘෂිකර්මාන්තය සඳහා සුදුසු ඉඩම් නොමැතිකම, ඉඩම් හිමිකාරිත්වය පිළිබඳ ගැටලු, දේශගුණික විපර්යාස කෙරෙහි බලපාන සාධක, වන සතුන්ගෙන් සිදුවන හානිය, වාරිමාර්ග හා ජල කළමනාකරණ ගැටලු ප්‍රදේශයේ ජනතාව කෘෂිකර්මාන්තයෙන් ඉවත් කිරීම සඳහා හේතු වී ඇත. මෙම ව්‍යාපෘතිය මගින් මුදල් ආධාර සහ ද්‍රව්‍යමය සහාය මෙන්ම පුහුණුව සහ දැනුවත් කිරීමේ වැඩසටහන් ලබා දී ඇතත්, වෙළඳපළ ප්‍රවේශය ඉහළ නැංවීම කෙරෙහි දක්වා ඇති අවධානය අවම වේ. සහතික කළ දේශීය හා කෘෂිකාර්මික ජල ප්‍රභවයන් නිර්මාණය කිරීමේ ව්‍යාපෘතියේ මැදිහත්වීමත් සමඟ අසල්වැසි ජල ප්‍රභවයන් මත යැපීම අවම වී ඇති අතර කෘෂි ළිං භාවිතය සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පෙර පාංශු හා බෝග යෝග්‍යතා විශ්ලේෂණයන් සිදු කර ඇතත්, බෝග කළමනාකරණය හා අලෙවිකරණය පිළිබඳ දැනුම බෙදා හැරීමේ අඩුලුහුඬුකම් පවතී. විවිධ ආර්ථික කටයුතුවලට කාන්තාවන් සීමා කිරීම සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සම්මතයන් විශාල කාර්යභාරයක් ඉටු කර නොමැත. අධ්‍යාපනය මද වීම සහ භාෂා ගැටලු මත අලෙවිකරණ ක්‍රියාකාරකම් පුළුල් කළ හැකි බාහිර ප්‍රදේශ පිළිබඳ අත්දැකීම් මෙන්ම නිෂ්පාදන සඳහා අලෙවිකරණ අවස්ථා ගවේෂණය කිරීමට බාධාවක් වී තිබේ. සියලුම කෘෂිකාර්මික වැඩසටහන් නිෂ්පාදනයට නැඹුරු වන අතර වෙළඳපළ නැඹුරුව මද වේ. එම වැඩසටහන් කිසිවක් අවසාන නිෂ්පාදනවල අලෙවිකරණ සැකැස්ම හඳුනාගෙන නොමැත.

නිර්දේශ:

රටකජු මෙන් ප්‍රදේශයට ගැළපෙන මුදල් බෝග මෙන්ම, ප්‍රදේශයට නිශ්චිතව දක්වා ඇති අඹ, කෙසෙල් සහ පැපොල් වැනි පලතුරු බෝග සඳහා හිතකර කෘෂි පාරිසරික තත්ත්වයන් ඇති බැවින් කෘෂිකාර්මික සංවර්ධනය සඳහා විශාල විභවයක් ඇත. ඉදිරි කොන්ත්‍රාත් / වෙළඳ ගිවිසුම් (FTAs හෝ FCAs) හරහා මෙය රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයක් ලෙස (PPP) ක්‍රියාත්මක කළ යුතුය.

ඉහළ අලෙවිකරණ අතිරික්තයක් ඇති කිරීම සඳහා සාමූහික අලෙවිකරණ පද්ධති, කැපවූ ආර්ථික මධ්‍යස්ථාන වැනි අලෙවිකරණ මධ්‍යස්ථාන සහ සංවර්ධිත පොළ අලෙවිකරණ පද්ධතිය ස්ථාපිත කිරීම. වියළි කාලවලදී වාරිමාර්ග ජල සැපයුම ඉහළ නැංවීම සඳහා ගත හැකි පියවර ලෙස ජල පොම්ප, ජල නළ / හෝස් සහ උසස් තත්ත්වයේ ක්ෂුද්‍ර වාරිමාර්ග ඒකක හඳුන්වා දීම. ජුනි - අගෝස්තු මාසවල වියළි කාලවලදී කෘෂි ළිං ස්ථාපනය කිරීමට යොමු වීම තුළින් ප්‍රතිලාභීන්ට උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමට හැකි වේ.

ප්‍රදේශයේ වෙසෙන ප්‍රජාවන් සඳහා නළ මාර්ගයෙන් ජල පහසුකම් සැපයීම, විශේෂයෙන් පානීය, ආහාර සැකසුම් සහ වෙනත් ගෘහස්ථ අරමුණු සඳහා ජල හිඟයට විසඳුමක් ලෙස සහභාගිවන්නන් විසින් හඳුනාගෙන ඇත. අනෙක් ප්‍රජාවන් සමඟ සංහිඳියාව ඇති කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතුය. සාමය ගොඩනැගීම, ප්‍රතිසංවිධානය සහ අනෙකුත් ප්‍රජාවන් සමඟ අන්තර් ක්‍රියාකාරකම්වලට පෙළඹවීම සිදුකළ යුතු අතර රජයේ ආයතනික සැකසුම සමඟ පවතින සහයෝගය තවදුරටත් ප්‍රවර්ධනය කිරීම සිදු කළ යුතුය. අනෙකුත් ජනවාර්ගික කණ්ඩායම් සමඟ ප්‍රතිලාභී කාන්තාවන්ගේ සංහිඳියාව වැඩි කිරීම සඳහා, සමාන ජීවනෝපාය පසුබිමක් ඇති අනෙකුත් ප්‍රජාවන් සමඟ වඩාත් ප්‍රායෝගික අන්තර්ක්‍රියාකාරී ක්ෂේත්‍ර චාරිකා නිර්දේශ කළ හැකිය.

05

මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශය

හෙක්ටර් කොඩ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන්වල පරමාර්ථය වන්නේ ගොවිජන හා ග්‍රාමීය සංවර්ධන කටයුතුවලට සම්බන්ධ පුද්ගලයින්ගේ දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කිරීම සහ එමඟින් ශ්‍රී ලංකාවේ ගොවි ප්‍රජාවේ සමාජ, ආර්ථික තත්ත්වය වැඩිදියුණු කිරීමයි.

හෙක්ටර් කොඩ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයෙහි පුහුණු වැඩසටහන්වල සේවාදායකයින් ක්ෂේත්‍ර නිලධාරීන්, රජයේ සහ රාජ්‍ය නොවන සංවිධානවල ඉහළ නිලධාරීන්, ග්‍රාමීය අංශයේ සංවර්ධන කටයුතුවල නිරත වන නිලධාරීන් සහ ශ්‍රී ලංකාවේ ගොවි ජනතාව ඇතුළු පුළුල් පරාසයකට අයත් වේ.

මෙම අංශය විසින් 2020 වර්ෂය තුළ රට පුරා පවත්වන ලද පුහුණු වැඩසටහන් පහත පරිදි වේ.

1. ගොවි කාන්තාවන් සවිබලගැන්වීම පිළිබඳ පුහුණු වැඩසටහන

ලොව පුරා පිහිටි ගොවිජන සමාජයන්හි කුඩාම ඒකකය තුළ ගොවි කාන්තාවෝ වැදගත් කාර්යභාරයක් ඉටු කරති. ඔවුන්ගේ දෛනික කටයුතු සමඟ කෘෂිකාර්මික කටයුතුවලට සහභාගී වීම තුළින් ජීවන තත්ත්වය උසස් කිරීමට දායක වේ. එහෙත්, ශ්‍රී ලංකාවේ තත්ත්වය තුළ, අනෙක් වෘත්තීන් හා සසඳන විට, ගොවි කාන්තාවන් ප්‍රමාණවත් ආදායමක් උපදන්නේ නැත. ශ්‍රී ලංකාවේ රැකියා කරන කාන්තාවන්ගෙන් 29%කට ආසන්න පිරිසක් කෘෂිකාර්මික අංශයේ සේවයේ නියුක්තව සිටිති. මේ අතර, පවතින සාම්ප්‍රදායික සමාජ ව්‍යුහය, නායකත්වයේ දුර්වලතා, සාම්ප්‍රදායික ආකල්ප, ව්‍යවසායකත්වය පිළිබඳ අල්ප දැනුම, සන්නිවේදන පරතරය, සංවර්ධන ක්‍රියාකාරකම්වලට සහභාගී වීමේ දුර්වලතා, ශ්‍රී ලංකාවේ ගොවි කාන්තාවන්ගේ නෛතික බලය සහ කළමනාකරණ ගැටලු පිළිබඳ දැනුමක් නොමැති වීම හේතුවෙන් එය කාන්තා ගොවි සංවිධාන ක්‍රියාකාරිත්වයට සෘජුවම බලපා තිබේ. එබැවින් නිසි කෘෂිකාර්මික කළමනාකරණ ක්‍රමෝපායන් ගොඩනැංවීමට මෙන්ම කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා කෘෂිකර්මාන්තය සඳහා කාන්තා ගොවීන්ගේ දායකත්වය සහ ඔවුන් මුහුණ දෙන ගැටලු තක්සේරු කිරීම වැදගත් ය.

සාහිත්‍ය මූලාශ්‍රවලට අනුව ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයේ කාන්තා සහභාගීත්වය ප්‍රමාණවත් නැත. එම නිසා ගොවියා සමාජීය, සංස්කෘතික හා ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම තුළින් ගොවි ජනතාව සමෘද්ධිමත් කිරීමේ රජයේ අපේක්ෂාවට සමාන්තරව, කාන්තා ගොවීන් සවිබල ගැන්වීම අත්‍යවශ්‍යයෙන්ම වැදගත් වන අතර එම නිසා මෙම වැඩසටහන සැලසුම් කර තිබුණේ ඔවුන්ගේ සංවිධාන හා කළමනාකරණ නිපුණතා ඉස්මතු වන පරිදිය.

මෙම පුහුණු වැඩසටහනේ පරමාර්ථය වන්නේ "සිතමු" කාන්තා ගොවි සංවිධාන නායිකාවන්ගේ දැනුම, ආකල්ප හා නිපුණතා වැඩිදියුණු කිරීම තුළින් සහ ගොවීන් කෘෂිකාර්මික සංවර්ධන ක්‍රියාවලියේ ක්‍රියාකාරී පාර්ශ්වකරුවන් බවට පත් කිරීම තුළින් ගොවි සංවිධානය සවිබල ගැන්වීමයි. මෙහිදී යෝජනා වී ඇති උපාය මාර්ගය නම් කාන්තා ගොවි සංවිධාන නායකයින්ගේ හැකියාවන් පුහුණුකිරීම් තුළින් ප්‍රවර්ධනය කිරීමයි. මෙම ව්‍යාපෘතිය 2020 දී ආරම්භ කරන ලද අතර එම වසරේම අවසන් විය. මෙම ව්‍යාපෘතියේ ඍජු හා වක්‍ර ප්‍රතිලාභීන් වූයේ මාතලේ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා මධ්‍යස්ථානවලට අයත් කාන්තා ගොවි සංවිධාන නායිකාවන් සහ කෘෂි ව්‍යවසායිකාවන් 1604කි. මෙම ව්‍යාපෘතිය සඳහා අරමුදල් සම්පාදනය කළේ මහා භාණ්ඩාගාරයයි.

පුහුණු කණ්ඩායම :	සංගීත් ප්‍රසාද් ප්‍රනාන්දු	-	සම්බන්ධීකරණ නිලධාරී/සම්පත්දායක
	එස්.එම්.ඒ සමරකෝන්	-	සම්පත්දායක
	එච්.එම්.ජේ.කේ හේරත්	-	සම්පත්දායක පළාත් සහ අන්තර් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවල සම්පත් දායකයින්

අවසන් නොකළ අධ්‍යයන

01. ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තය සඳහා (පොල් මද ආශ්‍රිත නිෂ්පාදන) ගෙවතු තුළ පොල් වගාවේ බලපෑම සොයා බැලීම

පර්යේෂණ කණ්ඩායම:	ජී.වී.එන්. අයෝමි	-	සම්බන්ධීකාරක
	පී.සී.ජේ. ද සිල්වා	-	සහාය පර්යේෂක
	එස්.ජී. ප්‍රනාන්දු	-	සහාය පර්යේෂක
	එස්.එම්.ඒ සමරකෝන්	-	සහාය පර්යේෂක
	අයි.වී කුරුප්පු මහතා	-	සහාය පර්යේෂක

මූල්‍ය ප්‍රතිපාදන: භාණ්ඩාගාර අරමුදල

විෂය පථය සහ අරමුණු :

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ ජාතික පොල් නිෂ්පාදනය ඉහළ නැංවීම කෙරෙහි ගෙවත්තේ විභවතාවය සොයා බැලීමයි.

විශේෂිත අරමුණු වන්නේ,

- ගෙවතු තුළ පොල් නිෂ්පාදනයේදී මුහුණු දෙන දුෂ්කරතා සහ අනෙකුත් සාධක හඳුනා ගැනීම .
- දැනට ගෙවතු තුළ පොල් නිෂ්පාදනය ඇස්තමේන්තු කිරීම හා ගෙවතු තුළ පොල් නිෂ්පාදනයේ විභවතාවය සොයා බැලීම.
- මාසික ගෘහස්ථ පොල් පරිභෝජනය ගණනය කිරීම.

- ගෙවතු තුළ පොල් නිෂ්පාදනයට බලපාන ගැටලු හා දුෂ්කරතා අඩුකර ගැනීමේ ක්‍රම සොයා බැලීම මගින් පොල් නිෂ්පාදනය ඉහළ නැංවීමේ ක්‍රම යෝජනා කිරීම.

3) මේ දක්වා පර්යේෂණ සැලැස්ම අනුව සම්පූර්ණ කරන ලද ක්‍රියාකාරකම්

2020 නොවැම්බර් මාසයේදී ඉංග්‍රීසි සංස්කරණය සඳහා වාර්තාව යවා ඇත.

4) නිර්දේශ

1) කුටුම්භ සඳහා නිර්දේශ

1. පවතින ඉඩ ප්‍රමාණය අනුව නාගරික හා අර්ධ නාගරික ගෙවතුවල (පර්චස් **40**ට අඩු ගෙවතු)පොල් බීජ පැළ සිටුවීමෙන් ගෙවතුවල හිඩැස් පිරවීම ප්‍රවර්ධනය, ගෙවත්තේ ඇති ඉතිරි ඉඩ තුළ (පොල් වගා කිරීමේ මණ්ඩලයේ නිර්දේශ අනුව) ගස් එකක්, දෙකක් සහ තුනක් සිටුවීමෙන් පරතරය පිරවීමේ හැකියාව පර්යේෂණයෙන් හඳුනාගෙන ඇත. ගස්වල පරතරය පිරවීමේ හැකියාව ගම්පහ එක් ගසකින් **39%**, ගස් දෙකකින් **26%**, ගස් තුනකින් **4%** ද කුරුණෑගල එක් ගසකින් **44%**,ගස් දෙකකින් **30%**, ගස් තුනකින් **6%** ද පුත්තලම එක් ගසකින් **48%**, ගස් දෙකකින් **30%**, ගස් තුනකින් **8%**ක් වේ. මෙය ජාතික නිෂ්පාදනය වැඩි කිරීමට උපකාරී වේ.

2. කුටුම්භ විසින් අනාගත වගාව සඳහා වඩාත් කැමති විවිධත්වය.

   මෙම අධ්‍යයනයේ එක් එක් ප්‍රභේදය පිළිබඳ ඔවුන්ගේ නිරීක්ෂණ සටහන් කරන ලදී. ගම්පහ **DXT 55%**, උස වර්ග **41%** සහ විවිධත්වයන් දෙකටම කැමතියි **2%**කි. කුරුණෑගල **DXT 56%**, උස වර්ග **37%** සහ විවිධත්වයන් දෙකටම කැමතියි **6%** ද පුත්තලම **DXT 58%**, උස වර්ග **39%** සහ විවිධත්වයන් දෙකටම කැමතියි **4%** ද වේ.

3. පොල් මිලදී ගැනීම සඳහා අධ්‍යයන ප්‍රදේශයේ ජනතාවට මසකට සාමාන්‍යයෙන් රුපියල් **2100**ක් වැය කිරීමට සිදුවේ (පොල් ගෙඩියක මිල රුපියල් **55**කට). එය ශ්‍රී ලංකාවේ මසකට මධ්‍ය කුටුම්භ ආදායමක සාමාන්‍ය මාසික ඉපැයුමෙන් **7%**කි. පොල් මිල මිලදී ගැනීම සඳහා මාසික වැය කිරීම, අනුපාතය පවත්නා පොල් ගෙඩියක මිලට සමානුපාතිකව වැඩි වේ.

4. ක්ෂේත්‍ර සමීක්ෂණ දත්තවලට අනුව, පොල් ගස් දෙකක් (DT දෙමුහුන් ප්‍රභේදයෙන් **100 -120** / ගෙඩි / ගස / වසරකට) **4**දෙනෙකුගෙන් යුත් පවුලක වාර්ෂික පොල් අවශ්‍යතාවය සපුරා ගත හැකිය. අපගේ සමීක්ෂණ අධ්‍යයනය මගින් අධ්‍යයනය කරන ලද ප්‍රදේශයේ සාමාන්‍ය කුටුම්භයක ප්‍රමාණය හතරක් වන අතර වාර්ෂික ගෘහස්ථ පොල් අවශ්‍යතාවය ගෙඩි **360**කට ආසන්න ප්‍රමාණයක් ලෙස නිරීක්ෂණය විය. (පොල් කිරි ලබා ගැනීම සඳහා බ්ලෙන්ඩර් හෝ ගල් ඇඹරුම් උපකරණ භාවිතා කිරීමෙන් මෙම ප්‍රමාණය අඩු කර ගත හැකිය). පොල් පර්යේෂණ ආයතනයේ පර්යේෂණ සොයා ගැනීම්වලට අනුව සාම්ප්‍රදායික පොල් කිරි

නිස්සාරණය කිරීමේ ක්‍රමය හේතුවෙන් ගෘහස්ථ පොල් අවශ්‍යතා වලින් 30%- 40% (ගෙඩි මිලියන 800 කට ආසන්න) අපතේ යනු ඇත. මෙම මුදල ජාතික පොල් නිෂ්පාදනයෙන් 30%කි. බ්ලෙන්ඩර් සහ ගල් ඇඹරුම් උපකරණ භාවිතා කිරීමෙන් මෙම ගැටලුව අවම කර ගත හැකිය.

5. විශ්ලේෂණයට අනුව පොහොර යෙදීම පොල් ගෙඩි නිෂ්පාදනය සඳහා සැලකිය යුතු බලපෑමක් ඇති කරයි. පොහොර භාවිත ගෙවතු පොහොර රහිත ගෙවතු වලට වඩා පොල් නිෂ්පාදනය සාමාන්‍යයෙන් 9.82 ගුණයකින් වැඩි විය. පාංශු කළමනාකරණය, පුහුණු කිරීම සහ වැඩමුළු තුළින් පාංශු කළමනාකරණය වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගෙන ඇත.

6. විශ්ලේෂණයට අනුව, වාර්ෂිකව පොල් ගෙඩි නිෂ්පාදනය සඳහා පළිබෝධකයන් හා සතුන්ගෙන් සිදුවන බලපෑම් සැලකිය යුතු බව සොයා ගන්නා ලදී. අස්වැන්න අලාභය ජාතික නිෂ්පාදනයෙන් 15%කි.

2) පොල් මද ආශ්‍රිත කර්මාන්තය සඳහා නිර්දේශ

1. කර්මාන්තය වැඩි දියුණු කිරීම සඳහා යෝජනා

- පර්යේෂණ දත්ත වලට අනුව, ප්‍රධාන වශයෙන් පොල් මද පදනම් කරගත් නිෂ්පාදන කර්මාන්තයට එහි නිමැවුම් සඳහා ස්ථාවර මිලක් අවශ්‍ය වේ. පොල් පදනම් කරගත් නිෂ්පාදන කර්මාන්තය රට පුරා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ දිරිගැන්වීම තුළින් ග්‍රාමීය සංවර්ධනය සඳහා කදිම කර්මාන්තයකි.

- අනෙකුත් ආසියානු රටවලට සාපේක්ෂව පොල් කර්මාන්තයේ ඵලදායිතාව ශ්‍රී ලංකාවේ බෙහෙවින් අඩු බව අධ්‍යයනයෙන් පෙන්වා දී ඇත. මෙම ගැටලුව මඟහරවා ගැනීම සඳහා හොඳ කළමනාකරණ භාවිතයන් අනුවර්තනය වීම අවශ්‍ය වේ. ඒ හා සමානව, උසස් ප්‍රමිතීන් පවත්වා ගැනීම සඳහා සැකසුම් අංශයේ නවීන තාක්ෂණය පිළිබඳ දැනුමේ අවශ්‍යතාව අවධාරණය කළහ. ජාත්‍යන්තර වෙළඳපළවල අවශ්‍යතා සපුරාලීමේදී මෙය ඉතා වැදගත් අංගයකි.

2. පොල් මත පදනම් වූ නිෂ්පාදකයින් විසින් කරන ලද ප්‍රධාන යෝජනා

- කුඩා පරිමාණයේ පොල්තෙල් මෝල්, ෆාම් තෙල් මිල සමඟ තරඟ කිරීම දුෂ්කරය. නව තාක්ෂණය හා යන්ත්‍රෝපකරණ හඳුන්වා දීමෙන් ඔවුන්ට ෆාම් තෙල් මිල සමඟ තරඟ කළ හැකිය.

- නිෂ්පාදන කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා පොල් මෝල්වලට නව යන්ත්‍රෝපකරණ අවශ්‍ය බව ඩෙසිකේටඩ් පොල් මෝල් හිමිකරුවන් අවධාරණය කළහ. අන්තර්ජාතික වෙළෙඳපොළ තුළ නව අගය එකතු කළ නිෂ්පාදන සඳහා ඇති අවස්ථාවන් වර්ධනය වීමත් සමඟ පොල් සහ එහි අගය එකතු කළ නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම වැඩි වේ. රට තුළ තාක්ෂණික සංවර්ධනය හා තාක්ෂණික ව්‍යාප්තිය අතර සැලකිය යුතු පරතරයක් ඇත. පර්යේෂණ මගින් ජනනය කරන ලද තාක්ෂණයන් පාර්ශ්වකරුවන් වෙත ව්‍යාප්ති ක්‍රමවේදය වැඩි දියුණු කිරීම සහ ප්‍රවර්ධනය කිරීම, වෙළඳපළ පර්යේෂණ, සහ වෙළඳ ප්‍රදර්ශන යනාදිය තුළින් නව වෙළඳපළ හඳුනා ගැනීම වැදගත් වේ.

06

භූගෝල විද්‍යා තොරතුරු තාක්ෂණික ඒකකය

1. නිෂ්පාදකයින්, විකුණුම්කරුවන් සහ පාරිභෝගිකයින් අතර වෙළඳපළ සම්බන්ධතාවයක් ඇති කිරීම සඳහා මෘදුකාංගයක් වැඩිදියුණු කිරීම

පර්යේෂණ කණ්ඩායම :	එච්.එම්.ජේ.කේ හේරත් මහතා	සම්බන්ධීකරණ නිලධාරී
	බී.පුලස්ති මහතා	මෘදුකාංග ඉංජිනේරු
	(නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් මධ්‍යස්ථානය)	
මූල්‍ය ප්‍රභවය:	ඒකාබද්ධ අරමුදල	

මෘදුකාංගයේ නම : සුපිරි පොළ

විෂයපථය සහ අරමුණු

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ කෘෂිකාර්මික නිෂ්පාදන වෙළඳපොළේ සැපයුම්කරුවන් සහ පාරිභෝගිකයින් අතර සහායක සේවා (එළවළු, පලතුරු, බීජ සහ පැළෑටි, ආයුර්වේද නිෂ්පාදන, කාබනික පොහොර, ධීවර, යන්ත්‍රෝපකරණ සේවා ආදිය) අතර සම්බන්ධතාවක් ඇති කිරීම සහ ඒ තුළින් සමස්ත සැපයුම් දාමය එකම වේදිකාවක් මතට ගෙන ඒමය. යෝජිත ක්‍රමය මඟින් කෘෂිකාර්මික නිෂ්පාදන වෙළඳපොළ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව වැඩි කරන අතර නාස්තිය අවම කෙරේ.

මෙම ව්‍යාපෘතියේ විෂයපථය නම් අතරමැදියන් සංඛ්‍යාව අඩු කිරීමෙන් සමස්ත කෘෂිකාර්මික සැපයුම් දාමයම එකම වේදිකාවක් වෙත ගෙන ඒම සඳහා පරිපාලක මොඩියුලය සමඟ පරිශීලක හිතකාමී ජංගම යෙදුමක් සහිත දත්ත සමුදායක් සැලසුම් කිරීම, තැනීම සහ ක්‍රියාත්මක කිරීම ය. මෘදුකාංගය පරිශීලනය කරන්නන්ගට දත්ත සහ තොරතුරු යාවත්කාලීන කිරීම, සැකසීම, කළමනාකරණය කිරීම සහ බැලීම සඳහා අදාළ පුද්ගලයින්ට ප්‍රවේශ වීමට අවසර දෙනු ඇත.

යෝජිත අයදුම්පතේ අඩංගු වනුයේ,

- සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම
- දිස්ත්‍රික්ක වශයෙන් සැපයුම්කරුවන් සොයා ගැනීමට පහසුකම
- දිස්ත්‍රික්ක වශයෙන් ගනුදෙනුකරුවන් සොයා ගැනීමට පහසුකම
- සැපයුම්කරු සහ පාරිභෝගික ශ්‍රේණිගත කිරීමේ පද්ධතිය
- සිංහල මාධ්‍යයෙන් පද්ධතිය සහ දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කිරීමට පහසුකම් සැලසීම
- වැටි කිරීමට සහ වෙළඳ දැන්වීම් ගැන අදහස් දැක්වීමට පහසුකම්
- ලියාපදිංචි පරිශීලකයින්ට පරිශීලක ගිණුම් විස්තර පරීක්ෂා කිරීමට සහ විස්තර වෙනස් කිරීමට සහ ඉවත් කිරීමට පහසුකම්
- පාලකට වෙළඳදැන්වීම් අනුමත කිරීමේ සහ විමර්ශනය කිරීමේ හැකියාව
- පැරණි දත්ත තබා ගැනීමේ පහසුකම

07

සංඛ්‍යාන හා දත්ත සැකසුම් අංශය

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ අරමුණු අනුව කෘෂි අංශයේ තොරතුරු රැස්කිරීම, ඒවා යාවත්කාලීන කිරීම, විශ්ලේෂණය සහ බෙදා හැරීම සඳහා ගන්නා ලද ඒකාබද්ධ උත්සාහයක් අනුව සංඛ්‍යාන හා දත්ත සැකසුම් අංශය ස්ථාපනය කර ඇත. මෙම අංශය, ආයතනය විසින් කරනු ලබන සමාජ - ආර්ථික සමීක්ෂණවල දත්ත ගබඩා කිරීම සහ විශ්ලේෂණයට අමතරව ආයතනයේ අභිමතාර්ථ වෙනුවෙන් පහත සඳහන් ඉලක්කයන් සපුරා ගැනීම සඳහා සහාය වනු ඇත.

- කෘෂිකාර්මික තොරතුරු කළමනාකරණය පිළිබඳ විශිෂ්ටතම ජාතික මධ්‍යස්ථානයක් වීම.
- සංඛ්‍යාලේඛන හා තොරතුරු තාක්ෂණ යෙදීම තුළින් පර්යේෂණ හා පුහුණු කටයුතුවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා ක්‍රියාකරන ප්‍රධාන අංශයක් වීම
- වත්මන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මෙවලම් හා තාක්ෂණ යොදා ගනිමින් ස්වයංක්‍රීය තොරතුරු සැකසුම් පද්ධති වැඩි දියුණු කිරීම

මෙම අංශය දත්ත සංවර්ධන හා දත්ත සැකසුම් ලෙස ඒකක දෙකකින් සමන්විත ය. පසු කාලීනව, පරිගණක සහ පරිගණක ජාලකරණ යටිතල පහසුකම් සැපයීම සඳහා පරිගණක තාක්ෂණ ඒකකයක් ද ස්ථාපනය කරන ලදි.

දත්ත සංවර්ධන අංශය

කෘෂිකාර්මික සංවර්ධනයට අදාළ ක්ෂේත්‍රවල තොරතුරු එක්රැස් කිරීම, ගබඩා කිරීම සහ සේවා සැපයීමේ නියෝජිත ආයතනයක් ලෙස කෘෂිකාර්මික දත්ත බැංකුව, දත්ත සංවර්ධන ඒකකය තුළ ස්ථාපිත කර ඇත. එය විශේෂයෙන් සැලසුම් කර ඇත්තේ රජයේ නිලධාරීන්, ප්‍රතිපත්ති සම්පාදකයින්, පර්යේෂකයින් සහ වෙනත් උනන්දුවක් දක්වන පාර්ශ්වයන් සඳහා පුළුල් සංඛ්‍යාලේඛන මූලාශ්‍රයක කාර්යභාරය ඉටු කිරීම සහ තොරතුරු ප්‍රයෝජනවත් ආකාරයකින් බෙදා හැරීම සම්බන්ධීකරණය කිරීම සඳහා ය.

දත්ත බැංකුව දත්ත ආකාර දෙකකින් සමන්විත වේ. ඒ සංවර්ධන දර්ශක සහ සමීක්ෂණ ලේඛනාගාරය වශයෙනි. සංවර්ධන දර්ශක යනු විවිධ ලක්ෂණ මත රාජ්‍ය ආයතනවලින් එකතු කරන ලද ද්විතීයික සංඛ්‍යාලේඛන වන අතර සමීක්ෂණ ලේඛනාගාරය මඟින් ආයතනය විසින් කරන ලද ක්ෂේත්‍ර සමීක්ෂණ තුළින් ජනනය කරන ලද මූලික දත්ත ඇතුළත් වේ. දත්ත බැංකුව උපදේශන, පරිශීලක සහ සැපයුම් අධ්‍යාපනය, පරිගණක භාවිතය පිළිබඳ පුහුණුව සහ තොරතුරු ලබා ගැනීම සහ සැකසීම සඳහා සහාය වීම සඳහා දැනුවත් කිරීමේ සේවාවක් ද සපයයි.

මෙම අංශය පිහිටුවීමේදී කෘෂිකර්මාන්තය, ධීවර කර්මාන්තය, වන වගාව සහ කර්මාන්ත යන ක්ෂේත්‍ර සඳහා විභවතාවක් සහිත ක්ෂේත්‍ර වුවද කෘෂිකාර්මික අංශය පිළිබඳ තොරතුරු සඳහා ප්‍රමුඛතාවය දෙනු ලැබීය. කෘෂිකාර්මික අංශය යටතේ කෘෂිකාර්මික සංවර්ධනයේ විවිධ පැතිකඩයන් සහ ගොවිපළ කුටුම්භයන්ගේ ජීවන තත්වයන් පිළිබඳ සවිස්තරාත්මක ආවරණයක් සිදු කළ හැකි බව සලකා බලන ලදී. මේ අනුව දර්ශක 1800 ක් පමණ සඳහා මාසිකව, කන්නමය වශයෙන් සහ වාර්ෂිකව එකතු කෙරෙන තොරතුරු ප්‍රමාණය ජනගහනය, රැකියා, ඉඩම් පරිහරණය, ඉඩම් ජනාවාස, පොහොර, නිෂ්පාදන පිරිවැය, අලෙවිකරණය යනාදී පුළුල් පරාසයන්ට වැටේ.

ප්‍රධාන බෝග කණ්ඩායම් **11** යටතේ, එනම්. ධාන්‍ය වර්ග, එළවළු, පලතුරු, අල මුල්, පශු සම්පත්, කාර්මික භෝග, කුළු බඩු, රනිල කුලයට අයත් බෝග, තෙල් බීජ, වැවිලි සහ වෙනත් භෝග පිළිබඳව තොරතුරු ලබා ගත හැකිය. දැනට, මෙම මධ්‍යස්ථානය **1950** ගණන්වල සිට අතින් සහ පරිගණක ගත ආකාරයෙන් ගබඩා කර ඇති වාර්තා මිලියන **2.8**කින් සමන්විත වේ. ඒ අනුව, මහ බැංකුව, රේගු දෙපාර්තමේන්තුව, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ අප ආයතනයේ අලෙවි හා ආහාර ප්‍රතිපත්ති අංශය වැනි විවිධ ප්‍රභවයන්ගෙන් එකතු කරන ලද දිස්ත්‍රික් වශයෙන් දත්ත ඇතුළත් දත්ත ගබඩාවක් හෙක්ටර් කොඛ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ තොරතුරු මධ්‍යස්ථානය විසින් පවත්වා ගෙන යනු ලබයි.

දත්ත සමුදායන් තුළ තොරතුරු ලබා ගැනීම සඳහා අංශය තුළ ස්වයංක්‍රීය පද්ධතියක් ක්‍රියාත්මක කර ඇත. තවද, දැඩි ඉල්ලුමක් ඇති සමහර තොරතුරු වෙබ් අඩවියේ ගබඩා කර ඇත. කෘෂිකාර්මික තොරතුරු ලබා ගැනීම සඳහා බාහිර හා අභ්‍යන්තර පරිශීලකයින්ට සෘජුවම සංඛ්‍යාන හා දත්ත සැකසුම් අංශය හා සම්බන්ධ විය හැකිය.

ඉහත සංවිධාන විසින් ප්‍රකාශයට පත් කරන ලද වෙබ් අඩවි සහ පෙළ පොත් වලින් දත්ත එකතු කිරීම සිදු කරන ලදී. හෙක්ටර් කොඛ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයෙහි අලෙවි හා ආහාර ප්‍රතිපත්ති අංශයෙන් ආහාර වෙළඳ භාණ්ඩ මිල ගණන් එකතු කරන ලදී.

වර්ෂය තුළ පහත සඳහන් තොරතුරු රැස් කරන ලදි.

- ආනයන – 2018
- අපනයන – 2019
- නිෂ්පාදක මිල – 2019
- පශුසම්පත් දත්ත **-2015-2019**
- බිම් ප්‍රමාණය - 2018-2019
- නිෂ්පාදනය - 2019
- අස්වැද්දූ බිම් ප්‍රමාණය – 2019

පරිගණකගත දත්ත සමුදාය වර්ෂය තුළ පහත දැක්වෙන දර්ශක සමඟ යාවත්කාලීන කරන ලදී.

- වී පිළිබඳ සංඛ්‍යාලේඛන – බිම් ප්‍රමාණය හා නිෂ්පාදනය **-2020**
- නිෂ්පාදක මිල – 2019
- සිල්ලර මිල - 2019
- යල හා මහ කන්නයන්හි බිම් ප්‍රමාණය හා නිෂ්පාදනය සහ **2019** වර්ෂයේ සමස්තය
- අස්වැද්දූ බිම් ප්‍රමාණය **-2018, 2019**

ඉහත දර්ශකයන්ට අයත් වාර්තා 72,904ක් සමඟ දත්ත සමුදාය යාවත් කාලීන කරන ලදී.

ඉල්ලුම මත දත්ත සැපයීම

කෘෂිකාර්මික තොරතුරු සඳහා ඉල්ලීම් **80**ක් අභ්‍යන්තර හා බාහිර භාවිතා කරන්නන්ගෙන් කරන ලදී. **62**ක් අභ්‍යන්තර වූ අතර **18**ක් බාහිර ඉල්ලීම් විය.

දත්ත රැස් කිරීම සඳහා පරිශීලනය කළ පොත්

1. ආර්ථික හා සමාජ විද්‍යාත්මක දත්ත - මහ බැංකුව **2019**
2. ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාන සාරාංශය -2019

08

පුස්තකාලය

පුස්තකාලයේ ප්‍රධාන පරමාර්ථය වන්නේ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ පර්යේෂණ කාර්ය මණ්ඩලයේ සහ අනෙකුත් උනන්දුවක් දක්වන පුද්ගලයින්ගේ සහ සංවිධානවල ප්‍රයෝජනය සඳහා කෘෂිකාර්මික අංශයට අදාළ තොරතුරු එක්රැස් කිරීම, ගොනු කිරීම සහ තොරතුරු අවශ්‍යතා සැපයීම වේ. වර්ෂය තුළ කාර්ය මණ්ඩලයේ විමර්ශන අවශ්‍යතා වෙනුවෙන් ග්‍රන්ථ 258ක්, ද විමර්ශන කෘති 16ක් සහ වාර ප්‍රකාශන 18ක් ද නිකුත් කර තිබේ. වර්ෂය තුළ පුස්තකාලයට පැමිණි බාහිර පාඨකයින්ගේ සංඛ්‍යාව 105කි.

පොත්,සඟරා සහ වාර ප්‍රකාශන අත්පත් කර ගැනීම

කොවිඩ් 19 වසංගතය හේතුවෙන් මෙම වර්ෂය තුළ පුස්තකාලය මාස කිහිපයක් තිස්සේ වසා දමා තිබූ අතර නව පොත් සහ සඟරා මිලදී ගෙන නොමැත.

වර්ෂය තුළදී පුස්තකාලයට පරිත්‍යාග වශයෙන් පොත් 32ක් සහ විවිධ කලාපවල සඟරා / සඟරා 53ක් ලැබුණි.

පුස්තකාල සේවා

පර්යේෂණ කාර්ය මණ්ඩලයේ සහ බාහිර පාඨක ඉල්ලීම් පරිදි තොරතුරු සහ ප්‍රලේඛන සේවාවන් වන සාහිත්‍ය ගවේෂණය, විමර්ශන සේවා, කාලීන තොරතුරු පිළිබඳ දැනුවත් කිරීම් සහ ඡායා පිටපත් සේවාවන් සපයන ලදී.

පුස්තකාලය තුළ නවීන වයිෆයි පහසුකම ලබා ගැනීමත් සමඟ අන්තර්ජාල පාදක තොරතුරු පහසුකම් සඳහා වූ ප්‍රවේශය පර්යේෂණ කාර්ය මණ්ඩලය සඳහා තව දුරටත් පුළුල් කරන ලදී. පර්යේෂණ කාර්ය මණ්ඩලය සහ බාහිර පාඨකයින් සඳහා විවිධ විෂයන් යටතේ පවත්වාගෙන යන පුවත්පත් ලිපි එකතුව ක්ෂණික විමර්ශනය සඳහා අඛණ්ඩ අනුක්‍රමිකගත කොට ඇත.

අන්තර් පුස්තකාල සහයෝගීතාවය (ILC)

යම්කිසි පුස්තකාල ද්‍රව්‍යයක් අප පුස්තකාලයේ හෝ වෙනත් විශේෂ පුස්තකාලයක නොමැති විට අන්තර් පුස්තකාල සහයෝගීතා ක්‍රමය මඟින් පුස්තකාල ද්‍රව්‍ය හුවමාරු කර ගැනීමේ පහසුකම අප පුස්තකාලය සතුව පවතී. එය ආයතනික මට්ටමින් සිදු විය යුතු අතර අන්තර් පුස්තකාල සහයෝගීතාව සඳහා ඉල්ලුම් කරන පුස්තකාල මූලින්ම එකඟතාවයකට/ නීති පද්ධතියකට යටත්ව අත්සන් කොට පුස්තකාල ද්‍රව්‍යය හුවමාරු කර ගත හැක. තවද, අපගේ පර්යේෂණ අවශ්‍යතාවයන් සඳහා විද්‍යුත් ලිපි මඟින් විශ්වවිද්‍යාල අතර ලියකියවිලි හුවමාරු කර ගැනීම ද සිදු කරනු ලබයි.

2020 වර්ෂයේ ජාතික ඒකාබද්ධ සුචිය යාවත් කාලීන කිරීම සඳහා ග්‍රන්ථ විද්‍යාත්මක මූලාශ්‍ර පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය වෙත පුස්තකාල දත්ත ගබඩාව තුළින් සපයන ලදී.

ආයතන ප්‍රකාශන සංඛ්‍යාංකගතකරණය (Digitization of Institute Publication)

ජාතික විද්‍යා පදනම මඟින් ආරම්භ කරන ලද ආයතන ප්‍රකාශන සංඛ්‍යාංකකරණය ව්‍යාපෘතිය මඟින් අප ආයතනයේ ප්‍රකාශන සංඛ්‍යාංකකරණය කර ඇති අතර (http://harti.nsf.ac.lk/) මඟින් ඒ සඳහා ප්‍රවේශ විය හැකිය.

මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වන්නේ ආයතනික විද්‍යුත් ප්‍රකාශන එකතුවක් පවත්වාගෙන යාම හා මාර්ගගත ප්‍රවේශය මගින් ඉක්මනින් ප්‍රකාශනවල ඇතුළත් තොරතුරු ලබා ගැනීමේ පහසුකම් සැලසීමයි.

ආයතන ප්‍රකාශන	එකතු නාමය	වර්ෂය තුළ භාවිතා කළ පිරිස
	වාර්ෂික වාර්තා (සිංහල)	90
	වාර්ෂික වාර්තා (දමිළ)	50
	පනත්	46
වාර ප්‍රකාශන	Sri Lanka Journal of Agrarian Studies	80
	ගොවි කටයුතු අධ්‍යයනය	130
	ගොවි ජනතා	90
	ගොවි ජනතාව	120
පර්යේෂණ වාර්තා	පර්යේෂණ වාර්තා (සිංහල)	132
	පර්යේෂණ වාර්තා (දෙමළ)	120

රට	භාවිතා කළ පිරිස
ජපානය	275
ශ්‍රී ලංකාව	658
ඇමරිකාව	198
ජර්මනිය	68
රුසියාව	121
ප්‍රංශය	47
දකුණු කොරියාව	32
අයිවරි කෝස්ට්	12
යුරෝපා සංගමය	22
ඕස්ට්‍රේලියාව	19
ඉන්දියාව	60
ඉතාලිය	9
එක්සත් රාජධානිය	11
චීනය	20
එක්සත් අරාබි එමීර් රාජ්‍යය	5
ස්විස්ටර්ලන්තය	10
පිලිපීනය	12

පුස්තකාල ප්‍රවර්ධන වැඩසටහන්

පුස්තකාලය ප්‍රවර්ධන අත් පත්‍රිකාවක් විශ්වවිද්‍යාල සිසුන් සහ බාහිරින් පැමිණෙන පාඨකයින් අතර බෙදා හරිනු ලැබේ

09

ප්‍රකාශන ඒකකය

ප්‍රකාශන ඒකකය, අංශ ප්‍රධාන, සංඛ්‍යාන හා දත්ත සැකසුම් / ප්‍රකාශන / පුස්තකාල හා භූවිද්‍යා තොරතුරු පද්ධති ඒකකය යටතේ ක්‍රියාත්මක වේ. පර්යේෂණ වාර්තා, කාලීන වාර්තා, සඟරා, පුවත් හසුන්, විවරණිකා, අත්පොත් , අත් පත්‍රිකා සහ අනෙකුත් ප්‍රකාශන භාෂා ත්‍රිත්වයෙන් ම සංස්කරණය කොට ප්‍රකාශයට පත් කිරීම සිදු කෙරෙන්නේ මෙම ඒකකයෙනි. එමෙන් ම, අදාළ විද්‍යුත් වැඩසටහන් සැකසීම හා සම්බන්ධීකරණය සිදු වේ.

මෙම වසර තුළ පර්යේෂණ වාර්තා 11ක් සිංහල හා ඉංග්‍රීසි භාෂාවෙන් ප්‍රකාශයට පත් කර තිබේ. ඊට අදාළ විස්තර පහත දැක් වේ.

පර්යේෂණ වාර්තා

1. ඌව සහ නැගෙනහිර වනජීවී කලාප ආශ්‍රිත මිනිස් වනඝත්ත්ව ගැටුමෙහි ස්වභාවය, තත්ත්වය සහ වත්මන් ප්‍රවණතා
2. An assessment of '' women farmer's organizations and empowerment needs
3. Access to and utilizations of Microfinance by Rural Poor in Uva Province
4. Possibilities to Minimize Pesticide Usage in Sri Lanka Paddy Cultivation : An Emphasis on Risk Management
5. Potential of Promoting Rainwater As a Source of Safe Water for Consumption in North Central Province of Sri Lanka
6. Importance of Indigenous Knowledge for food Security : In relation to paddy cultivation
7. Consumer Buying Behavior and Preference for Liquid and Powdered Milk
8. Government intervention in paddy Marketing : Issues in purchasing and post stock Management
9. Export Market for Organic Food : Present Status , constraints and Future scope
10. Ban on Polythene Bags and Lunch Sheets in Sri Lanka : Impact, Challenges and Alternatives
11. Good Agricultural Practices (GAP) In Sri Lanka : Status, Challenges and Policy Interventions

මෙයට අමතරව, 2019 වර්ෂය තුළ පහත සඳහන් වාර ප්‍රකාශනයන් නිකුත් කරන ලදී.

1. ගොවි ජනතා (සිංහල) 22 වෙළුම 01 වැනි කලාපය 2020
2. ගොවි ජනතා (සිංහල) 22 වෙළුම 02 වැනි කලාපය 2020

3. ගොවි ජනතා (සිංහල) 22 වෙළුම 03 වැනි කලාපය 2020
4. ගොවි ජනතා (සිංහල) 22වෙළුම 04 වැනි කලාපය 2020
5. ගොවිකටයුතු පුවත් හසුන, 43 වෙළුම, 2019 සිව්වන කලාපය
6. ගොවිකටයුතු පුවත් හසුන, 44 වෙළුම, 2020 පළමු හා දෙවන කලාපය (වෙබ් අඩවියට උඩුගත කර ඇත.)

වර්ෂය තුළ ජාතික පුවත්පත් සඳහා සම්පාදනය කළ ලිපි

	ලිපිය	පුවත්පත	දිනය
1	සහල් එළවළු මිල ගැන අනාවැකියක්	දිනමිණ	**2020 ජනවාරි 07**
2	Reviving the Granary of the East	Daily news	පෙබරවාරි **2020 19**
3	COVID-19 and its impact on food supply chains	Daily News	මැයි **2020 28**
4	කෘෂි ඉඩමෙන් වැඩි ඵලදායිතාවකට ඉඩම් ඒකාබද්ධකරණය	දිනමිණ	**2020 ජූලි10**
5	යල කන්නයේ වීවලට හොඳ කලක්	අරුණ	**2020**අගෝස්තු**10**
6	කෘෂිකාර්මික සංවර්ධනයේ පර්යේෂණ සහ සංවර්ධන ආයෝජන	දිනමිණ	**2020**අගෝස්තු**05**
7	37th Death Anniversary of Hector Kobbekaduwa tomorrow: He was the Farmers' Friend	Daily News	2020 September 17
8	World Food day tommororw - Food Safety a major concern in national Food security	Daily News	2020 October 15
9	වවමුකොරෝනා ...පෝෂණය වෙමු තිරසරව ... ...වසංගතය හමුවේ	දිවයින	**2020**ඔක්තොම්බර් **19**
10	Highlights from Hector Kobbekaduwa commemoration lecture: His vision, a link to Vistas of Prosperity and Splendour	Daily News	2020October 20
11	Restaging Z-Score Debacle	The Island	2020November 13
12	Strategies towards self-sufficiency in milk	Daily News	2020December 02

10

වෙනත් ක්‍රියාකාරකම්

පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීම්

පර්යේෂණ නිලධාරී ඩී.එම්.ඒ.සී දිසානායක මහතා **2020** පෙබරවාරි **14** දින රුහුණු විශ්ව විද්‍යාලය විසින් සංවිධානය කරන ලද සමුළුව සඳහා පහත සඳහන් මාතෘකා තුනට අදාළව පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කළේය.

i. ශ්‍රී ලංකාවේ අම්පාර සහ මොනරාගල දිස්ත්‍රික්කවල ප්‍රධාන ධාන්‍ය වගා කරන ගොවි ප්‍රජාවන් අතර වනජීවී ගැටුමේ ස්වභාවය සහ විශාලත්වයේ ස්වභාවය සහ එයට මුහුණ දෙන ආකාරය
ii. කෘෂිකර්මාන්තය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය **(Information and Communication Technology - ICT)** භාවිතය පිළිබඳ ගොවියාගේ අවබෝධය: ශ්‍රී ලංකාවේ ප්‍රධාන අර්තාපල් වගා කරන ප්‍රදේශවලින් සාක්ෂි
iii. ලංකාවේ වී වල පළිබෝධ සහ රෝග කළමනාකරණය සඳහා ජංගම දුරකථන පදනම් කරගත් තොරතුරු පද්ධතිය

ප්‍රකාශන (වාර ප්‍රකාශ ලිපි)

1. ශ්‍රී ලංකාවේ වයඹ විශ්වවිද්‍යාලයේ කෘෂි ව්‍යාපාර කළමනාකරණ පීඨය විසින් පළ කරනු ලබන ශ්‍රී ලංකා ව්‍යවහාරික ආර්ථික විද්‍යාව සහ ව්‍යාපාර පිළිබඳ ශාස්ත්‍රීය සංග්‍රහය සඳහා ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනි රුවිනි විද්‍යානපතිරණ මහත්මිය ඉදිරිපත් කළ "අන්නාසි වල වටිනාකම් දාම විශ්ලේෂණය: ශ්‍රී ලංකාවේ ගම්පහ දිස්ත්‍රික්කයෙන් සාක්ෂි" ලිපිය පළ විය.

2. පර්යේෂණ නිලධාරී අයි.වී. කුරුප්පු මහතා විසින් ව්‍යවහාරික ආර්ථික විද්‍යාව සහ ව්‍යාපාර, 4 (1), 33-44 2020 මැයි කලාපය සඳහා, 'විචල්‍ය රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්වයන් (PPP) තුළින් ලංකාවේ ගුණාත්මක බීජ අර්තාපල් නිෂ්පාදනය ශක්තිමත් කිරීම' යන මාතෘකාව යටතේ ලිපියක් ප්‍රකාශයට පත් කරන ලදී.

3. පර්යේෂණ නිලධාරී අයි.වී. කුරුප්පු මහතා ව්‍යවහාරික ආර්ථික විද්‍යාව සහ ව්‍යාපාරය 4 (1), 60-70 විසින් 2020 මැයි කලාපය සඳහා 'වී ගොවීන් විසින් අලෙවි නාලිකා තේරීම සහ ලංකාවේ රාජ්‍ය හා පෞද්ගලික අලෙවි නාලිකාවලට සම්බන්ධ වීම' යන මාතෘකාවෙන් යුත් ලිපියක් පළ කළේය.

4. 'තහනම් කරන ලද පොලිතීන් බෑග් සහ ලන්ච් ෂීට් සඳහා විකල්ප විකල්ප අධ්‍යයනය සහ වෙළඳපොළෙහි පවතින පොලිතීන් බෑග් සහ ලන්ච් ෂීට්වල ස්වභාවය පිළිබඳ අධ්‍යයනයක්' යන මාතෘකාවෙන් යුත් ලිපියක් පර්යේෂණ නිලධාරී අයි.වී. කුරුප්පු මහතා විසින් ශ්‍රී ලංකා ආර්ථික පර්යේෂණ ශාස්ත්‍රීය සංග්‍රහයේ (7 (2)), 25-45, 18 සැප්තැම්බර් 2020 දින පළ කළේය.

5. පර්යේෂණ නිලධාරී අයි.වී. කුරුප්පු මහතා විසින් මුලතිව් දිස්ත්‍රික්කයේ, රටකජු අගය දාමයේ යාන්ත්‍රණය සහ අවස්ථා යන මාතෘකාව යටතේ ශ්‍රී ලංකා ආර්ථික පර්යේෂණ ශාස්ත්‍රීය සංග්‍රහයේ 8 (1), 79-100 2020 දෙසැම්බර් 31 කලාපයේ ප්‍රකාශයට පත් කරන ලදී.

6. 'තහනම් කරන ලද පොලිතීන් බෑග් සහ ලන්ච් ෂීට් සඳහා විකල්ප විකල්ප අධ්‍යයනය සහ වෙළඳපොළෙහි පවතින පොලිතීන් බෑග් සහ ලන්ච් ෂීට්වල ස්වභාවය පිළිබඳ අධ්‍යයනයක්' යන මාතෘකාවෙන් යුත් ලිපියක් පර්යේෂණ නිලධාරී සංගීත් ප්‍රසාද් ප්‍රනාන්දු මහතා විසින් ශ්‍රී ලංකා ආර්ථික පර්යේෂණ ශාස්ත්‍රීය සංග්‍රහයේ (7 (2)), 25-45, 18, DOI: 10.4038/sljer.v7i2.113 සැප්තැම්බර් 2020 දින පළ කළේය.

7. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරීන් වන ටී.පී මූණවීරගේ සහ එම්.ඒ.සී.එස් බණ්ඩාර සහ පර්යේෂණ නිලධාරිනී එන්.එම් ඩයස් විසින් 'පාරිසරික නායකත්වයේ සංකල්පය: ලංකාවේ බලංගොඩ මහ නගර සභාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සිද්ධිය' පිළිබඳව පර්යේෂණ පත්‍රිකාවක් පාරිසරික සහ පාංශු විද්‍යා ශාස්ත්‍රීය සංග්‍රහයෙහි (LUPINE Publishers. ISSN: 2641-6794, on October 02 2020., DOI: 10.32474/ OAJESS.2020.05.000225. Link:https://lupinepublishers.com/environmental-soil-sciencejournal/pdf/OAJESS.MS.ID. 000225.pdf) පළ කළහ.

8. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරීන් වන එම්.ඒ.සී.එස් බණ්ඩාර සහ ජී.ජී.ද එල්.ඩබ්. සමරසිංහ විසින් _'ගොවීන්ට බලපාන සාධක, ආරක්ෂිත කෘෂිකර්මාන්තය අනුගමනය කිරීම: වියළි කලාපයේ එළවළු ගොවීන් පිළිබඳ සිද්ධියක්' _පිළිබඳව පර්යේෂණ පත්‍රිකාවක් Access Journal of Current Investigations in Agriculture and Current Research, LUPINE Publishers. ISSN: 2637-4676 on September 09 2020., DOI: 10.32474/CIACR.2020.08.000300. Link: https://lupinepublishers.com/agriculture-journal/pdf/CIACR.MS.ID.000300.pdf හි පළ කළහ.

9. ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ කෘෂිව්‍යාපාර කළමනාකරණ පීඨය විසින් පළ කරනු ලබන ශ්‍රී ලංකා ව්‍යවහාරික ආර්ථික විද්‍යාව සහ ව්‍යාපාර පිළිබඳ ශාස්ත්‍රීය සංග්‍රහය සඳහා පර්යේෂණ නිලධාරී ඩබ්.ඒ.එන් විජේසූරිය සහ පිරිස විසින් 'ශ්‍රී ලංකාවේ වී ගොවීන්ගේ පොදු හා පෞද්ගලික අලෙවි නාලිකා සඳහා සබැඳි රුචිකත්වයන්', නමින් ලිපියක් පළ කර තිබේ.

ප්‍රකාශන (පුවත්පත් ලිපි)

1. 'කෘෂිකර්මාන්තයට පණ දිය හැක්කේ කෙසේ ද?'- මැයින් **2020** ජනවාරි **08** (පිටුව **08**) විදුසර පුවත්පත සඳහා පර්යේෂණ නිලධාරී සංගීත් ප්‍රසාද් ප්‍රනාන්දු මහතා විසින් ලිපියක් ඉදිරිපත් කර තිබේ. http://www.vidusara.com/2020/01/08/viduindex.htm)

2. ‘රාජ්‍යය සේවයට අලුත් සංකල්පයක්...’- නමින් 2020 ජනවාරි 14 දිවයින පුවත්පතට ලිපියක් පර්යේෂණ නිලධාරී සංගීත් ප්‍රසාද් ප්‍රනාන්දු මහතා විසින් ඉදිරිපත් කර තිබේ. (http://divaina.com/daily/index.php/visheshanga3/37935-2020-01-12-15-41-32)

3. ‘Reviving the Granary of the East’ යන ශීර්ෂයෙන් ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී ඩබ්.ඒ.එන් විජේසූරිය මහතා විසින් 2020 පෙබරවාරි 19 ඩේලීනිවුස් පුවත්පතට ලිපියක් ඉදිරිපත් කර තිබේ.

4. ‘මිනිමවට ජීවය දෙන කඩොලාන’- මැයින් 2020 පෙබරවාරි 19 දින (පිටුව 06) විදුසර පුවත්පත සඳහා පර්යේෂණ නිලධාරී සංගීත් ප්‍රසාද් ප්‍රනාන්දු මහතා විසින් ලිපියක් ඉදිරිපත් කර තිබේ. (http://www.vidusara.com/ 2020/02/19/viduindex.htm)

5. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනි රුවිනි විදානපතිරණ මහත්මිය විසින් 2020 මැයි 28 ඩේලි නිවුස් පුවත්පතට “COVID-19 and Its Impact on Food Supply Chains” ශීර්ෂයෙන් ලිපියක් ඉදිරිපත් කර තිබේ.

6. පර්යේෂණ නිලධාරී සංගීත් ප්‍රසාද් ප්‍රනාන්දු මහතා විසින් 2020 දෙසැම්බර් 28 සිලෝන් ටුඩේ පුවත්පතට ‘Growing a Nutty Home, Concept to Hamper Coconut Imports’ ශීර්ෂයෙන් ලිපියක් ඉදිරිපත් කර තිබේ. https://uploads.ceylontoday.lk/epapers/files/CT-1-16-2020-12-28-CT.pdf

7. ‘ශ්‍රී ලංකාවේ පොල් ආශ්‍රිත කර්මාන්ත හා එහි සැකැස්ම’ මැයින් ලිපියක් පර්යේෂණ නිලධාරී අයි.වී කුරුප්පු මහතා විසින් 2020 ජූලි 08 විදුසර පුවත්පත සඳහා ඉදිරිපත් කර තිබේ.

8. ‘ආහාර සුරක්ෂිතතාවයට අතීතයෙන් පාඩමක්...’ මැයින් 2020 මාර්තු 11 (පිටුව 08) විදුසර පුවත්පත සඳහා පර්යේෂණ නිලධාරී සංගීත් ප්‍රසාද් ප්‍රනාන්දු මහතා විසින් ලිපියක් ඉදිරිපත් කර තිබේ. http://www.vidusara.com/2020/03/11/viduindex.htm

9. කොරෝනා හමුවේ ‘බලවත්තු කොර වෙන කොට’ ලංකාව මේ තරම්වත් බේරුණේ කොහොමද ?- ශීර්ෂයෙන් පර්යේෂණ නිලධාරී සංගීත් ප්‍රසාද් ප්‍රනාන්දු මහතා විසින් 2020 මාර්තු 25 වන දින ලංකා ඊ් ප්‍රෙස් ප්‍රවෘත්ති වෙබ් අඩවියට ලිපියක් ඉදිරිපත් කර තිබේ. https://lankaepress.com/2020/03/25/%e0%b6%9a%e0%b7%9c%e0%b6%bb%e0%b7%9d%e0%b6%b1%e0%b7%8f-%e0%b7%84% e0%b6%b8%e0%b7%94%e0%b7%80%e0%b7%9a-%e0%b6%b6%e0%b6%bd%e0%b7%80% e0%b6%ad%e0%b7%8a%e0%b6%ad%e0%b7%94-%e0%b6%9a%e0%b7%9c%e0%b6%bb/

10. ‘සොබාදහමේ පණිවිඩය නිවැරදිව වටහා ගනිමුද...?’ මැයින් 2020 මැයි 13 (පිටුව 09) විදුසර පුවත්පත සඳහා පර්යේෂණ නිලධාරී සංගීත් ප්‍රසාද් ප්‍රනාන්දු මහතා විසින් ලිපියක් ඉදිරිපත් කර තිබේ. http://www.vidusara.com/2020/05/13/viduindex.htm

11. ‘සොබාදහම හා බැඳුණු පෞරාණික ගොවිතැන...’ - මැයින් **2020** ජුනි **24** (පිටුව **12**) විදුසර පුවත්පත සඳහා පර්යේෂණ නිලධාරී සංගීත් ප්‍රසාද් ප්‍රනාන්දු මහතා විසින් ලිපියක් ඉදිරිපත් කර තිබේ. http://www.vidusara.com/2020/06/24/viduindex.htm

12. ‘ජීවිත සුවපත් කරවන දේශීය සහලේ ගුණ සුවද...' මැයින් **2020** ඔක්තොම්බර් (පිටුව **10**) විදුසර පුවත්පත සඳහා පර්යේෂණ නිලධාරී සංගීත් ප්‍රසාද් ප්‍රනාන්දු මහතා විසින් ලිපියක් ඉදිරිපත් කර තිබේ. http://www.vidusara.com/2020/10/28/viduindex.htm

13. ‘තිරසර කෘෂිකර්මාන්තයකට මග පෑදූ පුරාණ වාරිමාර්ග ශිෂ්ටාචාරය...' මැයින් **2020** අගෝස්තු **19** (පිටුව **09**) විදුසර පුවත්පත සඳහා පර්යේෂණ නිලධාරී සංගීත් ප්‍රසාද් ප්‍රනාන්දු මහතා විසින් ලිපියක් ඉදිරිපත් කර තිබේ. http://www.vidusara.com/2020/08/19/viduindex.htm

14. ‘සිංහරාජ ලෝක උරුමය අහිමි කරගනිමු ද...?’ මැයින් **2020** සැප්තැම්බර් **09** (පිටුව **10**) විදුසර පුවත්පත සඳහා පර්යේෂණ නිලධාරී සංගීත් ප්‍රසාද් ප්‍රනාන්දු මහතා විසින් ලිපියක් ඉදිරිපත් කර තිබේ. http://www.vidusara.com/2020/09/09/viduindex.htm

15. පර්යේෂණ නිලධාරිනි ආර්.එම්.එච්.කේ රම්බොඩගෙදර මහත්මිය විසින් ‘කෘෂි ඉඩමෙන් වැඩි ඵලදායීත්වයකට ඉඩම් ඒකාබද්ධකරණය...’ යන ශීර්ෂයෙන් **2020** ජූලි **10** දිනමිණ පුවත්පතට සහ ‘Land Resources, Global Food Demand and Food Production’ යන ශීර්ෂයෙන් **2020** ජූලි **08** වෙනි දින ඩේලි නිවුස් පුවත්පතට ලිපි සම්පාදන කර තිබේ.

පර්යේෂණ සමූළු සඳහා පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීම්

1. පර්යේෂණ නිලධාරි අයි.වී. කුරුප්පු මහතා විසින් **2020** පෙබරවාරි මස රුහුණු විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කළ කෘෂිකර්මාන්තය හා පරිසරය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය සඳහා **‘කෘෂිකර්මාන්තය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතය පිළිබඳ ගොවිජන අවබෝධය: ලංකාවේ ප්‍රධාන අර්තාපල් වගා කරන ප්‍රදේශවලින් සාක්ෂි (පි. 160)** යන මාතෘකාව යටතේ පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කළේය.

2. පර්යේෂණ නිලධාරි අයි.වී. කුරුප්පු මහතා විසින් **2020** පෙබරවාරි මස රුහුණු විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කළ කෘෂිකර්මාන්තය හා පරිසරය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය සඳහා 'ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක පොහොර මුදල් ප්‍රදාන වැඩසටහනෙන් උගත් පාඩම්’ මැයින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කළේය.

3. පර්යේෂණ නිලධාරි අයි.වී. කුරුප්පු මහතා විසින් **2020** පෙබරවාරි මස රුහුණු විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කළ කෘෂිකර්මාන්තය හා පරිසරය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය සඳහා 'අම්පාර සහ මොණරාගල දිස්ත්‍රික්ක වල ප්‍රධාන ධාන්‍ය වගා කරන ගොවි ප්‍රජාවන් අතර මිනිස් වනජීවී ගැටුම්වල ස්වභාවය සහ විශාලත්වය''(පි.9) යන ශීර්ෂයෙන් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කළේය.

4. පර්යේෂණ නිලධාරි අයි.වී. කුරුප්පු මහතා විසින් 2020 පෙබරවාරි මස රුහුණු විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කළ කෘෂිකර්මාන්තය හා පරිසරය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය සඳහා 'ශ්‍රී ලංකාවේ වී වල පළිබෝධ සහ රෝග කළමනාකරණය සඳහා ජංගම දුරකථන පදනම් කරගත් තොරතුරු පද්ධතියක්' (පි.170) යන ශීර්ෂයෙන් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කළේය.

5. 2020 ජනවාරි 30 දින කොළඹ දී පැවති ශ්‍රී ලංකා කෘෂිකාර්මික ආර්ථික විද්‍යාඥයින්ගේ 13 වන වාර්ෂික සම්මේලනයට කේ.වී.ඒ.එම් උපමාලිකා, කේ. උමාශංකර් සහ ඩබ්.එච්.ඒ ශාන්ත විසින් 'අනුරාධපුර දිස්ත්‍රික්කයේ - පේර සඳහා වන වෙළඳපළ සැපයුම කෙරෙහි බලපෑම් කරන අගය දාම කාර්ය සාධනය සහ සමාජ ආර්ථික සාධක' පිළිබඳ පත්‍රිකාවක් ඉදිරිපත් කර තිබේ.

6. 'බස්නාහිර පළාතේ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සමාගම් වල හරිත මානව සම්පත් කළමනාකරණය' පිළිබඳ පත්‍රිකාවක් ජී.ජී.ආර් විජේසිංහ, ජී.එම්.ඩබ්.එල් ගුණවර්ධන, ඩබ්.එච්.ඒ ශාන්ත සහ ඩබ්.එච්.ඒ වත්තගේ යන අය විසින් ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ 2020 දෙසැම්බර් 08 Innovation to Impact සමුළුවට ඉදිරිපත් කර තිබේ.

කමිටු සඳහා දායකත්වය ලබා දීම, සම්මන්ත්‍රණ හා වැඩමුළු සඳහා සහභාගී වීම

1. පර්යේෂණ නිලධාරිනියන් වන ඩී.ටී.පී.එස් ධර්මවර්ධන, එම්.බී.එෆ්. රිෆානා සහ ආර්.එම්.ඩී.එච් රත්නායක ජාතික විද්‍යා පදනමෙහි ජාතික විද්‍යා පුස්තකාල හා සම්පත් මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද 'SLISTINET සාමාජිකයින් සඳහා පුස්තකාල සේවා' වැඩමුළුව සඳහා 2020 මාර්තු 06 දින සහභාගී වූහ.

2. ඩී.ටී.පී.එස් ධර්මවර්ධන සහ ආර්.එම්.ඩී.එච්. රත්නායක යන පර්යේෂණ නිලධාරීන් 2020 ජුනි 25 දින කෘෂිකර්ම අමාත්‍යාංශය හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය සමඟ එක්ව සංවිධානය කළ 'ඊ -කෘෂිකර්මාන්තය සහ ඩිජිටල් වෙළෙඳපොළ වේදිකා' -කෘෂිකර්මාන්තය නවීකරණය කිරීමේ වැඩසටහනට තාක්ෂණික සහාය පිළිබඳ මාර්ගගත වැඩමුළුව සඳහා සහභාගී වූහ.

3. පර්යේෂණ නිලධාරි අයි.පී.පී.එම් විජේසිංහ මහතා 'සාක්ෂි පදනම් කරගත් වෙළඳ ප්‍රතිපත්ති සම්පාදනය සහ විශ්ලේෂණය පිළිබඳ ජාත්‍යන්තර වැඩමුළුව': වෙළඳ හා වෙළෙඳ ප්‍රතිපත්ති දර්ශක' පිළිබඳව සූම් තාක්ෂණය ඔස්සේ පැවති සැසිය සඳහා 2020 නොවැම්බර් මස 17 දින සිට 26 දක්වා සම්බන්ධ විය. මෙම සැසිය USAID අරමුදල් සපයන ආහාර ආරක්ෂක ප්‍රතිපත්ති පර්යේෂණ ඇතුළු ජාත්‍යන්තර සංවිධාන රැසක සහභාගීත්වයෙන් සංවිධානය කර තිබුණි.

4. ඩී.ටී.පී.එස් ධර්මවර්ධන සහ ආර්.එම්.ඩී.එච්. රත්නායක පර්යේෂණ නිලධාරිනියන් 2020 සැප්තැම්බර් 29 වන දින ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය සහ ශ්‍රී ලංකා ඉංජිනේරු සංගමය විසින් සංවිධානය කරන ලද 'විද්‍යාත්මක ලිවීම සහ පර්යේෂණ කටයුතු ප්‍රකාශනයට පත් කිරීම පිළිබඳ ව පැවති මාර්ගගත සම්මන්ත්‍රණය සඳහා සහභාගී වූහ.

5. පර්යේෂණ නිලධාරිනියන් වන ඩී.ටී.පී.එස් ධර්මවර්ධන සහ ආර්.එම්.ඩී.එච්. රත්නායක යන මහත්මීන් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද කෘෂිකාර්මික අංශය නවීකරණය කිරීම සඳහා ඊ -කෘෂිකර්මාන්තය පිළිබඳ ජාත්‍යන්තර අත්දැකීම්-කෘෂිකර්මාන්තය නවීකරණය කිරීමේ වැඩසටහනට තාක්ෂණික සහාය මැයින් 2020 නොවැම්බර් 17 දින පැවති මාර්ගගත වැඩමුළුවට සහභාගී වූහ.

6. පර්යේෂණ නිලධාරිනි ඩී.ටී.පී.එස් ධර්මවර්ධන මහත්මිය 'කෘෂි- ආහාර පද්ධතියෙහි නයිට්‍රජන් අභියෝග: 2030 වන විට නයිට්‍රජන අපද්‍රව්‍ය අඩකින් අඩු කිරීම' පිළිබඳව ශ්‍රී ලංකා ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාරිකයින්ගේ සම්මේලනය සංවිධානය කළ මාර්ගගත සම්මන්ත්‍රණයට 2020 දෙසැම්බර් 07 සහභාගී වූවාය.

7. පර්යේෂණ නිලධාරිනි ජී.වී නොරිකා අයෝමි මහත්මිය 'කෘෂි- ආහාර පද්ධතියෙහි නයිට්‍රජන් අභියෝග: 2030 වන විට නයිට්‍රජන අපද්‍රව්‍ය අඩකින් අඩු කිරීම' පිළිබඳව ආහාර හා කෘෂිකර්ම සංවිධානය සහ එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන එක්ව සංවිධානය කළ මාර්ගගත සම්මන්ත්‍රණයට 2020 දෙසැම්බර් 07 සහභාගී වූවාය.

8. පර්යේෂණ නිලධාරිනි එම්.බී.එෆ් රිෆානා මහත්මිය ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය සහ ශ්‍රී ලංකා කෘෂිකාර්මික ආර්ථික විද්‍යාඥයින්ගේ සංගමය විසින් සංවිධානය කළ කාල මාලාව ආකෘතිකරණය සහ පුරෝකථනය කිරීම ('Time Series Modelling and Forecasting) පාඨමාලාවට 2020 අගෝස්තු 21,25,26,29 සහ 31 යන දිනවල සහභාගී වූවාය.

9. පර්යේෂණ නිලධාරිනි එම්.බී.එෆ් රිෆානා මහත්මිය 'ශ්‍රී ලංකාවේ මුං ඇට වගාව' සම්බන්ධයෙන් තොරතුරු ඇතුළත් කර බ්ලොග් අඩවියක් නිර්මාණය කර තිබේ. කෘෂිකර්මාන්තය නවීකරණය කිරීමේ වැඩසටහනට තාක්ෂණික සහාය (TAMAP) සහ තායිලන්තයේ පිහිටි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය සහ කෘෂිකර්ම අමාත්‍යාංශය සමඟ සහයෝගී වැඩසටහනක් ලෙස 2020 ඔක්තොම්බර් 14 දින ආරම්භ විය. https://greengraminfo.blogspot.com/

10. පර්යේෂණ නිලධාරිනි ආර්.එම්.ඩී.එච් රත්නායක මහත්මිය 'ශ්‍රී ලංකාවේ මුං ඇට වගාව' සම්බන්ධයෙන් තොරතුරු ඇතුළත් කර බ්ලොග් අඩවියක් නිර්මාණය කර තිබේ. https://greengraminfo.blogspot.com/'

11. පර්යේෂණ නිලධාරිනි ඩී.ටී.පී.එස් ධර්මවර්ධන මහත්මිය තල වගාව සම්බන්ධයෙන් බ්ලොග් අඩවියක් නිර්මාණය කර යාවත්කාලීන කර තිබේ. (https://sesamiindustry.blogspot.com/)

12. පර්යේෂණ නිලධාරී අමල් දිසානායක මහතා ක්වීන්ස්ලන්ඩ් විශ්ව විද්‍යාලය විසින් එඩෙක්ස් මාර්ගගත වේදිකාව හරහා සංවිධානය කරනු ලැබූ "වර්තමාන ලෝක ගැටලු පිළිබඳ මානව විද්‍යාව" පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව. 2020 මාර්තු 15 සිට මැයි 15 දක්වා සහභාගී විය.

13. පර්යේෂණ නිලධාරී අමල් දිසානායක මහතා ඉන්දියාවේ හයිද්‍රාබාද්හි ජාතික ග්‍රාමීය සංවර්ධන ආයතනය සහ පංචායති රාජ් විසින් සංවිධානය කරන ලද "දිළිඳුකම අවම කිරීම සහ තිරසාර සංවර්ධනය සඳහා සහභාගීත්ව සැලසුම්" පිළිබඳ පුහුණු වැඩසටහනට 2020 ජනවාරි 07 සිට පෙබරවාරි 03 දක්වා සහභාගී විය.

14. ශ්‍රී ලංකාවේ රෝහල් 42ක් සඳහා ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ තාක්ෂණික ඇගයීම් කමිටුවේ (TEC) කමිටු සාමාජිකාවක, ශ්‍රී ලංකාවේ මල් වගාව පර්යේෂණ හා සංවර්ධනය පිළිබඳ ජාතික කමිටුව සහ Sri Lanka Journal of Agrarian Studies හි කතෘ මණ්ඩල සාමාජිකාවක ලෙස කටයුතු කළාය.

15. පර්යේෂණ නිලධාරී අයි.වී කුරුප්පු මහතා සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය කටයුතු අමාත්‍යාංශය සඳහා මිල තීරණය කිරීම සහ ආහාර වෙළඳ භාණ්ඩ ප්‍රසම්පාදන කාර්මික කමිටුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කළේය.

16. පර්යේෂණ නිලධාරී අයි.වී කුරුප්පු මහතා රජයේ වෙළඳ මුද්‍රණාලයට ආහාර වෙළඳ භාණ්ඩ පිළිබඳ තොරතුරු සංවිධානය හා සම්බන්ධීකරණ සිදු කරන සම සම්බන්ධීකාරකයෙකු ලෙස කටයුතු කළේය.

17. පර්යේෂණ නිලධාරිනි ජී.වී නොරිකා අයෝමි මහත්මිය ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය විසින් 2020 දෙසැම්බර් 10 දින සංවිධානය කරන ලද ජාතික ඉංජිනේරු පර්යේෂණ සම්මන්ත්‍රණය 2020 සඳහා සූම් තාක්ෂණය ඔස්සේ සහභාගී වූවාය.

18. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී එම්.ඒ.සී.එස් බණ්ඩාර මහතා ශ්‍රී ලංකා අර්ථාවාසී පදනම, කැරිටාස් ස්විට්සර්ලන්තය සහ එක්සත් ජනපදය එක්ව ක්‍රියාත්මක කරන, දකුණු ආසියානු ධාරිතාවය ගොඩනැගීමේ කෘෂිකාර්මික හා ජල දූෂණ ව්‍යාපෘතියේ, ව්‍යාපෘති උපදේශක කමිටුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කළේය.

19. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී එම්.ඒ.සී.එස් බණ්ඩාර මහතා සංයුක්ත පොහොර මිශ්‍රණ ආනයනය කිරීම සඳහා උපදෙස් ලබා දීම සඳහා ජාතික පොහොර ලේකම් කාර්යාල තාක්ෂණික කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් කටයුතු කළේය.

20. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී එම්.ඒ.සී.එස් බණ්ඩාර මහතා වෙළඳ අමාත්‍යාංශය යටතේ ඇති වෙළඳ පිළියම් නීතිය ක්‍රියාත්මක කිරීමේ කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් කටයුතු කළේය.

21. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී එම්.ඒ.සී.එස් බණ්ඩාර මහතා ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය විසින් සම්බන්ධීකරණය කරන ලද වසර 2020/2021 සඳහා කෘෂිකර්මාන්තය, දඩයම් කිරීම සහ වන විද්‍යා විෂය මාලාව සකස් කිරීම සඳහා වූ ජාතික කාර්මික පුහුණු උපදේශක කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් කටයුතු කළේය.

22. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී ඩබ්.එච්.ඒ ශාන්ත මහතා එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය විසින් සංවිධානය කරන ලද "ආසියාව සහ පැසිෆික් කලාපය සඳහා වූ ආහාර සුරක්ෂිතතා සමුළුව: කොවිඩ් -19 යුගයේ ආහාර සුරක්ෂිතතාවය" යන මාර්ගගත සම්මන්ත්‍රණයෙහි සම්පත්දායකයෙකු ලෙස කටයුතු කළේය.

23. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනී ටී.පී මුණසිංහගේ මහත්මිය පරිසර අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් සංවිධානය කරන ලද MRV, SLCR, SLCCS' සඳහා ප්‍රශස්ත ප්‍රතිපත්ති පැකේජයක් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා වූ සමස්ථ ප්‍රතිපත්ති අනුකූලතාව ඇගයීම සහ නිර්දේශ පිළිබඳ පාර්ශවකරුවන්ගේ උපදේශන වැඩමුළුවට 16 දෙසැම්බර් 2020 දින සහභාගී වූවාය.

24. පර්යේෂණ නිලධාරිනි ආර්.එම්.එම්.එච්.කේ රමේබාඩගෙදර මහත්මිය 2020 සැප්තැම්බර් 08 දින ආසියා සහ පැසිෆික් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන මධ්‍යස්ථානය (CIRDAP) විසින් සංවිධානය කරන ලද "CIRDAP සාමාජික රටවල ග්‍රාමීය ප්‍රජාවන්ට ආපසු සංක්‍රමණය වීමේ දී COVID-19 බලපෑම තක්සේරු කිරීම" පිළිබඳව පැවති මාර්ගගත සම්මන්ත්‍රණයෙහි සම්පත්දායිකාවක වශයෙන් කටයුතු කළාය.

25. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනි ජී.ජී ද එල්.ඩබ්ලිව්. සමරසිංහ මහත්මිය ඒකාබද්ධ ජල සම්පත් කළමනාකරණය **(IWRM)** ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව කටයුතු කරන ස්වාධීන ලාභ නොලබන සංගමයක් වන ශ්‍රී ලංකා ජල හවුල්කාරිත්වයේ **(ලංකා ජලනි)** මෙහෙයුම් කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් කටයුතු කළාය.

26. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනි ජී.ජී ද එල්.ඩබ්ලිව්. සමරසිංහ මහත්මිය ශ්‍රී ලංකා අර්ථාවාර්ය පදනම, කැරිටාස් ස්විට්සර්ලන්තය සහ එක්සත් ජනපදය එක්ව ක්‍රියාත්මක කරන, දකුණු ආසියානු ධාරිතාවය ගොඩනැඟීමේ කෘෂිකාර්මික හා ජල දූෂණ ව්‍යාපෘතියේ, ව්‍යාපෘති උපදේශක කමිටුවේ සාමාජිකාවක ලෙස කටයුතු කළාය.

27. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනි ජී.ජී ද එල්.ඩබ්ලිව්. සමරසිංහ මහත්මිය ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව **(CARP)** ස්වාභාවික සම්පත් කළමනාකරණය, තිරසාර කෘෂිකර්මාන්තය සහ දේශගුණික විපර්යාස පිළිබඳ ජාතික කමිටුවේ කමිටු සාමාජිකාවක ලෙස කටයුතු කළාය.

2020 දෙසැම්බර් 31 දිනට කාර්යමණ්ඩල තත්ත්වය

	31.12.2019 දිනට තත්ත්වය	වර්ෂය තුළ සේවය අත් හිටුවීම, සේවයෙන් ඉවත් වීම	පත්වීම්	31.12.2020 දිනට තත්ත්වය
අධ්‍යක්ෂ	-	-	1	1
අතිරේක අධ්‍යක්ෂ	-	-	-	-
අංශ ප්‍රධානීන්	6	-	-	6
පර්යේෂණ කාර්ය මණ්ඩලය	30	-	-	30
පරිපාලන කාර්ය මණ්ඩලය	9	-	-	9
පුස්තකාල ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය	2	-	-	2
දත්ත බැංකුව	2	-	-	2
පරිගණක ඒකකය	1	-	-	1
ප්‍රකාශන ඒකකය	5	-	-	5
සංඛ්‍යාන කාර්ය මණ්ඩලය	22	1	-	21
තාක්ෂණික කාර්ය මණ්ඩලය	3	1	-	2
ලිපිකාර, ලේකම් සහ සමාන්තර ශ්‍රේණි	47	2	-	45
මෙහෙයුම් හා සමාන්තර ශ්‍රේණි	46	1	-	45
එකතුව	**173**	**5**	**1**	**169**

කාර්ය මණ්ඩල සංවර්ධනය

2020 වර්ෂයේ දී අප ආයතනය මාණ්ඩලික සංවර්ධනය සඳහා රුපියල් මිලියන 0.44ක් වැය කළ අතර එයින් මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන් දස දෙනෙකු දේශීය පුහුණුව ලැබුණි. මාණ්ඩලික ශ්‍රේණියේ තවත් නිලධාරීන් නව දෙනෙකු විදේශ පුහුණුවීම් සඳහා සහභාගී වූහ.

පහත සඳහන් පර්යේෂණ නිලධාරිහු පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතුවල නියුක්ත වූහ:

එච්.ජී.සී ජයසූරිය මහතා	-	පශ්චාත් උපාධි අධ්‍යයන පාඨමාලාව (ශාස්ත්‍රපති) ඕස්ට්‍රේලියාව 2019 ජනවාරි 08 සිට 2020 දෙසැම්බර් 31 දක්වා
පී.ඒ.පේ චම්පිකා මිය	-	පශ්චාත් උපාධි අධ්‍යයන පාඨමාලාව (ශාස්ත්‍රපති) ඕස්ට්‍රේලියාව 2019 ජනවාරි 08 සිට 2020 දෙසැම්බර් 31 දක්වා
පී.සී.පේ ද සිල්වා මහතා	-	ප්‍රජා සංවර්ධනය පිළිබඳ ආචාර්ය උපාධිය - පිලිපීනය **2019** පෙබරවාරි 19 සිට 2022 පෙබරවාරි 01.

විදේශීය පුහුණු වැඩසටහන්/සමුළු/වැඩමුළු/සම්මන්ත්‍රණ/රැස්වීම් ආදියට සහභාගී වීම්

1. පර්යේෂණ නිලධාරී ඩී.එම්.ඒ.සී දිසානායක මහතා, 2020 ජනවාරි 07 සිට පෙබරවාරි 03 දක්වා ඉන්දියාවේ පැවති "දිළිඳුකම පිටුදැකීම සහ තිරසාර සංවර්ධනය සඳහා සහභාගීත්ව සැලසුම්කරණය" සම්බන්ධයෙන් පැවති වැඩමුළුවට සහභාගී විය.

2. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී ඩබ්ලිව්.ඒ.එන්.විජේසූරිය මහතා **2020** ජනවාරි **22** සිට ජනවාරි **31** දක්වා ඉන්දියාවේ පැවති "තිරසාර ග්‍රාමීය ජීවනෝපාය සඳහා ස්වාභාවික සම්පත් කළමනාකරණය" පිළිබඳ CIRDAP - NIRDPR සහයෝගීතා ජාත්‍යන්තර පුහුණු වැඩසටහනට සහභාගී විය.

දේශීය පුහුණු වැඩසටහන්වලට සහභාගී වීම් – මාණ්ඩලික නිලධාරීන්

1. අධි පර්යේෂක එච්.එම්.ජේ.කේ හේරත් මහතා **2020** පෙබරවාරි **10** සිට **04** දක්වා ආතර් සී ක්ලාක් ආයතනයේ පැවති "ඇන්ඩ්‍රොයිඩ් ජංගම යෙදුම් සංවර්ධන " පුහුණු වැඩසටහනට සහභාගී විය.

2. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී ඩබ්ලිව්.ඒ.එන්. විජේසූරිය මහතා **2020** පෙබරවාරි **12** වන දින සහල් පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ පැවති "සහල් පිළිබඳ වාර්ෂික සැසිය- **2021**"ට සහභාගී විය

3. පර්යේෂණ නිලධාරී යූ.ඩී.ආර් උදාරි මහත්මිය **2020** මාර්තු **4** සිට **7** දක්වා බත්තරමුල්ල,වෝටර්ස් එජ් ලින්ක් රූම් හි පැවති 'තාර්කික රාමු ප්‍රවේශය උපයෝගී කරගනිමින් කෘෂිකාර්මික අංශයේ සැලසුම් ක්‍රියාත්මක කිරීම හා මැදිහත් වීම් වැඩි දියුණු කිරීම' සම්බන්ධයෙන් පැවති පුහුණු වැඩසටහනට සහභාගී වූවා ය.

4. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී ආචාර්ය එන්.පී.ජී සමන්ත මහතා **2020** මාර්තු **19** වන දින කොළඹ ටාජ් සමුද්‍රා හෝටලයේ පැවති "මැලේසියානු පාම් තෙල් මණ්ඩල කාර්මික සම්මන්ත්‍රණය (MPOB)" සම්මන්ත්‍රණයට සහභාගී විය.

5. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනි එම්.ටී පද්මජානි මහත්මිය **2020** මාර්තු **2** වන දින ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පැවති **"**ශ්‍රී ලංකාවේ පළඟැටියන් උවදුර ඇතිවීමේ අවදානම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන**"** රැස්වීමට සහභාගී වූවාය.

6. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරීන් වන එම්.ඒ.සී.එස්. බණ්ඩාර, ඩබ්ලිව්.එච්.ඒ. ශාන්ත සහ එම්.ටී පද්මජානි යන මහත්ම මහත්මීන් **2020** මාර්තු **10** වන දින පේරාදෙණියේ සේවාස්ථ පුහුණු ආයතනයේ පැවති 'කෘෂිකර්මාන්තය පිළිබඳ දේශගුණික විපර්යාස පිළිබඳ පර්යේෂණ සංසදය වැඩමුළුවට' සහභාගී වූහ.

7. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී එම්.ඒ.සී.එස්. බණ්ඩාර, අර්ථචර්ය පදනම විසින් ඔවුන්ගේ ප්‍රජා මධ්‍යස්ථානයේදී සංවිධානය කරන ලද 'කෘෂිකර්මික ඉඩම් පදනම් කරගත් ජල දූෂණය පිළිබඳ ගොවි දැනුවත් කිරීමේ වැඩසටහන' පිළිබඳ පුහුණු වැඩසටහන් මාලාවේ සම්පත්දායකයෙකු ලෙස කටයුතු කළේය. වැල්ලවාය සහ මහා ඉලුප්පල්ලම යන ප්‍රදේශවල දී පෙබරවාරි 29 සහ 2020 ජුනි 30 දිනවල එය පැවැත්විණි.

8. පර්යේෂණ නිලධාරී අයි.පී.පී.එම් විජේසිංහ මහතා, **2020** මාර්තු **16** වන දින කොළඹ **07**, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙහි පැවති **"**තිරසාර කර්මාන්තය සඳහා කිතුල් පදනම් කරගත් නිෂ්පාදන සවිබල ගැන්වීම සඳහා වූ වැඩමුළුවට සහභාගී විය.

9. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනි ජී.ජී ද එල්.ඩබ්ලිව්. සමරසිංහ මහත්මිය 2020 මාර්තු 17 සිට 19 දක්වා රාජගිරියේ බැංකු අධ්‍යයන මධ්‍යස්ථානයේදී පැවැති **"**ශ්‍රී ලංකාවේ දේශගුණික විපර්යාස අනුවර්තනය හා අවම කිරීම සඳහා දේශය සකස් කිරීම**"** පිළිබඳ වැඩමුළුවට සහභාගී වූවාය.

10. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනි ජී.ජී ද එල්.ඩබ්ලිව්. සමරසිංහ මහත්මිය ජාතික පර්යේෂණ සභාවේ පැවති 'විද්‍යා හා තාක්ෂණය පිළිබඳ ජාත්‍යන්තර ඩිජිටල් පර්යේෂණ හා සංවර්ධන වේදිකාවල ශ්‍රී ලාංකිකයින්' පිළිබඳ මාර්ගගත ක්‍රියාකාරකම සඳහා සහභාගී වූවාය.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

රුපියල්

වත්කම්	සටහන්	2020	2019
ජංගම වත්කම්			
මුදල් හා මුදල් සමාන දෑ	2	9,743,478.97	15,616,183.49
ලැබිය යුතු-ණයගැනියෝ	3	28,791,748.84	32,520,745.31
ලැබිය යුතු - නැන්පත්	4	613,070.00	613,070.00
අවසන් තොග	5	5,355,831.66	5,229,254.96
ඉදිරියට කළ ගෙවීම්	6	23,779.69	35,067.01
අනෙකුත් ජංගම වත්කම්	7	144,808.80	23,500.00
		44,672,717.96	**54,037,820.77**
ජංගම නොවන වත්කම්			
අනෙකුත් මූල්‍ය වත්කම්	8	4,125,453.47	3,900,922.99
යටිතල පහසුකම්, පිරියක හා උපකරණ	9	19,063,948.06	22,573,958.85
ඉඩම් හා ගොඩනැගිලි	10	36,782,585.42	37,697,130.51
නොනිමි වැඩ	11	-	1,539,951.30
		59,971,986.95	**65,711,963.65**
මුළු වත්කම්		**104,644,704.91**	**119,749,784.42**
වගකීම්			
ජංගම වගකීම්			
ගෙවිය යුතු දෑ	12	**17,207,081.15**	**19,063,151.63**
		17,207,081.15	**19,063,151.63**
ජංගම නොවන වගකීම්			
සේවක ප්‍රතිලාභ	13	67,426,150.00	57,562,752.50
		67,426,150.00	**57,562,752.50**
මුළු වගකීම්		**84,633,231.15**	**76,625,904.13**
ශුද්ධ වත්කම්		**20,011,473.76**	**43,123,880.29**
ශුද්ධ වත්කම් හා හිමිකම්			
රජයේ ප්‍රදාන - ප්‍රාග්ධන	14	39,140,539.83	44,971,154.73
අමාත්‍යාංශයෙන් ලද ප්‍රාග්ධනය			-
සංචිත	15	3,376,906.90	3,376,906.90
ප්‍රත්‍යාගණිත සංචිත		26,450.00	26,450.20
දිරි දීමනා හා පුහුණු අරමුදල	16	8,611.38	8,611.38
සමුච්චිත අතිරික්තය/ (ඌනතාවය)	17	(22,541,034.55)	(5,259,242.92)
මුළු වත්කම්/ හිමිකම්		**20,011,473.56**	**43,123,880.29**

පිටු අංක 5 සිට 8 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 9 සිට 14 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අදාළ වේ. රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති අවශ්‍යතාවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇති බව සහතික කරමි.

.....

තුෂාරි වෙදගේ

ගණකාධිකාරිණී

දිනය .....

.....

එම්.ඩී.ටී සෙනෙවිරත්න

අධ්‍යක්ෂ

මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුය. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කොට අත්සන් කළේ

.....

.....

හෙක්ටර් කොඩ්බැකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

2020 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය රුපියල්

ආදායම	සටහන්	2020	2019
මහා භාණ්ඩාගාරයෙන් ලද අරමුදල්		154,739,750.00	175,000,000.00
පර්යේෂණ හා පුහුණු කිරීම් සඳහා බාහිර ආයතනවලින් ලද අරමුදල්		5,161,942.09	9,014,545.91
පර්යේෂණ හා පුහුණු ක්‍රියාකාරකම් සඳහා හිමි වූ ප්‍රාග්ධන ප්‍රදාන		500,000.00	15,694,578.53
අනෙකුත් ආදායම්	18	19,863,438.27	32,082,932.97
බොල් ණය අධි වෙන් කිරීම්-ශිෂ්‍යත්වලාභී		529,892.00	332,395.78
මුළු ආදායම		**180,795,022.36**	**232,124,453.19**
වියදම්			
වැටුප් චේතන හා සේවක ප්‍රතිලාභ	19	(160,080,868.48)	(168,108,417.15)
පර්යේෂණ හා පුහුණු ක්‍රියාකාරකම්		(1,519,380.33)	(15,694,578.53)
පර්යේෂණ හා පුහුණු ක්‍රියාකාරකම් සඳහා බාහිර ආයතනවලින් අරමුදල් යෙ		(5,161,942.09)	(9,014,545.91)
ක්ෂයවීම්	9, 10	(5,830,614.90)	-
වෙනත් වියදම්	20	(24,192,864.55)	(41,274,563.20)
බොල් ණය (ඌන) වෙන් කිරීම්- වෙනත් ණයකරුවන්		(148,287.72)	-
බැංකු ගාස්තු		(62,260.00)	(97,700.00)
මුළු වියදම		**(196,996,218.07)**	**(234,189,804.79)**
අදාළ කාලය සඳහා අතිරික්තය/ හිඟය		**(16,201,195.71)**	**(2,065,351.60)**

.....
ගණකාධිකාරී

.....
අධ්‍යක්ෂ

2019		සටහන්	2020 (රුපි)	
	මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ මුදල් ප්‍රවාහය			
(2,065,351.60)	වර්ෂය සඳහා ශුද්ධ ලාභය/ අතිරික්තය			(16,201,195.71)
-	ගැලපීම්			
8,741,252.31	ක්ෂය වීම්		5,830,614.90	
(8,741,252.31)	ක්‍රමක්ෂය		(5,830,614.90)	
10,802,680.00	පාරිතෝෂික සඳහා වෙන් කිරීම්		10,912,232.50	
(1,190,841.12)	ආයෝජන ආදායම්		(1,175,853.03)	
37,052.86	පෙර වර්ෂයේ ගැලපීම්		(1,080,595.92)	
-	ස්ථාවර වත්කම් අපහරයෙන් ලද ලාභය/ අලාභය		18,420.00	
308,502.09	ඇබලි භාණ්ඩ අපහරයෙන් ලද ලාභය/අලාභය		(12,050.00)	
(332,395.78)	බොල් ණය සඳහා වෙන් කිරීම්			8,662,153.55
7,559,646.45	කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය			**(7,539,042.16)**
	කාරක ප්‍රාග්ධන වෙනස්කම්			
(1,163,773.16)	ණයගැතියෝ		3,728,996.47	
1,469,251.01	අවසන් තොග		(126,576.70)	
(10,507.28)	ඉදිරියට කළ ගෙවීම්		11,287.32	
200,812.40	අනෙකුත් ජංගම වත්කම්		(121,308.80)	
1,729,061.99	ගෙවිය යුතු දැ	21	(1,736,135.48)	1,756,262.81
9,784,491.41	මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා ශුද්ධ මුදල් භාවිතය			**(5,782,779.35)**
(5,481,894.00)	පාරිතෝෂික ගෙවීම්			(1,048,835.00)
4,302,597.41	මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය			**(6,831,614.35)**
	ආයෝජන ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ මුදල් ප්‍රවාහය			
-	ණයගැතියෝ			
(209,901.99)	අනෙකුත් මූල්‍ය වත්කම්		(224,530.48)	
(6,391,287.37)	දේපළ, පිරියත හා උපකරණ	22	(7,200.00)	
(1,637,646.71)	ඉඩම් හා ගොඩනැගිලි		-	
1,962,545.66	පැල්වෙහෙර නිල නිවාසය		-	
1,190,841.12	ආයෝජන ආදායම්		1,175,853.03	
(1,153,382.94)	නොනිමි වැඩ	11	-	
0.00	නැති වූ පුස්තකාල පොත් සඳහා පිරිවැය අය කර ගැනීම්		2,737.28	
(6,238,832.23)				**946,859.83**
	මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ මුදල් ප්‍රවාහය			
17,585,000.00	රජයේ ප්‍රදාන- ප්‍රාග්ධන ලැබීම්		500,000.00	
(15,694,578.53)	පර්යේෂණ හා පුහුණු ක්‍රියාකාරකම් සඳහා හිමි වූ ප්‍රාග්ධන ප්‍රදාන		(500,000.00)	
34,445.53	දිරිදීමනා අරමුදල-ආයතනයේ දායකත්වය 40%		-	
(308,502.09)	ඇබලි ද්‍රව්‍ය අලෙවිය		12,050.00	
8,611.38	දිරිදීමනා අරමුදල-ආයතනයේ දායකත්වය 10%		-	
332,395.78	බොල් ණය වෙන් කිරීම්			
1,957,372.07	මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ශුද්ධ මුදල්			**12,050.00**
21,137.25	මුදල් හා මුදල් සමාන අයිතමයන්ගේ ශුද්ධ වැඩිවීම			(5,872,704.52)
15,595,046.24	වර්ෂය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන අයිතමයන්	I		15,616,183.49
15,616,183.49	වර්ෂය අවසානයේ දී මුදල් හා මුදල් සමාන අයිතමයන්	II		**9,743,478.97**
	සටහන්:			
	මුදල් හා මුදල් සමාන අයිතමයන්		1	11
			01.01.2020	31.12.2020
15,595,513.49	බැංකු ශේෂය		15,595,513.49	9,723,478.97
20,670.00	අතැනි මුදල්		20,670.00	20,000.00
15,616,183.49	එකතුව		**15,616,183.49**	**9,743,478.97**

හෙක්ටර් කොඩ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
2020 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා
ශුද්ධ වත්කම්/හිමිකම් වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය

රුපියල්

	රජයේ ප්‍රාග්ධන ප්‍රතිපාදන	සංචිත	ප්‍රත්‍යාගණිත සංචිත	දිරි දීමනා සහ පුහුණු අරමුදල	සමුච්චිත අතිරික්තය/(හිඟය)	එකතුව
2020 ජනවාරි 01 දිනට ශේෂය	44,971,154.73	3,376,906.90	26,450.20	8,611.38	(5,259,242.92)	43,123,880.29
මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු මුදල් -ප්‍රාග්ධන	500,000.00					500,000.00
වර්ෂය සඳහා ක්‍රමක්ෂය	(5,830,614.90)					(5,830,614.90)
පර්යේෂණ සහ පුහුණු ක්‍රියාකාරකම් සඳහා ලැබුණු මුදල්	(500,000.00)					(500,000.00)
පෙර වසරේ ශේෂය මාරු කිරීම					(135,674.92)	(135,674.92)
පෙර වර්ෂයට ගැලපීම්					(944,921.00)	(944,921.00)
ආදායම් සහ වියදම්					(16,201,195.71)	(16,201,195.71)
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	**39,140,539.83**	**3,376,906.90**	**26,450.20**	**8,611.38**	**(22,541,034.55)**	**20,011,473.76**

මූල්‍ය ප්‍රකාශය සඳහා සටහන්
2020 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා සටහන්

1. ගිණුම්කරණ ප්‍රතිපත්ති

1.1 පොදු

පොදුවේ පිළිගත් ගණකාධිකරණ මූලධර්ම හා පිළිවෙත්වලට ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුතු නිකුතු ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධානයන්ට අදාළව ඓතිහාසික පිරිවැය මත මූල්‍ය ප්‍රකාශ පිළියෙල කොට ඇත. මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි උද්ධමන සාධක සඳහා ගැලපීම් සිදු කර නැත. උපචිත පදනම මත ගණකාධිකරණ මූලධර්ම නිරන්තරයෙන් භාවිතා කර තිබේ.

1.2 සන්සන්දනාත්මක තොරතුරු

පසුගිය වසරේ උපයෝගී කර ගනු ලැබූ ගිණුම්කරණ ප්‍රතිපත්තීන්ට අනුරූපීව මෙම වසරේද එම ප්‍රතිපත්තීන් යොදාගෙන ඇත. අවශ්‍ය සෑම අවස්ථාවක දී ම පවත්නා වර්ෂයේ ඉදිරිපත් කිරීම තහවුරු කිරීම සඳහා පසුගිය වර්ෂයේ අගයන් නැවත සකසා ඉදිරිපත් කර ඇත.

1.3 ශේෂ පත්‍ර දිනයට පසුව හටගන්නා සිද්ධි

ශේෂ පත්‍ර දිනෙන් පසු හට ගන්නා ප්‍රමාණවත් සිද්ධීන් සම්බන්ධයෙන් මූල්‍ය වාර්තාවල අදාළ හෙළිදරවු හා ගැලපීම් සිදු කර ඇත.

1.4 වත්කම් තක්සේරු

(i) දේපළ, පිරියත හා උපකරණ

දේපළ, පිරියත හා උපකරණ මිලදී ගැනීමට හෝ ඉදිකිරීමට වැය වූ වියදම එහි පිරිවැය ලෙස සැලකේ. ආයතනයේ පැවැත්මට හෝ ආයතනයේ ධාරිතාවය වැඩි කිරීමට යම් වත්කමක් මිල දී ගැනීමක් හෝ පවතින වත්කමක් වැඩි දියුණු කිරීමට යම් වියදමක් දරන්නේ නම් එම වියදම ප්‍රාග්ධන වියදමක් ලෙස සැලකේ. අලුත්වැඩියා හා නඩත්තු පිරිවැය පුනරාවර්තන වියදමක් ලෙස සැලකේ. දේපළ, පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේ දී පිරිවැයෙන් හෝ ප්‍රත්‍යාගණන අගයෙන් සමුච්චිත ක්ෂය අඩු කර ඉදිරිපත් කරනු ලබන අතර එය පහත පරිදි වේ.

a) පහත සඳහන් වාර්ෂික ක්ෂය අනුපාත යටතේ සරල මාර්ග ක්‍රමයට ක්ෂය කර තිබේ.

ගොඩනැගිලි	වාර්ෂික 2 ½ %
උපකරණ/ගෘහභාණ්ඩ	වාර්ෂික 10%
පරිගණක	වාර්ෂික 20%
සුභසාධක උපකරණ	වාර්ෂික 10%
පොත්	වාර්ෂික 10%
වාහන	වාර්ෂික 20%

මිල දී ගත් වර්ෂයේ දී සමස්ත වර්ෂයටම ක්ෂය කරනු ලැබේ.

b) ක්‍රමක්ෂය වටිනාකම් හඳුනාගැනීම් හා ගිණුම් තැබීම් ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අංක LKAS-20 විකල්ප ක්‍රමය අනුව සිදු කර ඇත.

c) පැල්වෙහෙර නිල නිවාසය

පැල්වෙහෙර බංගලාව 2019.11.01 වන විට දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත මාරු කර යවා ඇති අතර එහි හුවමාරු වටිනාකම් රුපියල් 1,962545.66 ක් විය. පැල්වෙහෙර බංගලාවේ කුලී මුදලට මෙම මාරු මුදල් පියවා ඇත. පාලක මණ්ඩලය විසින් ඒ සඳහා අනුමැතිය ලබා දී ඇත.

1.5 ණයගැතියෝ

i) විදේශ ශිෂ්‍යත්වලාභී ණයගැතියෝ

වර්තමානයේ විදේශ ශිෂ්‍යත්වලාභී ණයගැතියන් හය දෙනෙකුගේ ශේෂයන් පවතී. ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 08 (SLIPSAS 08) අනුව අවදානම් හා අවිනිශ්චිතතාව සැලකිල්ලට ගනිමින් අඩමාන ණය වෙන් කිරීමේ ප්‍රතිශතය මෙම වර්ෂයේ දී තීරණය කර ඇත.

ii) අනෙකුත් ණයගැතියෝ

උපලබ්ධි වේ යැයි අපේක්ෂිත අගය ණයගැති වටිනාකම් ලෙස සඳහන් කර ඇත. බොල් සහ අඩමාන ණය වෙනුවෙන් ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන්කර ඇත. එය පහත පරිදි වේ.

1.	අවුරුදු 5ට වැඩි ණයගැති ශේෂය මත	-	100%
2.	අවුරුදු 1 වැඩි අවුරුදු 05 අඩු ණයැති ශේෂය මත	-	5%

III) ගිණුම්ගත නොකළ නේවාසිකාගාර ආදායම්

වාර්තාගත නොකළ නේවාසිකාගාර ආදායම් රු.8,895,470/- වන අතර මෙම වටිනාකම් 2015 මැයි මස සිට 2018 ජූලි මස දක්වා නේවාසිකාගාර ක්‍රියාකාරකම්වලින් ජනනය වී ඇත. මෙම වටිනාකම් හඳුනාගැනීම් අධ්‍යක්ෂවරයා විසින් පත් කළ කමිටුවක් මඟින් සිදු කර ඇත. මෙම මුදල් වාර්තාගත කර නැති අතර එම තීරණය පාලක මණ්ඩලය විසින් ගෙන ඇත.

IV) දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලැබිය යුතු

මෙම මුදලට පැල්වෙහෙර බංගලාවේ මාරු කිරීමේ වටිනාකම් ඇතුළත් වූ අතර එම බංගලාවේ නියමිත කුලී මුදල් මත මුළු මාරු කිරීමේ වටිනාකම් පියවන ලදි. මෙම පියවීම් පාලක මණ්ඩලය විසින් අනුමත කර ඇත.

1.6 තොගය

පාරිභෝජන තොගය පිරිවැය මත අගය කොට ඇත. අනෙකුත් තොගය පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගය මත අගය කර ඇත. තොගයෙහි පිරිවැය ගණනයේ දී පළමු ලැබීම් පළමු නිකුතු FIFO ක්‍රමය යොදා ගනී.

1.7 ආයෝජන

ස්ථාවර තැන්පතු එම බැංකුවලම නැවත ආයෝජනය කර ඇත.

1.8 වගකීම් හා වෙන් කිරීම්

1.8.1 පාරිතෝෂික

1983 අංක 12 දරන පාරිතෝෂික පනතට අනුව පාරිතෝෂික ගෙවීම් සඳහා වෙන් කිරීම් සිදු කොට ඇත.

2020 වර්ෂයේ පාරිතෝෂික ගෙවීම් මූලික වැටුප හා ජීවන වියදම් දීමනාව පදනම් කරගෙන සකස් කර ඇත.

1.8.2 අසම්භාව්‍ය බැරකම්

නීන්දු ලැබීමට නියමිත නඩු සඳහා අසම්භාව්‍ය බැරකම් වෙන් කර ඇත.

1.8.3 අසම්භාව්‍ය වත්කම්

ශිෂ්‍යත්වලාභී ණයගැතියන්ගෙන් අයකර ගැනීම් සඳහා නීන්දු ලැබීමට නියමිත නඩු මත අසම්භාව්‍ය වත්කම් අගය සැකසී ඇත. එම තොරතුරු පහත පරිදි වේ.

පී.ඩී.ජේ ආනන්ද මහතා

පදිංචි ලිපිනය සොයාගැනීමට නොහැකි වීම මත මෙම නඩුන බහාතබා ඇත. එසේ වුවත්, රු.**1,250,000/-**ක මුදලක් ඇපකරුවන්ගෙන් මේ වන විට අයකරගෙන ඇත. රු. *2,759,754.28* ක ශේෂය පී.ඩී.ජේ ආනන්ද මහතාගෙන් අයකර ගත යුතුව ඇත.

එම්.එස් ගෞරි ශංකර් මහතා

එන්තරවාසි යැවීම සඳහා ඔහුගේ ලිපිනය සොයා ගත නොහැකි වී ඇත. කෙසේ නමුත් ඇපකරුවන් මේ වනවිට රු. *1,250,000.00* ක් ගෙවා ඇත. රු. *3,634,110.07*ක ශේෂය එම්.එස් ගෞරි ශංකර් මහතාගෙන් අයකර ගත යුතුව ඇත.

ආචාර්ය ගාමිණී වික්‍රමසිංහ මහතා

ඔහු දෙවරක් අභියාචනා ඉදිරිපත් කර ඇත. නමුත් ආයතනයට වාසිදායක ලෙස නඩු නීන්දු ඉදිරිපත් කර තිබේ. රිට් ආඥාවක් ලබා ගැනීම සඳහා නීතිපති වෙත ලිපියක් යොමු කර ඇත. පිස්කල් ක්‍රියාමාර්ග සඳහා අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගනිමින් සිටී.

ආර්.අතුකෝරල මිය

ආර්. අතුකෝරල මහත්මියගේ ඇප බැඳුම්කරයේ වටිනාකම රු2,181,521/-ක් වේ. ඇපකරුවන් විසින් රු. 1,250,000/- මේ වන විට ගෙවා ඇත. ඇයගෙන් අයකර ගැනීමට පවතින ශේෂය රු.931,521/- වේ. ඇයට එන්තරවාසි යැවීම සඳහා ලිපිනය සොයාගැනීමට නොහැකි වී ඇත.

පී.ඩී.ආර් කුමාරසිරි මහතා

පී.ඩී.ආර්.කුමාරසිරි මහතාගේ බැඳුම්කරයේ වටිනාකම රු. *499,302.00*ක් වේ. ඇපකරුවන්ගෙන් රු. *166,436.00*ක් අය කර ගෙන තිබේ. අධිකරණය විසින් අනෙක් ඇපකරුවන් දෙදෙනාගෙන් *332,866.98* ක මුදලක් අය කර ගන්නා ලෙස තීන්දු කර තිබේ. කෙසේ වෙතත්, එක් ඇපකරුවෙකුගේ ලිපිනය සොයා ගත නොහැක.

ඒ.සී.කේ සේපාල මිය

ඒ.සී.කේ සේපාල මහත්මියගේ ඇප බැඳුම්කර වටිනාකම රු. *1,249,641.11*ක් වේ. උසාවියේ තීන්දුව අනුව රු. *1,200,000* ක් ඇයගෙන් අයවිය යුතුය. ඇය රු. මේ දක්වා *900,000.00*/- ගෙවා ඇත.

1.8.4 අනිවාර්ය දායකත්ව සැලසුම

සේවකයින්ගේ මාසික වැටුපෙන් පිළිවෙළින් 15% සහ 3% බැගින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියක්තිකයින්ගේ භාර අරමුදලට ආයතනය විසින් දායකත්වය දරනු ලබයි. මෙම දායකත්වයන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ ප්‍රකාරව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වියදමක් ලෙස හඳුනා ගනු ලැබේ.

1.9 මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය

මූල්‍ය කාර්යසාධනය පහත ගැළපීම් සිදු කිරීමෙන් පසු ගණනය කොට ඇත.

a. බොල් හා අඩමාන ණය සහ වෙන් කිරීම් සිදු කිරීම සහ ආයතනයේ එදිනෙදා මෙහෙයුම් වෙනුවෙන් වන අනාගත අසම්භාව්‍යයන් වෙනුවෙන් වෙන් කිරීම් සිදු කර තිබේ. ආයතනයේ දේපොළ, පිරියත සහ උපකරණ ඵලදායී ලෙස නඩත්තු කෙරෙයි.
b. ආදායම් යන්නට ඇතුළත් වන්නේ රජයේ භාණ්ඩාගාරයෙන් ලද අරමුදල්, නේවාසිකාගාර ආදායම්, ශ්‍රවණාගාර ආදායම් සහ අනෙකුත් ආදායම්ය.

2.0 ප්‍රවාහන හා මුද්‍රණ වියදම්

පර්යේෂණ හා පුහුණු අංශ ද ඇතුළුව සියලුම අංශ සඳහා ප්‍රවාහන හා මුද්‍රණ වියදම් ගිණුම්ගත කිරීමට සිදු වේ. එබැවින් එම වියදම් අනුමත අනුපාතයකට ගණනය කොටඑම වියදම එකී අදාළ වියදම් අතර ප්‍රතිශතයකට ගළපා ඇත.

2.1 පර්යේෂණ හා පුහුණු කිරීමේ ක්‍රියාකාරකම් සඳහා ප්‍රාග්ධන ලැබීම.

පර්යේෂණ හා පුහුණු කිරීමේ ක්‍රියාකාරකම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් වෙන්කළ ප්‍රතිපාදන ප්‍රාග්ධන ප්‍රදාන ශීර්ෂය යටතේ ලබා දී ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 38 (LKAS - 38) අනුව පර්යේෂණ පිරිවැය අස්පෘෂ්‍ය වත්කමක් ලෙස සැලකිය හැකිය. නමුත් අප ආයතනයේ පර්යේෂණ පිරිවැය අස්පෘෂ්‍ය වත්කමක් ලෙස සැලකිය නොහැකිය. මන්ද යත් අප ආයතනයේ පර්යේෂණවල අවසාන නිමැවුම ගිණුම්කරණ ප්‍රමිතියේ සඳහන් කර ඇති අවශ්‍යතා සම්පූර්ණ නොකරන බැවිනි. එම නිසා මෙම පර්යේෂණ හා පුහුණු මුළු පිරිවැය මූල්‍ය තත්ත්ව වාර්තාව හර කරමින් එම වියදම පුනරාවර්තන වියදමක් ලෙස සලකනු ලබයි. මෙම ක්‍රියාකාරකම් සඳහා ලද ප්‍රාග්ධන ප්‍රදාන වටිනාකම ද මූල්‍ය තත්ත්ව වාර්තාවෙහි ආදායමක් ලෙස සටහන් කර මෙම වර්ෂයේ ගිණුම් ඉදිරිපත් කර ඇත.

කොවිඩ් 19 වසංගත තත්ත්වය වර්ෂය තුළ අපේ පර්යේෂණ හා පුහුණු කටයුතු කෙරෙහි බලපෑම් කර තිබුණි.

රුපියල්

2 මුදල් හා මුදල් සමාන අයිතමයන්	2020	2019
අතැති මුදල්	20,000.00	20,670.00
බැංකුවේ ඇති මුදල් - ගිණුම් අංක 2323292	8,200,359.31	8,463,976.86
බැංකුවේ ඇති මුදල් - ගිණුම් අංක 2323293	1,045,856.87	2,446,820.21
බැංකුවේ ඇති මුදල් - ගිණුම් අංක 2323315	197,345.25	203,895.78
බැංකුවේ ඇති මුදල් -ගිණුම් අංක 2323317	279,917.54	4,480,820.64
	9,743,478.97	**15,616,183.49**

3 ලැබිය යුතු මුදල්

කාර්ය මණ්ඩල ණයගැතියෝ

නිවාස ණය	281,912.78	401,321.55
ඒකාබද්ධ ණය	23,020,739.13	22,894,203.34
උත්සව දීමනා	5,425.12	6,675.12
ලැබිය යුතු ශ්‍රවණාගාර ආදායම්	13,375.00	509,875.00
ලැබිය යුතු නේවාසිකාගාර ආදායම්	5,113.75	907,145.07
ශිෂ්‍යත්වලාභී ණයගැතියෝ	12,874,881.49	13,486,273.49
වැටුප් අත්තිකාරම්	-	-
විශේෂ අත්තිකාරම් (පොත්)	21,600.00	
	36,223,047.27	**38,205,493.57**
වෙනත් ණයගැතියෝ		
ලැබිය යුතු ආයෝජන ආදායම්	32,041.16	50,612.38
බී.ඒ.ඩී.එස් බහුණුආරච්චි මියගෙන් ලැබිය යුතු	-	48,000.00
ඉවත් වූ සේවකයන්ගෙන් අයකර ගත යුතු	633,881.72	564,378.12
අයකර ගත යුතු වෛද්‍ය රක්ෂණ	200.00	100.00
ණයගැනි-මොබිටෙල් (පුද්) ආයතනය	334,817.72	250,002.51
G-97- දේශගුණික සුහුරු බෝග සහ යාන්ත්‍රිකරණ පරිමාණ	-	325,924.33
ඩිපි හවුස් ආයතනයෙන් ලැබිය යුතු	-	230.00
මෙට්‍රොපොලිටන් ඔෆිස්(පුද්) සමාගමෙන් අයකර ගත යුතු	70.00	70.00
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් අයවිය යුතු	44,800.00	117,800.00
R-481 යාපනය කලපුවෙන් සපයන පරිසර පද්ධති සේවාවන්හි වටිනාකම් සහ අවට	111,921.59	111,921.59
රාජ්‍ය ඌකස් හා ආයෝජන බැංකුවෙන් අයවිය යුතු	39,866.42	47,028.07
දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අයවිය යුතු	962,545.66	1,962,545.66
R-540 එක්සත් ජාත්‍යන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ 'සම්පත් සුරක්ෂිතව වගා කිරීම' ප්‍රවේශය (Save and Grow Approach) ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම සඳහා පදනම් ගොඩනැඟීම	-	809,686.06
	2,160,144.27	**4,288,298.72**
	38,383,191.54	**42,493,792.29**
අඩු කළා:		
බොල් සහ සැකමාන ණය සඳහා වෙන් කිරීම්	(667,829.73)	(519,542.01)
ශිෂ්‍යත්වලාභී ණය ගැනියන් සඳහා වෙන් කිරීම්	(8,923,612.97)	(9,453,504.97)
	28,791,748.84	**32,520,745.31**

4 ලැබිය යුතු

තැන්පතු

ස්ථාවර- භෝජනාගාර භාරකරු	70,000.00	70,000.00
විවිධ-ශ්‍රී ලංකා ටෙලිකොම් (අන්තර්ජාල පහසුකම්)	3,125.00	3,125.00
විවිධ-නැපැල්පති	24,945.00	24,945.00
විවිධ-කොළඹ ගෑස් හා ජල සමාගම	4,750.00	4,750.00
විවිධ-ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය	500.00	500.00
විවිධ- සීමාසහිත සෙල්ටෙල් ලංකා සමාගම	3,500.00	3,500.00
විවිධ- ලංකා විදුලිබල මණ්ඩලය	406,250.00	406,250.00
විවිධ-ඉන්ධන තැන්පතු	100,000.00	100,000.00
	613,070.00	**613,070.00**

රුපියල්

5 කොගය	2020	2019
ප්‍රකාශන හා සහරා	2,801,649.00	2,758,249.00
පරිභෝජන භාණ්ඩ	1,444,485.66	1,538,084.96
අලෙවිසැල	1,109,697.00	932,921.00
	5,355,831.66	**5,229,254.96**

6 පූර්ව ගෙවීම්		
සේවා ගිවිසුම් - ඡායා පිටපත්	-	10,500.00
ගොඩනැගිලි රක්ෂණ	23,779.69	24,567.01
	23,779.69	**35,067.01**

7 අනෙකුත් ජංගම වත්කම්		
බිල දී ගැනීම් අත්තිකාරම්	144,808.80	23,500.00
	144,808.80	**23,500.00**

8 අනෙකුත් මූල්‍ය වත්කම්		
ඇමකුම් තැන්පතු	1,500.00	1,500.00
ස්ථාවර තැන්පතු- රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව	1,500,000.00	1,500,000.00
ස්ථාවර තැන්පතු - රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව නිවාස ණය යෝජනා ක්‍රම	2,623,953.47	2,399,422.99
	4,125,453.47	**3,900,922.99**

9 ගොඩනැගිලි, පිරියන හා උපකරණ

වන්කම් ක්ෂයවීම් පිළිබඳ ප්‍රකාශය - **2020** දෙසැම්බර් **31**

රුපියල්

අයිතම	01.01.2020 දිනට පිරිවැය රුපියල්	2020 වර්ෂය තුළ මිල දී ගැනීම් / (අපහරණය)	2020.12.31 දිනට සමස්ත පිරිවැය	2020.01.01 දිනට සමුච්චිත ක්ෂය	2020 වර්ෂය සඳහා සමුච්චිත ක්ෂය	2020.12.31න් අවසන් දිනට සමුච්චිත ක්ෂය	2020.12.31 දිනට ශුද්ධ වටිනාකම
උපකරණ/ ලී බඩු	60,220,524.97	973,901.30	61,194,426.27	45,649,318.23	2,843,979.20	48,493,297.43	12,701,128.84
පරිගණක සවිකිරීම්	33,981,853.30	7,500.00	33,989,353.30	29,548,472.53	832,308.14	30,380,780.67	3,608,572.63
මෝටර් රථවාහන	71,888,647.00	_	71,888,647.00	71,046,710.80	268,816.40	71,315,527.20	573,119.80
පොත්	15,997,537.35	(2,737.28)	15,994,800.07	13,226,423.21	587,251.07	13,813,674.28	2,181,125.79
සුබ සාධන උපකරණ	3,734.55	-	3,734.55	3,733.55	_	3,733.55	1.00
එකතුව	**182,092,297.17**	**978,664.02**	**183,070,961.19**	**159,474,658.32**	**4,532,354.81**	**164,007,013.13**	**19,063,948.06**

10 ඉඩම් හා ගොඩනැගිලි

##

වන්කම් ක්ෂයවීම් පිළිබඳ ප්‍රකාශය - **2020** දෙසැම්බර් **31**

අයිතම	01.01.2020 දිනට පිරිවැය රුපියල්	2020 වර්ෂය තුළ මිල දී ගැනීම් / (අපහරණය)	2020.12.31 දිනට සමස්ත පිරිවැය	2020.01.01 දිනට සමුච්චිත ක්ෂය	2020 වර්ෂය සඳහා සමුච්චිත ක්ෂය	2019.12.31න් අවසන් දිනට සමුච්චිත ක්ෂය	2019.12.31 දිනට ශුද්ධ වටිනාකම
ඉඩම්	1,857,387.00	_	1,857,387.00	-	-	-	1,857,387.00
ගොඩනැගිලි	55,946,549.56	383,715.00	56,330,264.56	20,106,806.05	1,298,260.09	21,405,066.14	34,925,198.42
	57,803,936.56	**383,715.00**	**58,187,651.56**	**20,106,806.05**	**1,298,260.09**	**21,405,066.14**	**36,782,585.42**

11 <u>සිදු කෙරෙමින් පවතින වැඩ</u>

2020.01.01 දිනට ආරම්භක ශේෂය		1,539,951.30
(අඩු කළා): උපකරණ ගිණුමට මාරු කළා	1,036,301.30	
ගොඩනැගිලි ගිණුමට මාරු කළා	383,715.00	
ණයගැනී ගිණුමට ගැලපුම්		
මල්ටිමීඩියා ප්‍රොජෙක්ටරය (PO 223)	115,000.00	
මයික්‍රෆෝන මුදල ක්ෂය(PO 206)	4,935.00	1,539,951.30
2020.12.31 අවසාන ශේෂය		-

රු.

	ණයහිමියෝ	2020	2019
12	උපචිත වියදම්	9,281,062.21	8,621,848.58
	ගෙවිය යුතු පර්යේෂණ හා පුහුණු වියදම්	470,300.00	1,216,781.39
	ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු	139,462.20	133,462.20
	ආපසු ගෙවිය යුතු භෝජනාගාර තැන්පතු- උපනිස්ස පරණමාන්න	50,000.00	50,000.00
	වැටුප් අත්තිකාරම්	-	-
	නොගෙවූ වියදම්	188,930.44	267,135.56
	ඉවත් වූ සේවකයින් සඳහා ගෙවිය යුතු මුදල්	189,150.61	189,150.61
	ගෙවිය යුතු මුද්දර ගාස්තු	13,550.00	16,225.00
	රඳවාතබා ගත් මුදල	136,526.06	136,526.06
	ණයහිමියෝ	601,748.15	1,720,160.05
	යුබ සාධක සංගමය	11,890.00	-
	ගෙවිය යුතු පාරිතෝෂික මුදල්	126,912.50	126,912.50
	අමාත්‍යාංශයට ගෙවිය යුතු	94,358.05	94,358.05
	කළමනාකරණ සංවර්ධන බැංකුව	8,000.00	10,000.00
	විශේෂ අත්තිකාරම්	-	-
	තේ පර්යේෂණ ආයතනයට ගෙවිය යුතු මුදල්	-	84,000.00
	නාරායනසාමී මහතාට ගෙවිය යුතු	10,800.00	9,000.00
	කලින් ලද නේවාසිකාගාර ආදායම්	26,768.50	43,528.00
	බාහිරින් මුදල් සම්පාදනය කළ ව්‍යාපෘති සඳහා ගෙවිය යුතු	13,712.11	-
	ව්‍යාපෘති ණයහිමියෝ		
	කඩිනම් ආහාර සුරක්ෂිතභාවය සහ අවශෝෂා ඇගයුම	7,774.28	7,774.28
	R- 512 ගෝලීය විවලතා හා නිරසාරබව පිළිබඳ කෘෂිකාර්මික පර්යේෂණ තාක්ෂණික නිල්ධාරීන්ගේ ධාරිතා සංවර්ධනය	22,831.18	22,831.18
	R-530 ශ්‍රී ලංකාවේ තෝරාගත් කලාපවල කෙසෙල්, අඹ සහ අන්නාසි බෝග සඳහා අගයදාම ශක්තිමත් කිරීම සඳහා වූ පාදක අධ්‍යයනය	2,518,787.32	2,716,082.09
	R-535 මහවැලි ගංගා දෝණියේ ජීවත්වන ආන්තික ගොවිජනයාට මුහුණ දෙන දේශගුණික විපර්යාසමය බලපෑම්වලට විසඳුම් සෙවීම	440,981.34	440,981.34
	යේවා ගිවිසුම 03-2017	245,901.88	245,901.88
	R-559 ශ්‍රී ලංකාවේ විවිධ බෝග සඳහා බිංදු ජල සම්පාදනය භාවිතා කිරීමේ බලශක්ති/ජල පාදක නක්සේරුව	695,062.86	695,062.86
	R-අනුරාධපුර දිස්ත්‍රික්කයේ වී නිෂ්පාදනය සඳහා වැඩි දියුණු කරන ලද කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවල බලපෑම පිළිබඳ සාක්ෂි ගොඩනැගීම	89,594.82	1,799,880.00
	සේවා ගිවිසුම 01-2019	527,500.00	415,550.00
	සේවා ගිවිසුම 01-2020	488,404.22	-
	R-540 එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ 'සම්පත් සුරකිමින් වගා කිරීම' ප්‍රවේශය (Save and Grow Approach) ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම සඳහා පදනම් ගොඩනැංවීම	807,072.42	-
		17,207,081.15	**19,063,151.63**

සේවක ප්‍රතිලාභ

13	ජනවාරි 01 දිනට ශේෂය	57,562,752.50	52,241,966.50
	වර්ෂය තුළ ගෙවීම්	1,048,835.00	5,481,894.00
	වර්ෂය සඳහා වෙන් කිරීම්	10,912,232.50	10,802,680.00
	දෙසැම්බර් 31 දිනට ශේෂය	**67,426,150.00**	**57,562,752.50**

රජයේ ප්‍රදාන - ප්‍රාග්ධන

14	ජනවාරි 01 දිනට ශේෂය	44,971,154.73	51,821,985.57
	වර්ෂය තුළ ප්‍රාග්ධන දායකත්වය	500,000.00	17,585,000.00
	පර්යේෂණ හා පුහුණු ක්‍රියාකාරකම් සඳහා ලැබුණු ප්‍රාග්ධන ප්‍රතිලාභ	(500,000.00)	(15,694,578.53)
	වර්ෂය සඳහා ක්‍රමක්ෂය	(5,830,614.90)	(8,741,252.31)
	පර්යේෂණ හා පුහුණු ක්‍රියාකාරකම් සඳහා ලැබුණු ප්‍රාග්ධන ප්‍රතිලාභ	-	-
	වර්ෂය සඳහා ක්‍රමක්ෂය	**39,140,539.83**	**44,971,154.73**

සංචිත

15	ව්‍යාපෘති ප්‍රාග්ධන අරමුදල්	-	-
	ප්‍රාග්ධන සංචිත	1,675,000.00	1,675,000.00
	දීමනා අරමුදල- ආයතනික කොටස	1,701,906.90	1,701,906.90
		3,376,906.90	**3,376,906.90**

දීමනා හා පුහුණු අරමුදල

16	දීමනා අරමුදල ව්‍යාපෘති - 10%	8,611.38	8,611.38
		8,611.38	**8,611.38**

LKR

	සමුච්චිත ඌනතා ගිණුම	2020	2019
17	ජනවාරි 01 දිනට ශේෂය	(5,259,242.92)	(3,230,944.18)
	ආයතනික අරමුදලින් මිල දී ගත් වාහන සඳහා ප්‍රත්‍යාගණිත සංචිත ගැලපීම	-	-
	2014 භාණ්ඩාගාර අරමුදලින් මිල දී ගත් වාහන සඳහා ප්‍රත්‍යාගණිත සංචිත ගැලපීම	-	-
	පෙර වර්ෂ ගැලපීම	(135,674.92)	-
	පෙර වර්ෂ ගැලපීම - වර්ෂය සඳහා	(944,921.00)	37,052.86
	දෙසැම්බර් 31 දිනට ආදායම ඉක්ම වූ වියදම	(16,201,195.71)	(2,065,351.60)
	දෙසැම්බර් 31 දිනට ශේෂය	**(22,541,034.55)**	**(5,259,242.92)**

	අනෙකුත් ආදායම්		
18	නේවාසිකාගාර ගාස්තු	4,779,071.00	13,303,731.02
	සම්මන්ත්‍රණශාලා ගාස්තු	6,015,100.00	15,997,250.00
	ආදායම්- මොබිටෙල් පාරිභෝගික සේවාවෙන්	84,815.21	120,200.77
	ප්‍රකාශන විකිණීමෙන් ලද ආදායම්	21,095.00	80,309.00
	ආයෝජන පොළී	232,900.85	256,888.99
	කාර්ය මණ්ඩල ණය පොළී	942,952.18	933,952.13
	ව්‍යාපෘතිවලින් ලද පුනරාවර්තන ආයකන්වය	129,975.24	846,932.77
	සංචාරක බංගලා ගාස්තු සහ කාමර කුලී	99,078.00	91,619.95
	පැල්වෙහෙර නවානැන් ගාස්තු	-	28,950.00
	පරිගණක ආදායම්	308.00	-
	මිනිස් බල ආදායම්	838,872.39	64,002.43
	අනෙකුත් ආදායම්	5,896,770.40	129,975.91
	සැපයුම්කරුවන් ලියාපදිංචිය	-	177,000.00
	වෙළඳ දැන්වීම් ආදායම්	19,450.00	32,250.00
	තොග අතිරික්තය	-	19,870.00
	ප්‍රශ්නාවලිය සංස්කරණය දත්ත විශ්ලේෂණය කිරීම ආදායම්	240,000.00	-
	වාර්තා ලිවීම (අතුරු, දත්ත සහ අවසාන වාර්තාව) ආදායම්	450,000.00	-
	සහල් සහ වෙනත් ක්ෂේත්‍ර බෝග අංග පිළිබඳ පසුබිම් දත්ත සම්පාදනය කර සවිස්තර පසුබිම් ලේඛනයක් කෙටුම්පත් කිරීමෙන් ලද ආදායම්	50,000.00	-
	ආර්ථික විද්‍යාත්මක විශ්ලේෂණය සහ අර්ථ නිරූපණ සඳහා ආදායම්	48,000.00	-
	අබලි භාණ්ඩ විකිණීම්	12,050.00	-
	ටෙන්ඩර් ගාස්තු	3,000.00	-
		19,863,438.27	**32,082,932.97**

	වැටුප්, වේතන සහ සේවක ප්‍රතිලාභ		
19	වැටුප්-ස්ථිර කාර්ය මණ්ඩලය	92,684,649.23	86,888,993.04
	වැටුප් - අනියම් විමර්ශක	8,328,830.00	12,932,062.53
	ජීවන වියදම් දීමනාව,විශේෂ දීමනාව හා වෙනත් දීමනා	24,739,048.30	31,451,303.22
	සේවක අර්ථ සාධක අරමුදල	17,513,688.15	17,485,167.32
	සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල	3,502,736.83	3,497,032.27
	අනිකාලදීමනා	2,399,683.47	5,051,178.77
	පාරිතෝෂික	10,912,232.50	10,802,680.00
		160,080,868.48	**168,108,417.15**

රුපියල්

		2020	2019
	අනෙකුත් වියදම්		
20	ගමන් වියදම් හා යැපීම් දීමනා	972,663.05	1,746,142.18
	විදේශීය ගමන් වියදම්	-	67,772.77
	ලිපිද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා	807,231.78	3,034,873.17
	ඉන්ධන ලිහිසි තෙල්	424,812.30	1,212,026.39
	නිල ඇඳුම්	163,108.40	415,708.42
	වාහන අලුත්වැඩියා	725,810.67	1,553,772.54
	ගොඩනැගිලි නඩත්තු කටයුතු	280,962.90	2,048,644.33
	යන්ත්‍රෝපකරණ නඩත්තු කටයුතු	1,095,475.24	1,835,323.58
	දුරකථන ගාස්තු	3,795,190.74	3,295,188.47
	විදුලිය	3,145,444.20	5,162,274.02
	ජල බිල්පත්	495,343.09	1,156,255.88
	බදු සහ වරිපනම්	579,456.00	579,456.00
	තැපෑල් ගාස්තු	250,100.00	609,870.00
	ප්‍රවාහන	347,939.96	594,560.00
	වාහන සඳහා කාර්මික උපදෙස්	60,000.00	90,000.00
	ඉදිකිරීම් සඳහා කාර්මික උපදෙස්	30,000.00	90,000.00
	පුවත්පත්	125,080.00	271,796.00
	බලපත්‍ර සහ රක්ෂණය	802,103.77	1,061,870.63
	ආරක්ෂක ගාස්තු	5,053,160.00	3,036,000.00
	පිරිසිදු කිරීමේ ගාස්තු	726,644.02	1,240,080.49
	රෙදි සේදීම්	225,645.00	435,520.00
	විගණන ගාස්තු	747,606.00	986,000.00
	වෛද්‍ය ගාස්තු	978,500.00	1,015,500.00
	ඖෂධශාලා ගාස්තු	75,410.00	109,034.00
	විවිධ වියදම්- අනෙකුත්	138,602.20	368,447.00
	නීති ගාස්තු	102,000.00	591,716.00
	සුබ සාධක	98,159.00	200,475.00
	දැන්වීම්	18,360.00	1,908,253.01
	සම්මිශ්‍ර පරීක්ෂණ ගාස්තු	-	68,801.00
	පාලක මණ්ඩලය	83,015.00	608,435.00
	මුද්‍රණ හා ප්‍රකාශන	823,768.80	1,915,540.02
	තොරතුරු බෙදාහැරීම්	395,575.00	669,675.00
	අලෙවි වියදම්- ප්‍රකාශන	21,449.00	80,059.00
	රද්දා ගැනීමේ බදු	-	13,881.79
	විගණන හා කළමනාකරණ කමිටු	60,972.00	63,721.00
	කාර්ය මණ්ඩල සංවර්ධනය	444,566.43	2,101,080.92
	කාර්යක්ෂමතා කඩිඉම් විභාග ගාස්තු	-	478,500.00
	පරිවර්තන ගාස්තු	50,290.00	150,547.50
	උපකරණ හා අනෙකුත් දෑ සඳහා තාක්ෂණික උපදෙස්	30,000.00	89,500.00
	මුද්‍රිත පොත් මත අලාභය	-	1,560.00
	තොග ඌනතා	-	8,200.00
	අබලි භාණ්ඩ විකිණීම්	18,420.00	308,502.09
		24,192,864.55	**41,274,563.20**

අබලි පරිභෝජන භාණ්ඩ අපහරණ අලාභය

20.1	වියදම්	-	314,402.09
	ආදායම්	-	(5,900.00)
	අබලි පරිභෝජන භාණ්ඩ අපහරණ අලාභය	-	**308,502.09**

21 ගෙවිය යුතු වටිනාකම්- මුදල් ප්‍රවාහ සටහන්

2020.01.01 ආරම්භක ශේෂය	19,063,151.63
2020.12.31 අවසාන ශේෂය	17,207,081.15
වෙනස	(1,856,070.48)
Non Cash effected-Adjustment creditor A/C	119,935.00
	(1,736,135.48)

යටිතල පහසුකම් - යන්ත්‍රසූත්‍ර

22 පරිගණක රවුටර් මිල දී ගැනීම්	7,500.00
(-) මුදල් ගණක යන්ත්‍රය විකිණීමේ මිල	(300.00)
	7,200.00

මගේ අංකය எனது இல. My No. } ඒජීඑල්/ඩී/එච්ඒආර්/01/20/17 ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2021 ජූනි 30 දින

සභාපති

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන.

1.1 **තත්ත්වාගණනය කළ මතය.**

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම.

1.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 48 ඡේදය ප්‍රකාරව ප්‍රමිති මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් හිලව් නොකළ යුතු වුවත් පෙර වර්ෂවලදී පැල්වෙහෙර සංචාරක නිකේතනය අලුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම වෙනුවෙන් දඹුල්ල ප්‍රාදේශීය ලේකම්ගෙන් ප්‍රතිපූර්ණය කරගත යුතු රු. 1,962,545 ක් එම සංචාරක නිකේතනය වෙනුවෙන් 2011 දෙසැම්බර් 12 දින සිට 2019 දෙසැම්බර් 12 දින දක්වා ගෙවිය යුතු රු. 1,000,000 ක බදු කුලියට හිලව් කර ගිණුම්ගත කර තිබුණි. මෙම මුදල ප්‍රතිපූර්ණය කර ගැනීම සඳහා ඵලදායී ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු.

2020 ඔක්තෝබර් 08 දින සිට 2020 දෙසැම්බර් 31 දින දක්වා අග්‍රාමාත්‍ය කාර්යාලයේ ආරක්ෂක නිලධාරීන්ට කාමර පහසුකම් ලබාදීම වෙනුවෙන් අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් රු. 1,363,000 ක් අයවිය යුතු බව ලේඛකාධිකාරී විසින් 2021 පෙබරවාරි 11 දින අග්‍රාමාත්‍ය අතිරේක ලේකම් අමතන ලද අංක 10/01/82(v) දරන ලිපියේ සඳහන් වුවද එම මුදල සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු ආදායමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. මේ හේතුවෙන් නේවාසිකාගාර ආදායම සහ ලැබිය යුතු ආදායම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ආයතනයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබාදීමට බලාපොරොත්තු වන ආයතනයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

ආයතනයේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම.

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1)(ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද, මෙම වාර්තාවේ 1.2.1, 2.2.1 (අ), (ආ), 2.2.3 (ඉ), 2.3 (ආ), (ඊ), (උ) ඡේදවල දැක්වෙන නිරීක්ෂණ හැර අනෙකුත් නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2. අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැරයම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක ආයතනය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
(අ)	මු.රෙ. 756	2020 වර්ෂයේ පුස්තකාල පොත් සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකර වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.
(ආ)	2010 දෙසැම්බර් 14 දිනැති අංක PED 55 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	2020 වර්ෂයේ විගණන කමිටු රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර නොමැති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) 2012-2015 කාල පරිච්ඡේදය තුළ රු. 1,031,020 ක පිරිවැයක් දරා ප්‍රධාන කාර්යාලයේ ස්ථාපිත කර තිබූ ජීව වායු ඒකකය 2016 වර්ෂයේ සිට ක්‍රියා විරහිතව පැවති අතර, ඒ වෙනුවෙන් 2018 වර්ෂයේදී රු. 22,500 ක් අත්තිකාරම් වශයෙන් ගෙවා බැලූනයක් මිලදී ගෙන තිබුණද ඒකකයේ අනෙකුත් ක්‍රියාකාරීත්වයන්ගේ දෝෂ පැවතීම තුළ එම බැලූනය ස්ථාපිත කර නොතිබුණු අතර 2020 දෙසැම්බර් 31 දින වන විට ඒකකයේ මුළු වියදම රු. 1,053,520 ක් වී තිබුණි. එය දීර්ඝ කාලයක් අලුත්වැඩියා නොකර තිබීම හේතුවෙන් එහි උපාංග අක්‍රීය වී නැවත භාවිතයට ගත නොහැකි තත්ත්වයට පත්වී තිබුණි.

(ආ) 2015, 2016, 2018 හා 2019 වර්ෂවල රු. 4,453,000 ක් වැයකර ආයතනය විසින් ආරම්භ කර තිබුණු පර්යේෂණ ව්‍යාපෘති 07 ක් වර්ෂ 01 ක සිට වර්ෂ 05 දක්වා කාලයක් ගත වී තිබුණත් 2020 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණි. එම තත්ත්වය හේතුවෙන් කාලීන අවශ්‍යතා මත සිදුකරන පර්යේෂණ වැඩසටහන් තුළින් නියමිත කාලසීමාව තුළ අදාළ නිර්දේශ අවශ්‍ය පාර්ශව වෙත ලැබී නොතිබුණි.

(ඇ) 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් 2019 වර්ෂයේ ආරම්භ කර 2020 වර්ෂයේ අවසන් කළ යුතු පර්යේෂණ ව්‍යාපෘති 11 ක් සඳහා රු. 8,366,000 ක් වැයකර තිබුණද 2020 දෙසැම්බර් 31 දින වන විටත් ඒවා නිමකර වාර්තා ප්‍රසිද්ධියට පත්කර නොතිබුණි.

(ඈ) ආයතනයේ ප්‍රමුඛතම කාර්යයක් වන පර්යේෂණ වැඩසටහන් සිදු කිරීමෙන් ජනනය වන පර්යේෂණ සොයා ගැනීම් හා නව දැනුම අවශ්‍ය පාර්ශවයන් වෙත ලබාදීම සඳහා හඳුනාගත් වැඩසටහන් වාර්ෂිකව හෝ යම් කාල සීමාවකට වරක් විධිමත්ව ක්‍රියාත්මක නොවන බව නිරීක්ෂණය වූ අතර 2017, 2018, 2019 සහ 2020 වර්ෂවලදී පර්යේෂණ වාර්තා එළි දැක්වීමේ කාර්යය සඳහා ක්‍රියාකාරී සැලසුම් මගින් ප්‍රතිපාදන වෙන් කිරීමද සිදුකර නොතිබුණි.

(ඉ) 2017 වර්ෂයේදී ආයතනයේ නව ශාලාවේ වහලය අලුත්වැඩියා කිරීම සඳහා මිලදී ගත් රු. 123,220 ක් වටිනා ඇස්බැස්ටෝස් ෂීට් 82 ක් අදාළ කාර්යය සිදු නොකර අනාරක්ෂිතව ආයතනය තුළ ගබඩා කර තිබුණු අතර ඒවායින් බොහෝමයක් සමාලෝචිත වර්ෂය වන විට කැඩී බිඳී ගොස් තිබුණි.

2.3. වෙනත් කරුණු.

(අ) 2019 වර්ෂයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

(ආ) 2020 දෙසැම්බර් 31 දිනට ආයතනයේ 2002 වර්ෂයට පෙර සිට පැවත එන විදේශ ශිෂ්‍යත්වලාභී ණයගැතියන්ගෙන් රු. 12,874,881 ක මුදලක් අයවිය යුතුව පවතින අතර ඒවා අයකර ගැනීමට අපොහොසත්ව තිබුණි.

(ඇ) 2006 ජනවාරි 03 දින නීතිපති වෙත නඩු පැවරීමට දන්වා තිබුණද එතෙර ලිපිනය නොමැති වීම නිසා විදේශ ශිෂ්‍යත්ව ණයගැතියෙකු වන පර්යේෂණ නිලධාරී එම්.එස්. ගෞරී ශංකර් යන අයට විරුද්ධව නීතිමය පියවර ගැනීමට නොහැකි වීම හේතුවෙන් ඔහුගෙන් 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු. 3,634,110 ක මුදලින් කිසිදු මුදලක් 2020 වර්ෂය තුළදීද අයකර ගැනීමට නොහැකි වී තිබුණු අතර එම ලිපිනය සොයාගැනීම පිළිබඳව ආයතනයේ ප්‍රමාණවත් අවධානය යොමු වී නොතිබුණි.

(ඈ) 2020 දෙසැම්බර් 31 දිනට රු. 25,508,310 ක් වූ මුළු ණයගැති ශේෂයෙන් විදේශ ශිෂ්‍යත්වලාභී ණයගැතියෝ හැර අනෙකුත් ණයගැති ශේෂයෙන් රු. 610,215 ක් වර්ෂ 05 කට වැඩි කාලයක සිට අය නොවී පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය. මෙම ණය ශේෂය තුළ රු. 482,304 ක මුදලක් සේවකයින්ගෙන් අයවිය යුතුව ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු. 17,207,081 ක ණයහිමි ශේෂය තුළ රු. 626,737 ක වර්ෂ 05 කට වැඩි කාලයක සිට නිරවුල් නොකළ ශේෂයක් පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඊ) කෘෂිකර්ම අමාත්‍යවරයාගේ ආරක්ෂක නිලධාරීන් සඳහා නේවාසිකාගාරයේ කාමර කුලියට දීම වෙනුවෙන් 2015 සැප්තැම්බර් සිට 2018 ජූලි මස දක්වා කාලයට අයවිය යුතු රු. 8,895,470 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය විසින් ආයතනය වෙත ලබා දී ඇති අංක 40 – 3933 දරන වාහනය නීත්‍යානුකූලව හිමිකාරීත්වය ආයතනය වෙත පවරාගෙන නොමැති අතර 2015 වර්ෂයේ සිට අභාවිතව පැවතුණි.

ඩබ්ලිව්.පී.සී වික්‍රමරත්න
විගණකාධිපති

<u>හෙක්ටර් කොඩ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ **2020** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව **2018** අංක **19** දරන ජාතික විගණන පනතේ **12** වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාවට අදාල පිලිතුරු</u>

1.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත.

මෙම මුදල් ප්‍රතිපූර්ණය කරගැනීම සඳහා දඹුල්ල ප්‍රාදේශීය ලේකම් වෙත ලිඛිත ඉල්ලීම් කර ඇත. නමුත් **2020/08/11** අංක **5/3/9/3/28** දරණ ලිපිය මගින් ඔවුන් එකඟතාව ලබාදී නොමැත. නැවත වැඩිදුර කරුණු දක්වමින් **2021/04/19** දිනැති **AD/2/5/0/08** දරණ ලිපිය ප්‍රාදේශීය ලේකම් දඹුල්ල වෙත යොමුකර ඇත. තවදුරටත් මෙම මුදල අයකරගැනීමට අවශ්‍ය කටයුතු කරමි.

1.2.2. ගිණුම්කරණ අඩුපාඩු

මෙම අග්‍රාමාත්‍ය කාර්යාලයේ නිලධාරීන්ට කාමර ලබාදීමට අදාල බිල්පත් පිලියෙල කිරීම **2021** වර්ෂයතුල සිදුවීම මත **2020** වර්ෂයේ ගිණුම් ගත කිරීමට නොහැකි විය. මෙම අදායමට අදාල ගැලපීම් **2021** වර්ෂයතුල සිදුකර ඇත.

2.

2.2.2 (අ) **2020** වර්ෂයේ පුස්තකාල පොත් සමීක්ෂණයේ කෙටුම්පත් වාර්තාව පිලියෙලකර ඇත.අවසන් වාර්තාව ඉදිරියේදී විගණනය සඳහා ඉදිරිපත් කරමි.

(ආ) එකඟවෙමි.

2020 වර්ෂයේ පැවති කොරෝනා වසංගත ත්ත්තවය මත විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් **2**ක් පමණක් පැවැත්විය. නමුත් **2021** වර්ෂයේ පළමු කාර්තුව තුල විගණන හා කළමනාකරණ කමිටු **2**ක් පවත්වා ඇත. **2021** වර්ෂයේ මෙම වසංගත තත්ත්වය පැවතියද **online** තාක්ෂණය උපයෝගී කරගනිමින් අදාල රැස්වීම් පැවැත්වීමට කටයුතු කරමි.

2.2.4 (අ) එකඟවෙමි.

මෙම අත්තිකාරම් මුදල පියවීමට කටයුතු කර ඇත. තවද මෙම ජීව වායු ඒකකය සම්බන්ධයෙන් මු.රෙ. **104** ප්‍රකාරව කටයුතු කිරීමට අධ්‍යක්ෂතුමා කමිටුවක් පත්කර ඇති අතර එම කමිටුවේ නිර්දේශය මත ඉදිරි කටයුතු කරමි.

(ආ) **2015** සිට **2009** වර්ෂවල සිදු කල පර්යේෂණ **07** හි වර්තමාන ප්‍රගතිය මෙලෙස දක්වා ඇති අතර ඉන් එක් පර්යේෂණ වාර්තාවක් මුද්‍රණය කොට බෙදා හැර ඇත.

වර්ෂය	පර්යේෂණ අංකය	වර්තමාන ප්‍රගතිය
2015	**R – 500**	පර්යේෂණ වාර්තාව අවසන් අතර එහි කවරය නිර්මාණය කරමින් පවතී.
2016	**R – 517**	පර්යේෂණ වාර්තාව අවසන් අතර එහි කවරය නිර්මාණය කරමින් පවතී.
2016	**R – 511**	වාර්තාව මුද්‍රණය සඳහා යොමුකර ඇත.
	R – 513	බාහිර විමර්ශකයින්ගේ අදහස් ලබා ගැනීමට වාර්තාව යොමු කොට ඇත.
	R – 542	පර්යේෂණ වාර්තාව අවසන් අතර එහි කවරය නිර්මාණය කරමින් පවතී.
2018	**R – 534**	පර්යේෂණ වාර්තාව මුද්‍රණය කොට බෙදා හැර ඇත.
2019	**R – 551**	අතිරේක අධ්‍යක්ෂකගේ අදහස් ලබා ගැනීමට වාර්තාව යොමු කොට ඇත. .

2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් පහත පර්යේෂණ ව්‍යාපෘති **11** වර්තමාන ප්‍රගතිය පහත දක්වා ඇත.

(ඇ)

ව්‍යාපෘති අංකය	වර්තමාන ප්‍රගතිය
R – 545	සංස්කරණ කටයුතු සිදුකරමින් පවතී.
R – 547	සංස්කරණ කටයුතු සිදුකරමින් පවතී.
R – 548	සෝදුපත් කියවා අවසන් කර ඇත.
R - 549	සංස්කරණ කටයුතු අවසන් කර ඇත..
R - 550	බාහිර විමර්ශකයින්ගේ අදහස් ලබා ගැනීමට වාර්තාව යොමු කොට ඇත.
R - 552	සංස්කරණ කටයුතු සිදුකරමින් පවතී.
R - 553	අතිරේක අධ්‍යක්ෂකගේ අදහස් ලබා ගැනීමට වාර්තාව යොමු කොට ඇත. .
R - 554	බාහිර විමර්ශකයින්ගෙන් අදහස් ලබා ගැනිම සඳහා වාර්තාව යොමු කිරිමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.
R - 555	බාහිර විමර්ශකයින්ගෙන් අදහස් ලබා ගෙන ඇති අතර වාර්තාව වැඩි දියුණු කරමින් පවතී.
R - 556	බාහිර විමර්ශකයින්ගෙන් අදහස් ලබා ගැනිම සඳහා වාර්තාව යොමු කිරිමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.
R - 560	සංස්කරණ කටයුතු සිදුකරමින් පවතී.

(ඇ) ආයතනය මගින් වාර්ෂිකව සිදුකරන පර්යේෂණ එළි දැක්වීම් (Research Colloquium) 2015 වර්ෂයේදී අවසාන වශයෙන් සිදු කරන ලදී. නමුදු විවිධ පාර්ශවයන් සඳහා ආරාධනා කළද පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය 20% අඩු ප්‍රමාණයක පැවතීම නිසා පර්යේෂණ සොයා ගැනීම් හා නව දැනුම අවශ්‍ය පාර්ශවයන් වෙත ලබා දීම සඳහා විවිධ වැඩසටහන් 2016 වර්ෂයෙන් පසුව සිදු කරන ලදී.

a) උදා ; ක්ෂේත්‍රවලට අදාලව පර්යේෂණ එකට එකතු කොට වෙන් වෙන්ව පාර්ශවකරුවන් සමඟ පර්යේෂණ සොයාගැනීම් හා නව දැනුම බෙදා හැරීම.

i. මහවැලි ජනපදිකයන් ආශ්‍රිතව සිදු කළ පර්යේෂණ එකතු කොට එක් පර්යේෂණ සැසියක් පැවැත්වීම.
ii. පොලිතින් ෂොපින් බෑග් හා ලන්ච් ෂීට් වෙනුවට විකල්ප භාවිතයන් හඳුනාගැනීම පිළිබඳ සිදු කරන අධ්‍යයනය
iii. ශ්‍රී ලංකාවේ පලතුරු සහ එළවළු සඳහා "යහපත් කෘෂිකාර්මික පිලිවෙත්" (SLGAP) වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී ඇති අභියෝග සහ ප්‍රවණතා
iv. ඌව සහ නැගෙනහිර වන ජීවී කලාප ආශිත වන සත්ත්ව මිනිස් ගැටුම පිළිබඳ අධ්‍යයනය

b) විවිධ කමිටු නියෝජනය කරමින් පර්යේෂණ නිලධාරින් සහභාගී වීම තුලින් නවදැනුම හා සොයාගැනීම් එම ක්ෂේත්‍ර වල ඉදිරි වැඩසටහන් වලට එකතු කිරීම.

2017, 2018, 2019 සහ 2020 වර්ෂවලදී පර්යේෂණ වාර්තා එළි දැක්වීමේ කාර්යය සඳහා වෙනම ප්‍රතිපාදන වෙන් නොකළ අතර එය "Seminar, Workshop, Public Lecture" වශයෙන් වෙන් වූ වැය ශීර්ෂය යටතේ මුදල් වෙන් කිරීම සිදු විය.

(ඉ) පසුගිය වර්ෂය තුල අවස්ථා කිහිපයකදී මෙම නව ශාලාවේ අලුත්වැඩියාව සඳහා මිල ගණන් කැඳවූ නමුත් කිසිදු ටෙන්ඩර්කරුවෙකු අලුත්වැඩියා කටයුතු සඳහා ඉදිරිපත්වී නොමැති බැවින් අලුත්වැඩියා කිරීම ප්‍රමාද වී ඇත. මෙම අලුත්වැඩියාව සඳහා අවශ්‍ය කටයුතු ප්‍රසම්පාදනය කර මෙම ෂීට් ඒ සඳහා යොදාගැනීමට කඩිනමින් ඉදිරියේදී කටයුතු කරමි.

2.3 (අ) 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය වෙත 2021-03-04 දින යොමුකර ඇත. 2020 වර්ෂය තුල පැවති Covid 19 වසංගත තත්ත්වය මත වාර්ෂික වාර්තා පිලියෙල කිරීම හා පාලක මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම ප්‍රමාද විය. අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබුණු වහාම 2019 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට අවශ්‍ය කටයුතු කරමි.

(ආ) 2020 දෙසැම්බර් 31 දිනට ආයතනයේ විදේශ ශිෂ්‍යත්වලාභී ණයගැතියන්ගෙන් රු.12,874,881.49 මුදලක් පමණක් අයවිය යුතුව තිබුණි. ආයතනය විසින් පසුගිය වසර දහය තුල විදේශ ශිෂ්‍යත්වලාභී ණය ගැතියන් පිළිබඳ විශේෂ අවධානයක් යොමු කොට ඒ සම්බන්ධව උපායශීලීව කටයුතු කිරීම නිසා පහත ප්‍රගතිය ලගා කරගැනීමට හැකි විය.

වර්ෂය	ශිෂ්‍යත්වලාභී ණයගැතියන්	අය විය යුතු මුදල (රු.)
2012	**12**	**27,388,114.85**
2020	**6**	**12,8274,881.49**

ඒ අනුව **2012** සිට **2020** දක්වා විදේශ ශිෂ්‍යත්වලාභී ණයගැතියන් **6** දෙනෙකු නිරවුල් කරගැනීමටද රු.**14,562,985.00** ක මුදලක් ආයතනයට ණයගැතියන් වෙතින් ලබා ගැනීමට හැකිවීම ද සාර්ථක ප්‍රතිඵල ලෙස පෙන්වා දිය හැකිය.

මෙම තත්ත්වය යටතේ **2020** වර්ෂය ආරම්භයේදී අයවිය යුතු වූ මුදල රු.**13,486,273.49** විය. නමුදු ශිෂ්‍යත්වලාභී ණයගැතියෙකු වූ එස්.ඩී.අබේරත්න මහත්මියගෙන් රු.**501,392.00** මුදල **2020** වර්ෂයේදී ලබා ගැනීමට හැකිවූයේද ආයතනය විසින් **2019** වර්ෂයේ සිදු කල උපායමාර්ගික ක්‍රියාදාමයේ ප්‍රතිඵලයක් ලෙසය.

(ඇ) පර්යේෂණ නිලධාරී එම්.එස්. ගෞරි ශංකර් මහතාගේ නඩුව පිලිබඳ දැනුම් දීමේ ලිපිය **(Letter of Demand)** යැවීමට නොහැකිවී ඇත්තේ ඔහුගේ වර්තමාන ලිපිනය සොයාගැනීමට නොහැකි වීමයි. නමුත් ආයතනය විසින් එම ලිපිනය සොයාගැනීමට විවිධ ක්‍රියාමාර්ග වෙත යොමු වුවද එය ප්‍රමාණවත්වී නොමැත. ආයතනය විසින් ගත් ක්‍රියාමාර්ග පහත පරිදි වේ.**1**

වර්ෂය	සිදු කරන ලද ක්‍රියාකාරකම්
2013	ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත සියලු ශිෂ්‍යත්වලාභී ණයගැතියන් සම්බන්ධයෙ තොරතුරු කෘෂිකර්ම අමාත්‍යාංශය හරහා යොමු කිරීම.
2015	අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව **(CID)** හා ශ්‍රී ලංකාවේ පිහිටි ඕස්ට්‍රේලියානු තානාපති කාර්යාලය වෙත කෘෂිකර්ම අමාත්‍යාංශය හරහා ලිපි යොමු කිරීම. මෙහිදී **CID** විසින් ඔවුන්ගේ කාර්යභාරයට මෙය අදාල නොවන බව දන්වා එවා තිබුණි.
2019	සිංහල, ඉංග්‍රීසි හා දෙමළ භාෂාමය පුවත්පත් වල සියලු ශිෂ්‍යත්වලාභී ණයගැතියන් හා ඔවුන්ගේ මුදල සම්බන්ධයෙන් දැන්වීමක් ප්‍රකාශයට පත් කිරීම.
2019	ඕස්ට්‍රේලියාවේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය වෙත ශිෂ්‍යත්වලාභී ණයගැතියන් පිළිබඳ තොරතුරු විමසීම. ලිපි යොමු කිරීම හා ඒ පිළිබඳව තානාපති කාර්යාලයේ නියෝජ්‍ය මහකොමසාරිස් වෙත සහකාර ලේඛකාධිකාරී (වැඩසටහන්) දුරකථනය මගින් සම්බන්ධ වී (සම්බන්ධව කරුණු විමසන ලදී. එහිදී මෙම ණයගැතියන් ඕස්ට්‍රේලියාවේ සිටියද ඔවුන් දැනට ඕස්ට්‍රේලියානු පුරවැසිභාවය ලබා සිටින බැවින් ඔවුන්ගේ වර්තමාන ලිපිනයන් ලබා ගැනීමට ඇති අපහසුතාවය පෙන්වා දෙන ලදී.

(ඇ) **විදේශ ශිෂ්‍යත්වලාභී ණයගැතියන් හැර අනෙකුත් ණයගැතියන්ගේ වර්ෂ 5ට වැඩි ශේෂය සැකසී ඇති ආකාරය පහත පරිදි වේ.**

උත්සව අත්තිකාරම්	රු. **5,425.12**
ලැබිය යුතු නේවාසිකාගාර ආදායම	රු. **5,113.75**
ලැබිය යුතු සම්මන්ත්‍රණ ශාලා ආදායම	රු. **10,875.00**
ආයතනයෙන් ඉවත්ව ගිය සේවකයන්ගෙන් ලැබිය යුතු	රු.**476,879.87**
R-481 ව්‍යාපෘතිය වෙනුවෙන් ලැබිය යුතු වටිනාකම	**රු.111,921.59**
	රු.610,215.33

- **උත්සව අත්තිකාරම් සඳහා අයකර ගත යුතු ශේෂය 2021 වර්ෂය ආරම්භයේ අයකර ගැනීමට කටයුතු කර ඇත.**

- **R-481 යාපනය කලපුවේ පද්දතිය සපයන සේවා හා ඒ අවට ගම්මාන වල ජීවනෝපයන් සඳහා දක්වනු ලබන දායකත්ව පරීක්ෂණය පිලිබඳ ව්‍යාපෘතියෙන් අයවිය යුතු මුදලයි. මෙය සම්බන්ධයෙන් AGL/D/ADD/02/20/02 දරණ විගණන විමසුමද යොමුකර ඇත. ඊට අදාල පිලිතුරු විගණකාධිපති වෙත යොමුකර ඇත. ඉදිරියේදී පවත්වනු ලබන විගණන හා කළමනාකරණ කමිටුවට මෙය තව දුරටත් උපදෙස් සඳහා යොමුකර එම උපදෙස් මත කටයුතු කරමි.**
- **ආයතනයේ සේවයකර සේවයෙන් ඉවත්ව ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු වර්ෂ 5කට වැඩි ශේෂය රු.476,879.87 වේ. එය පහත පරිදි වේ.**

(1)	**එම්.ජී.එම්. රශාක් මහතා**	**- රු.212,819.90**
(2)	**එච්.කේ.එස්. ප්‍රේමලාල් මහතා**	**- රු. 18,732.35**
(3)	**එල්.කේ. ජයසේකර මහතා**	**- රු. 29,086.38**
(4)	**රංගන අතුකෝරල මහතා**	**- රු. 19,474.50**
(5)	**ඒ.එම්.ඩී.එන්. තෙන්නකෝන් මහතා**	**- රු. 196,767.29**
		රු. 476,879.87

(1) **එම්.ජී.එම්. රශාක් මහතා - රු.212,819.90**

මෙම රශාක් මහතා විදේශ ශිෂ්‍යත්වලාභී ණයගැතියෙකුගේ ඇපකරුවකු වන අතර ඔහුගේ ලිපිනය සොයාගැනීමට නොමැත. ඔහුටද විදේශ ශිෂ්‍යත්වලාභී ණයගැතියන් යටතේ නීති කටයුතු සිදුකරමින් පවතී.

(2) **එච්.කේ.එස්. ප්‍රේමලාල් මහතා - ර. 18,732.35**

එච්.කේ.එස්. ප්‍රේමලාල් මහතාගෙන් 2011-09-03 දිනට සේවය හැරයාමේදී අයවියයුතු මුදල රු.152,525.25 වේ. නමුත් මෙම ශේෂය අන්තර්ගතවී ඇති ආපදා ණය මුදල ආයතනයේ

දැනට සේවය කරන ඔහුගේ ඇපකරුවන්ගෙන් අයකරමින් පවතී. එබැවින් මොහුගෙන් **2020-12-31** දිනට අයවිය යුතු ශේෂය රු. **18,732.35** වේ. නීතිමය කටයුතු සඳහා යොමුකර ඇත.

(3) එල්.කේ. ජයසේකර මහතා

ආයතනයේ හිටපු අධ්‍යක්ෂවරයෙක් වේ. **2015-01-09** දිනට ජයසේකර මහතාගෙන් අයවියයුතු ශේෂය රු.**29,086.38** වේ. නීතිමය කටයුතු සඳහා යොමුකර ඇත.

(4) රංගන අතුකෝරල මහතා - රු.**19,474.50**

2014-06-03 දිනට සේවය හැරගිය මොහුගෙන් ආයතනයට අයවියයුතු ශේෂය රු.**19,474.50** වේ. මෙම මුදල මොහුගෙන් අයකර ගැනීමට නීතිමය කටයුතු සඳහා යොමුකර ඇත.

(5) ඒ.එම්.ඩී.එන්. තෙන්නකෝන් මහතා

ඒ.එම්.ඩී.එන්. තෙන්නකෝන් මහතාගෙන් රු.**196,767.29** අයවීමට පවතී. මෙම ශේෂය අයකර ගැනීමට කටයුතු කරමින් පවතී.

(ඉ) ආයතනයේ වර්ෂ **5**ට වැඩි ණයහිමි ශේෂය රු.**626,737.00** පහත පරිදිවේ.

(1) ටී. රවිචන්ද්‍රන් මහතා - රු.**150,015.00**

මෙම රවිචන්ද්‍රන් මහතා විදේශ ශිෂ්‍යත්ව ණයගැතියෙකුගේ ඇපකරුවෙකු වේ. එබැවින් ඔහුට ගෙවියයුතු පාරිතෝෂික මුදල් ආයතනය විසින් නොගෙවා ඇත.

එන්.එස්. වික්‍රමාරච්චි මහතා - රු.**39,135.61**

ආයතනයෙන් ගෙවියයුතු මුදල රු. **39,135.61** සම්බන්ධයෙන් මොහු දැනුවත් කලද එම මුදල ලබා ගැනීමට ඉදිරිපත් වී නොමැත. මේ සම්බන්ධයෙන් නැවත ඔහුට දැනුම් දී ඇත.

(2) කාලය ඉකුත්වීම මත අවලංගුකරන චෙක්පත් වල අගය **34,080.00** වේ මෙම වටිනාකම අයකර ගැනීමට නැවත ඉදිරිපත්වී නොමැති අතර එම අගයන් ගිණුම් වලින් ගැලපීමට අවශ්‍ය කටයුතු කරමි.

(3) උපතිස්ත පරණමාන මහතා - රු.**50,000.00**

අපනශාලා භාරකරු විසින් තබනලද ඇප තැන්පතු මුදලවේ. මෙම මුදල ආපනශාලා භාරකරු වෙත නැවත ගෙවිය යුතුවේ..

(4) පාරිතෝෂික ගෙවිය යුතු වටිනාකම රු. **126,912.50**

පාරිතෝෂික ගෙවියයුතු වටිනාකම ලෙස ගණනයකර ඇත්තේ ජීවන වියදම් දීමනාව මත ගෙවියයුතු හිග පාරිතෝෂික මුදල්ය. මෙම ණයහිමියන්ගෙන් දෙදෙනෙකු විදේශ ශිෂ්‍යත්ව ණයගැතියන්ගේ ඇපකරුවන් වේ. එච්.කේ.එස්. ප්‍රේමලාල් මහතා ආයතනයට ණයගැතියකුවේ. එබැවින් මෙම මුදල් නිරවුල් කිරීම සඳහා ඔවුන් ඉදිරිපත් වී නොමැත.

(5) ටෙන්ඩර් තැන්පතු රු.**124,462.50** වේ.

(6) අමාත්‍යාංශයට ගෙවියයුතු රු.**94,358.05**

අප ආයතනයේ සේවයේ නියුතු රියදුරෙකු වන ඒ.එම්.ඩී.එන්. තෙන්නකෝන් මහතා විසින් කෘෂිකර්ම අමාත්‍යාංශයේ වාහන අංක **WP KM-5207** යන වාහනය අනතුරට පත්වීම වෙනුවෙන් මොහුගෙන් අයකර ගතයුතු වටිනාකම වේ. මෙම වටිනාකම ඔහුගේ අවසාන ගිණුමෙන් අයකරගත යුතුවේ. අදාල අයකර ගැනීම් සඳහා සිහිකැඳවීමේ ලිපි නිකුත්කර ඇත. මෙම මුදල අයකර ගැනීමෙන් පසු අමාත්‍යාංශය වෙත එම ගෙවීම සිදුකරමි.

(7) ආහාර සුරක්ෂිතතා පිළිබඳ අවශ්‍යතා ඇගයීමේ අධ්‍යයනය - රු.**7,774.28** මෙම අධ්‍යයනය සඳහා ලද මුදලකි. මෙම වටිනාකම අදාල ගැලපීම් කිරීමට අවශ්‍ය කටයුතු කරමි.

(ඊ) අධ්‍යක්ෂ විසින් **2019-07-10** දිනැතිව අංක **R/Info/5** ලිපිය මගින් මෙය පිලිබඳ තොරතුරු අනාවරණය කරගැනීමට ආයතනයේ නිලධාරීන් තිදෙනෙකුගෙන් යුතු කමිටුවක් පත්කර ඇති අතර එම කමිටු වාර්තාව **2019-09-02** දිනැතිව අධ්‍යක්ෂ වරයාට ලබාදී ඇත. එම කමටු වාර්තාව මගින් අයකර ගතයුතු වටිනාකම ලෙස හඳුනාගත් රු.**8,895,470/-** වටිනාකම අයකර ගැනීමේ ක්‍රමවේදය පිලිබඳව සලකා බැලීමට **2021-02-24** දැනැති අංක **R/Info/5-II** ලිපිය මගින් නව කමිටුවක් පත්කර ඇත. **2021-04-19** දිනැතිව එම කමිටුවේ වාර්තාවද අධ්‍යක්ෂ වෙත යොමුකර ඇත. ඒ අනුව ඉදිරියේදී අදාල මුදල අයකර ගැනීමට කටයුතු කරමි.

(උ) මෙම වාහනය එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය විසින් මෙම ආයතයේ පර්යේෂණ කටයුතු සදහා ලබාදී ඇති අතර එහි අයිතිය අප ආයතනය වෙත පවරාදී නොමැත. එසේ අයිතිය පවරා ගන්නේ නම් පසුගිය වර්ෂවල සිට වාහන බලපත්‍ර ගාස්තු සහ අනෙකුත් රජයට ගෙවිය යුතු ගාස්තු ගෙවිය යුතු අතර වාහනයේ වර්තමාන තත්ත්වය හා වටිනාකම අනුව ආයතනයට එය අවාසිදායක වේ. මෙම වාහනය ආපසු ලබාගන්නා ලෙස එම ආයතනයට දන්වා යවා ඇත. මේ දක්වා එම ආයතනයෙන් ප්‍රතිචාර ලැබී නොමැත.